## 2019/11/08 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2019/11/08 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | බී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 27. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

### 01. ආගම සිහි කිරීම

2019.11.08 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

### 02. මුලාසනයේ පිළිගැනීමේ කතාව

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. අද නොවැම්බර් මස 08 වැනිදා අපේ සභාවාරය පවත්වන මේ මොහොතෙ, සාම්ප්‍රදායිකව අපේ සභාව පවත්වන්නෙ දෙවෙනි සතියෙ අඟහරුවාදා. අඟහරුවාදා කියන්නෙ 12 වෙනිදා, 12 වෙනිද පොහොය යෙදී ඇති නිසා ඊට පස්සට ගන්නත් බැහැ අපට ඊට ඉස්සරහට ගන්න ඕන කම තිබුනා. නමුත් 11 වෙනිද බැංකු නිවාඩු දිනයක්. අපි කල්පනා කළා. මේ දිනවල පවතින දේශපාලන වාතාවරණයත් එක්ක, 08 වෙනිදා එනම් අද දින සභාවාරය කැඳවන්න. ඒ අනුව අද දින අපේ මහා සභාවාරය පවත් වන්නට යොදා ගත්තා. ඒ දැනුම් දීම මත මේ අවස්ථාවට පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුලු ගරු මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනාම මම ඉතා ගෞරවයෙන් පිළිගන්නවා. මම කවදත් බලාපොරොත්තු වෙන පරිදි සභාව ඉදිරියට කරගෙනයාමට ඔබ සියලු දෙනාගේ සහයොගය අපේක්ෂා කරමින්, මගේ පිළිගැනීමේ කතාව අවසන් කරනවා.

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

නැත

**(අ)02. 2019.10.08 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

2019.10.08 දින පැවති මහා සභාවේ සභා වාර්තාව, සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස **ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යශය මගින් ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්ථන) – 2019 යන මැයෙන් යොමුකරන ලද 2019.11.01 දිනැති ලිපිය සභාගත කරන ලදී.
02. නීතිඥ හේමන්ත පී.ඩබ්.විතාරණ, අංක 24ලේන්බාන් වීදිය , කොටුව, ගාල්ල මගින් බද්දේගම දිසා අධිකරණයේ නඩු අංක එම් 343 දරණ නඩුව සම්බන්ධව 2019.10.29 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.
03. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් කැප්පිටියාගොඩ, උඩවැලිවිටිය ගම් දෙක යා කරන ප්‍රධාන පාලම සම්බන්ධව 2019.10.31 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.
   මේ අනතුරුදායක තත්වය දැන ගත්තම මම දුරකතනයෙන් පවා අදාල ආයතන දැනුවත් කළා. අනතුරුදායක නිසා පාලමෙන් බයිසිකල් ගන්න එපා කියලා අපි ක්ෂණිකව බෝඩ් එකක් ගැහුවා. නමුත් ඊට පස්සෙන්දම ඒ බෝඩ් එක කඩලා වීසි කරලා දාලා තිබුනා. මම එතනට ගිහිල්ලත් බැලුවා. පාලම යටින් කැඩිල තියෙන්නෙ. ලොකු අනතුරක් වෙන්න පුලුවන්. මම RDA එකත් එක්ක මේ සම්බන්ධව පෞද්ගලිකවත් කතා කළා.

04. අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය මගින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන මැයෙන් යොමුකරන ලද 2019.10.24 දිනැති ලිපිය සභාගත කරන ලදී.

05. ශ්‍රියානි ඩබ්. රාජපක්ෂ, විදුමුතු පෙර පාසල, උක්ඕවිට විසින් උඩුගම බහුකාර්ය ගොඩනැගිල්ල සහනදායි මිළකට ලබා ගැනීම සම්බන්ධව යොමුකරන ලද 2019.10.21 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා අදහස් දක්වමින්, සභාපතිතුමනි අවසරයි විදුමුතු පෙරපාසල මගේ කොට්ඨාසෙ, ප්‍රාදේශීය සභාවෙ පෙරපාසලට අමතරව තියෙන තවත් පෙරපාසලක්. ඒ පෙරපාසලට යන්නෙත් ගමේ ඉන්න අහිංසක දෙමව්පියන්ගෙ ළමයි. පහුගිය අවුරුද්දෙත් ළමයින්ගෙ දක්ෂතා එළිදක්වන්න අපේ ප්‍රාදේශීය සභාවෙ අනුමැතිය ගන්න එතුමිය ලිපියක් එවල තිබුනා. ඉතිං ගිය අවුරුද්දෙත් රුපියල් 5000 කුත් ලයිට් බිලට රු. 1000 කුත් වශයෙන් ගෙවලා එම පෙරපාසලේ උත්සවය තියන්න මුලු සභාවෙම ඒකමතිකව සහයෝගය ලැබුනා. මම මේ අවස්ථාවෙදිත් ඉල්ලා සිටිනව ගමේ ඉන්න අහිංසක දෙමව්පියන්ගෙ ළමයි. අපේ ප්‍රාදේශීය සභවෙ පෙරපාසලට ඇතුලත් කරගැනීමට නොහැකියාව නිසා තමයි ඒ වගේ පෞද්ගලික පෙරපාසලකට යන්නෙ. ඒක නිසා මේ දෙමව්පියන් ගැන සලකලා, ඒ ළමයින්ටත් අපේ ශ්‍රවනාගාරයේ ඒ පහසුකම ලබාදෙන්න කියල මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. සියලු දෙනාගෙ සහයෝගය බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, පෞද්ගලික පෙරපාසලක ළමයෙක්ගෙ අම්ම කෙනෙක් ළමා දින උත්සවය පවත්වපු එකට දොස් කියලා මට හොඳ ලිපියක් එවල තියෙනවා. කවුරුවත් මෙච්චර කාලෙකට නොකරපු දෙයක් කරපුවාම, මම ඉතිං ගණන් ගත්තෙ නැහැ. මම බලප්‍රදේශයේම ළමයි එකතු කරගෙන උත්සවය කරන්න සූදානම් වුනේ. නමුත් සභාවෙන්ම තමයි කිව්වෙ එහෙම කරන්න බැහැ කියලා. අන්තිම මොහොතෙ සභවෙ අරමුදල් වියදම් නොකර බොහොම හොඳට කළා. සභාවෙන් පොඩි ගණනක් වියදම් වුනා. මට උනන්දු වුනානම් ඒකත් හොයා ගන්න තිබුනා. මේ මවගේ අදහස අපි පෞද්ගලික පෙරපාසල් වලට මොනවත්ම කරල නැහැ වගේ.

ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා අදහස් දක්වමින්,මගේ අදහස නම් අපේ බලප්‍රදේශයේ පෙරපාසල් උත්සව සඳහා ඉල්ලනවා නම්, නොමිලෙ වුනත් කමක් නැහැ. ඒක දෙනවනම් හොඳයි. මොකද ස්ටේජ් ගහන්න එහෙම මොනතරම් මහන්සි වෙනවද? හරි කරදරයි. ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතාද එම අදහස අනුමත කරන ලදී.

ගරු සභාපතිතුමා, නැහැ නැහැ ඒක ප්‍රශ්නයක් නැහැ. ඇත්තටම මේ සභාවෙන්ම තමයි දැන් සල්ලිත් නැති නිසා නිකන් දෙන්න බැහැ කියලා යෝජනා කළේ. ඇත්තටම අපට ප්‍රශ්නයක් නැහැ. ලයිට් වියදමයි, වතුර වියදමයි අරගෙන දෙන්න පුලුවන්. දැන් මෙතන මෙතුමිය ඉල්ලලා තියෙනවා. රුපියල් 5000 කට දෙන්න කියලා. ඒක දීලා ඉදිරියෙදි පෙරපාසල් ඉල්ලුවොත් නොමිලේ ලබාදෙන්න යෝජනාවක් සම්මත කර ගන්න.

ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා, අපි කිව්වෙ අපේ අදහස. ඕක 5000 දීල ඉදිරියෙදි නොමිලෙ දෙන්න ගියොත් ප්‍රශ්නයක්වෙනවා. ගරු උප සභාපතිතුමා, ගරු සභාපතිතුමනි මේකෙ පැවැත්මක් තියෙන්න ඕන. නඩත්තුවක් තියෙන්න ඕන.යනුවෙන් අදහස් දැක්වූ අතර එම අදහස් අනුමත කරමින්, ගරු මන්ත්‍රිනී නෙළී වක්වැල් මහත්මිය කරුණු දැක්වීය.

06. පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත මගින් පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම (ප්‍රාග්ධන) වැඩසටහන - 2019 යන මැයෙන් 2019.09.22 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.
මේ සම්බන්ධව ගරු සභාපතිතුමා පැහැදිලි කරමින්, මේව අපේ සභාවලට කරන්න බැහැ. අපි ලිපියක් යැව්වා. ඇස්තමේන්තු කරලා, අනුමත කරලා සේරම කරලා කරන්න තියෙන්නෙ. 2019.11.30 ට පෙර අවසන් කරන්න ඕන. මේ දේශපාලන කටයුතු නිසා මේවට සමහර විට කාලය ගන්න හැකියාව ලැබේවී යනුවෙන් ප්‍රකාශ කරන ලදී.

07. KDAW Construction විසින් අමුද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම සඳහා භූමිය ලබා ගැනීම යන මැයෙන් යොමු කරන ලද 2019.10.30 දිනැති ලිපිය සභා ගත කරන ලදී.

මේක පෞද්ගලිකව මාත් එක්ක කතා කළා. මම කිව්වා සභාවට ඉදිරිපත් කරන්න කියලා. ඒ පාර අපට හොදට හදල දෙනවා කියලා කිව්වා යනුවෙන් ගරු සභාපතිතුමා ප්‍රකාශ කළේය.
මෙහිදී ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා කියා සිටියේ, අදාල කොන්ත්‍රාත්කරු වෙනත් ස්ථානවල අමුද්‍රා ගබඩා කිරීම සදහා ලක්‍ෂ ගණන් වියදම් කර ඉඩම් ලබාගෙන ඇති බවත්, එබැවින්, මෙම ස්ථානයත් නොමිලේ ලබා නොදී අවුරුදු 04 ට හෝ 05 ට ගිවිසුමක් අත්සන් කර මුදලක් අය කර ලබා දෙන ලෙසයි. මහා සභාවෙන් මෙම තීරණය ගත් බව ඔහු වෙත දන්වන ලෙසද පැවසීය.
ඒ සම්බන්දව තමා නොදැනුවත් බවත්, අදාල කොන්ත්‍රාත්කරු පවසන්නේ වෙනත් දෙයක් බවත්, මේ සම්බන්දව පසුව සාකච්ඡා කර කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කළේය.

08. දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් පළාත් පාලන ආයතන භුක්ති විදින රජයේ ඉඩම් කොටස් විධිමත්ව පවරා දීම යන මැයෙන් යොමු කරන ලද 2019.11.05 දිනැති ලිපිය සභා ගත කරන ලදී.

09. යටලමත්ත, කනත්තගොඩ ගම්වාසීන් විසින් ඇළ තුල ඇති ජලය බැස යාමට ඇති බාධක ඉවත් කර ගැනීම සම්බන්ධව දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය වෙත යොමුකරන ලද 2019.10.23 දිනැති ලිපියෙහි පිටපත සභාගත කරන ලදී.
මේ කාරණය සම්බන්දයෙනුත් අපි අදාල ආයතන වෙත දැනුම් දී ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

10. පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, ගාල්ල මගින් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම යන මැයෙන් 2019.10.31 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

11. විහාරාධිපති පූජ්‍ය වැලිවිටියේ ඥානවිමල ස්වාමීන් වහන්සේ විසින් යටලමත්ත 70 කන්ද ගම්මානයේ පාර පුළුල් කර කාපට් ඇතිරීමේදී පවතින විරෝධතා ඉවත් කර ගැනීම සම්බන්ධව යොමු කරන ලද ගම්වාසීන්ගේ අත්සන් සහිත ලිපිය සභාගත කරන ලදී.

12. ඔක්තෝම්බර් මස 17 වන දින නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් පෙර පාසල් දරුවන් උදෙසා පැවැත්වූ ළමා දින සැමරුම් උළෙල පිළිබඳව රාජ්‍ය සේවයේ නියුතු මවක් විසින් 2019.10.18 දිනැතිව යොමු කරන ලද සංදේශය සභාගත කරන ලදී.
කරපු හොද පස්සෙන් එලවන එකක් මේක මම මේක කියවන්නෙත් නැහැ. නමුත් මට කණගාටුවක් ඇති වුනා. ඒකයි මම මේක සභාවට දාන්න කියල කිව්වෙ. වැඩි හොද කරන්න ගියාම මෙහෙම වෙනවා. මම ඇත්තටම සභාවෙ යෝජනා කළේ සභාවෙ පෙරපාසල් 15 ට

විතරක් නෙවෙයි සියලුම ළමයින්ට නමුත් සභාවෙන් වියදම් කරලා කරන්න බැහැ. අන්තිමට සභාවෙන් වියදම් නොකර තමයි මේ දේ කළේ. කවුරුත් බොහොම සතුටු වුනා. මේ පෞද්ගලික අමනාපයකට කරපු එකක් ඒකට අපට කරන්න දෙයක් නැහැ. යනුවෙන් ගරු සභාපතිතුමා ප්‍රකාශ කළේය.

13. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් ස්ථානීය තක්සේරු වටිනාකම අය කිරීම සම්බන්ධව 2019.11.05 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**නැත.**

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

01. වාර්ෂිකව සිදු කළ යුතු භාණ්ඩ සමීක්ෂණයට අදාළව සමීක්ෂණ මණ්ඩලය සඳහා 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 203 වගන්තිය ප්‍රකාරව සභා නියෝජිතයකුද ඇතුළත් විය යුතුව ඇත. එබැවින් එම සමීක්ෂණ මණ්ඩලය සඳහා පහත නම් සඳහන් සභිකයින් එම සමීක්ෂණ මණ්ඩලය සඳහා පත් කර ගැනීමට යෝජනා කරමි.
ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා
ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය
ගරු මන්ත්‍රී කුමාරගේ වසන්ත මහතා

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. තල්ගස්වල බදාදා සති පොළ 2020 වර්ෂයට ටෙන්ඩර් කිරීම සහ අවම ලංසුව තීරණය කිරීමේදී 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වාම ටෙන්ඩර් මුදල වැඩිවී ඇත්තෙ රුපියල් 25000 ක මුදලකින් පමණි.එබැවින් 2019 වර්ෂයේ පොළ ටෙන්ඩරය ලබාගත් මුදල වන රුපියල් 2265000 ක මුදලට රුපියල් 235000 ක මුදලක් එකතු කර 2020 වර්ෂයේ තල්ගස්වල බදාදා සති පොළෙහි අවම ලංසුව ලෙස රුපියල් 2500000 ක් ලෙස තක්සේරු කර ටෙන්ඩර් කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.**

සභාපතිතුමා, අපේ පොලේ පහසුකම් දිහා බලන කොට ඔය මුදල අසාධාරණයි. ඔබතුමා බදාද දවසක ගිහින් බලන්න පොලේ තත්වෙ කොහොමද කියලා. බදු මුදල වැඩි කරනවා වගේම පහසුකනුත් අපි ලබල දෙන්න ඕන. ලයිට් වයර් ගැලවිලා මිනිස්සුන්ගෙ බෙල්ලෙ වදිනවා. කානුවල කුනු ජරාව තියෙනවා යනුවෙන් ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා ප්‍රකාශ කළේය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, ගරු මන්ත්‍රීතුමා කිසිම පහසුකමක් අඩුවෙලා නැහැ. එදා සිට තියෙන පහසුකම් සේරම තියෙනවා. දැන් ගිහිල්ල බලන්න.මම පිළිගන්නවා වයරින් එකනම් අබලන් තත්වෙ. ඒව හදන්නනම් ලක්ෂ ගණනක් වැය වෙනවා. අපිට ඒව කරන්න බැහැ. වටේට තියෙන වැට කැඩිල ඒක හදන්න ඕන. අනිත් සියලු පහසුකම් තියෙනවා.

මෙහිදී ගරු මන්ත්‍රී චන්ද්‍රසහබන්දු මහතා යෝජනා කළේ, දෙලක්ෂ ගණනකින් නැතුව සාධාරණ ගණනකින් වැඩිකරන්න කියලා. ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා කියා සිටියේ, අපි ගිය සැරේ කතා කළේ මුදලින් සියයට ගණනක් වැඩි කරන්න. ඒක නිසා සභාපතිතුමා, තීරණය කරන්න අවුරුද්දකට 5% හෝ 2.5% වැඩි කරනවයි කියලා. එතකොට කාටවත් කියන්න දෙයක් නැහැ. මෙහිදී ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් කියා සිටියේ, ගමේ රටේ අපි මීට වඩා ප්‍රායෝගික වියයුතු බවත්, ටෙන්ඩර් කරුවන් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් නොවන අතර, මෙමගින් මහා ලොකු ලාභයක් නැති බවත්, එසේ ලාභයක් තියෙනවා නම්, තරගයක් පවතින බවත්, එබැවින් සෑම වසරකම ටෙන්ඩරය ලබා ගන්නා මුදලට 3% ක් එකතු කර ටෙන්ඩර් මුදල තීරණය කිරීම සුදුසු බව ප්‍රකාශ කළ අතර, එම අදහස අනුමත කරමින් ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා හා ගරු මන්ත්‍රී චන්ද්‍රසහබන්දු මහතා අදහස් දැක්වීය.

ඒ අනුව ඉහත පෙන්වාදුන් සංශෝධනයන් සිදු කරමින් ගරු සභාපතිතුමා විසින් නැවත සංශෝධිත යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

තල්ගස්වල බදාදා සති පොළ 2020 වර්ෂයට ටෙන්ඩර් කිරීම සහ අවම ලංසුව තීරණය කිරීමේදී 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වාම ටෙන්ඩර් මුදල වැඩිවී ඇත්තෙ රුපියල් 25,000ක මුදලකින් පමණි. එබැවින් 2019 වර්ෂයේ පොළ ටෙන්ඩරය ලබාගත් මුදල වන රුපියල් 2,265,000 ක මුදලට රුපියල් 3% ක් එනම් 67,950 ක මුදලක් එකතු කර 2020 වර්ෂයේ තල්ගස්වල බදාදා සති පොළෙහි අවම ලංසුව ලෙස රුපියල් 2,332,950 ක් ලෙස තක්සේරු කර ටෙන්ඩර් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. PF 7360 කැබ් රථයේ රක්ෂණ සහතිකය සහ ආදායම් බලපත්‍රය කල් ඉකුත්වීමට සීමිත දින ප්‍රමාණයක් ඇති බැවින් කැබ් රථය දුම් පරික්ෂාවට ලක් කර රක්ෂණ සහතිකය සහ ආදායම් බලපත්‍රය අලුත් කර ගැනීම සඳහා යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04. 2020 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ දැන්වීම දිවයින පුවත්පතෙහි පළ කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

- පෙ.ව.11.35 ට ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා අවසර ලබා ගෙන සභාවෙන් පිටව ගියේය.

05. 2020 වර්ෂයට අදාළව නාගොඩ ප්‍රාදේශීය සභා අයවැය කෙටුම්පත සහ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

06. මේ වන විට මසක් සඳහා අනුමත වී ඇති සුළු අක්මුදල් ප්‍රමාණය රු. 3000.00 කි. එම මුදල් ප්‍රමාණය බිල්පත් ගෙවීමට ප්‍රමාණවත් නොවන බැවින් එම මුදල මසකට අදාළව රු. 5000.00 ක් කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රීනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

07. උක්ඕවිට විදුමුතු පෙර පාසලේ වර්ෂ අවසාන විවිධ ප්‍රසංගය සඳහා උඩුගම බහුකාර්ය ගොඩනැගිල්ල සහනදායි මිළකට ලබා දීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ආවරණ අනුමැතිය යටතේ සිදුකල ගෙවීම් වාර්තාව**

**08. පහත සඳහන් අංක 01 සිට අංක 06 දක්වා ආවරණ අනුමැතිය යටතේ සිදුකල ගෙවීම් ගරු සභාව විසින් පිලිගැනීම සුදුසු බවට යෝජනා කරමි.**

**2019.11.08 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කල යුතු ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් පිළිබඳ වාර්තාව.**

| | |
|---|---|
| 01. පෝස්ට් මාස්ටර් ජනරාල් ගි. අ. 013100199027346 | |
| 2019 ඔක්තෝම්බර් මස තැපැල් ගාස්තු ගෙවීම | -රු. 7000.00 |
| 02. මජන බැංකුවේ ලංකා විදුලිබල මණ්ඩල ගිණුම | |
| 2019 සැප්තැම්බර් මස විදුලි බිල්පත් පියවීම | |
| ගි. අ. 8616373802 - උඩුගම පොල | -රු. 240.00 |
| 8616374000- උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | -රු. 240.00 |
| 4509082800 - උදාර පෙරපාසල | -රු. 349.80 |
| 03. ජාතික ජල සම්පාදන හා ජලාප වහන මණ්ඩලය | |
| උඩුගම උප කාර්යාලයේ ජල බිල්පත පියවීම (2019.09.21-2019.10.22) | -රු. 2721.28 |
| 04. ශ්‍රී ලංකා ටෙලිකොම් පි.එල්. සී | |
| සභාපති තුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවිම(2019 සැප්තැම්බර්) | -රු. 4535.69 |
| 05.සිමාසහිත ලංකා බෙල් සමාගම උප සභාපති තුමාගේ නිවසේ | |
| දුරකථන බිල්පත පියවිම(2019 .09.16 – 2019.10.15) | -රු. 688.51 |
| 06.සභාපති නාගොඩ ප්‍රාදේශිය සභාව | |
| සුළු අත් මුදල් ප්‍රතිපුර්ණය කිරිම | -රු. 3000.00 |

ආවරණ අනුමැතිය යටතේ සිදු කල ගෙවීම් ගරු සභාව විසින් පිලිගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රීනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**09.** අංක **01** සිට **30** දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීමට යෝජනා කරමි.

**2019.11.08 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.**

**01.2019 ඔක්තෝම්බර් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 4507357802 | - සමනළ පෙර පාසල | - රු. 459.60 |
| 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - රු. 294.90 |
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු. 6980.75 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1978.50 |
| 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු. 349.80 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු. 1466.10 |
| 8617046104 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය | - රු. 1008.60 |
| 4509082908 | - උක්ඔිවිට පෙර පාසල | - රු. 240.00 |
| 8619142704 | - රන් කැකුළු පෙර පාසල | - රු. 368.10 |
| 8616373802 | - උඩුගම පොළ | - රු. 240.00 |
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 240.00 |
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය (හිඟ විදුලි බිල්පත් ගෙවීම) | - රු. 3446.32 |

**02. ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සි**

**දුරකථන බිල්පත් ගෙවීම** (2019.09.01 - 2019.09.30)

| | | |
|---|---|---|
| i. | 091 2296433 - ප්‍රධාන කාර්යාලයේ දුරකථන බිල්පත පියවීම | - රු.7633.96 |
| ii. | 0912296537 - සභාපති නිල කාමරයේ දුරකථන බිල්පත පියවීම | - රු. 5018.89 |
| iii. | 0912296577 - මාපලගම උප කාර්යාලයේ දුරකථන බිල්පත පියවීම | - රු. 475.09 |

**03. මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාවේ බිල්පත පියවීම (2019.10.25) - රු. 68.86

**04. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. LL 7650 කෘ කැබ් රථයට දොර ලොක් එකක් ලබා ගැනීමේ බිල්පත වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය -රු. 1870.90

ii. ආහාර පනතේ රාජකාරි වෙනුවෙන් ආහාර සාම්පල් ලබාගැනීමේ බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම යටලමත්ත ම.සෞ.ප.කොට්ඨාසය (ම.සෞ.ප එච්.ඩබ් පී අමරනාත් මයා) -රු. 1000.00

| | | |
|---|---|---|
| iii. | ආහාර පනතේ රාජකාරි වෙනුවෙන් ආහාර සාම්පල් ලබාගැනීමේ බිල්පත් මුදල් ප්‍රතිපූර්ණයකිරීම ගෝණදෙනිය ම.සෞ.ප.කොට්ඨාසය (ම.සෞ.ප එච්.ඩබ් පී අමරනාත් මයා) | -රු .1000.00 |
| iv. | රාජකාරි කටයුතු වෙනුවෙන් PF 7360 අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම | - රු. 3450.00 |
| v. | රියදුරු අනුර දිසානායක මහතාගේ බරවාහන රියදුරු බලපත්‍රය අලුත් කිරීමේ බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය | - රු. 2900.00 |

**05. අතිකාල දීමනා ගෙවීම**

**2019 ඔක්තෝම්බර් මස**

| | | |
|---|---|---|
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 8031.00 |
| බී.ජී.පියතිලක මයා | - රියදුරු | - රු. 8031.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 7075.50 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 4896.00 |
| යසරත්න විජේසේකර | - මුරකරු | - රු. 9053.90 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8360.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර | - අනියම් රියදුරු | - රු. 8360.00 |

**06 .2019 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 6200.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**07. 2019 නොවැම්බර් මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 480.00 |
| කුසල් එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 818.00 |

**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු. 980.00 |

**2019 ඔක්තෝම්බර් මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | -ගරු සභාපති | -රු. 5000.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | -රු. 5600.00 |
| යුරේකා මල්කාන්ති | - සංවර්ධන නිලධාරී | -රු. 504.00 |
| මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1554.00 |

**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| එම්.ඒ.ඩිලානි චන්ද්‍රප්‍රභා මෙය | -කළමනාකරණ සහකාර | - රු. 520.00 |

**08. එච්.ඩබ්.ප්‍රියන්ත මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2019/09/20) - රු. 504.00

**09. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව**

විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**10. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2019 ඔක්තෝම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 600ක් | - රු. 62400.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 295 ක් | - රු. 30680.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 178 ක් | - රු. 24648.00 |
| DS 40 Oil ලීටර් 02 | - රු. 1080.00 |
| පවර් ඔයිල් ලීටර් 01 | - රු. 1015.00 |
| LL 7650 ක෴ කැබ් රථය ඩීසල් ලීටර් 165 ක් | - රු. 17160.00 |
| ජලභීතිකා මර්ධන වැඩසටහන සඳහා පෙට්‍රල් ලීටර් 17 | - රු. 2329.00 |
| ගබඩා කර තැබීම සඳහා පෙට්‍රල් ලීටර් 93 | - රු. 10497.00 |
| 2 T Oil ලීටර් 01 | - <u>රු. 620.00</u> |

-

**එකතුව** **- <u>රු.150429.00</u>**

**11.හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, කොටුව, ගාල්ල**

i. නඩු අංක පී 15977ට අදාළව 2019.11.20 වන දිනට කැඳවීමට නියමිත නඩු වාරය සඳහා නීතිඥ පෙනී සිටීමේ ගාස්තු -රු. 3000.00

**12.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2019 නොවැම්බර් මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු.28500.00

ii. 2019 ඔක්තෝම්බර් මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 1680.00

**13. ජ්.ඩී. කරුණාරත්න මයා ,සරත් ස්ටෝර්ස්, යටලමත්ත**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2019 ඔක්තෝම්බර් - රු. 7270.00

**14. එච්.එල්.කේ. ශ්‍රීනිත් රුක්ෂාන්, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2019 ඔක්තෝම්බර් - රු. 5760.00

**15. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**

i. 252-6478 කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු. 16505.00

ii. LL 7650 ක෴ කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු. 13440.00

iii. PF 7360 කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු. 22460.00

**16. ඊ.ඒ. සමන් කුමාර මයා, උඩුගම**

i. RD 9457 ට්‍රැක්ටරය එන්ජිම ගලවා නැවත සවි කිරීමේ බිල්පත - රු. 7000.00

ii. 252-6478 කැබ් රථයේ මයිලෝ මීටර් කේබලයක් සවිකිරීමේ බිල්පත - රු. 2240.00

iii. 252- 6478 කැබ් රථය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 1200.00

**17. දේශීය ආදායම් කොමසාරිස්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ**
වැටුපෙන් අය කර ගත් මුද්දර බදු මුදල් පියවීම සහ බලපත්‍ර ගාස්තු අය කිරීමේදී ඒ සඳහා 10% මුද්දර බදු අයකිරීමේ ගාස්තුව ගෙවීම - රු. 8656.71

**18. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා නොවැම්බර් මස මාසික කුලීය ගෙවීම - රු. 4000.00

**19. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2019 ඔක්තෝම්බර්) - රු.13000.00

**20. කේ.ටී.ආර්.ජී. උමාල් කිරිඇල්ල මයා, ග්‍රෑන්ඩ් මෝටර්ස්, වඳුරඹ**
Pf 7360 කැබ් රථයට අලුතින් ටී බෙල්ට් එක දැමීම සහ ට්වුන් අප් කිරීමේ අලුත්වැඩියා කිරීමේ බිල්පත - රු.116501.00

**21. ජී.පී. සඳුන් චතුරංග මයා, ර්බේස් කම්පියුටර්, මාපලගම**
Ups එකක් සහ Eset පරිගණක ප්‍රතිවෛරස් මෘදුකාංගය ලබා ගැනීමේ බිල්පත - රු. 8300.00
අන්තර්ජාල සම්බන්ධතාවය සඳහා නෙට් වර්ක් ස්විචයක් ලබා ගැනීමේ බිල්පත - රු. 2600.00

**22. යූ.ජී. නන්දා මාලිනි ජයවර්ධන, බද්දේගම**
ආදාහනාගාරය ඉදිකිරීමට යෝජිත ඉඩමේ මැණුම් කටයුතු කිරීම වෙනුවෙන් බිල්පත - රු. 32000.00

**23. අතුකෝරල ඉලෙක්ට්‍රිකල්ස් පුද්ගලික සමාගම, පිටිගල**
වීථි පහන් අළුත්වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීමේ ගාස්තු - රු. 35500.00

**24. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ**
වීථි පහන් අළුත්වැඩියාව සඳහා තම්බ්ලර් ස්විච් ලබාගැනීමේ වියදම් - රු. 7000.00

**25. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, ගා/ නාගොඩ**
i. 2019 ඔක්තෝම්බර් මස 08 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (තේ සඳහා) - රු. 2488.00

**26. ආර්. ඒ. රංජිත් මානෙල් මයා, සීගිරි හොටෙල්, නාගොඩ**
i. 2019 ඔක්තෝම්බර් මස 08 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (කෑම සඳහා) - රු. 5880.00

**27. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, කොළඹ 10**
නිදහස් දුම්රිය ගාස්තු ගෙවීම
එම්.එම්. මහින්දදාස මයා ගාල්ල - අනුරාධපුරය - රු. 6730.00

**28.ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, නාගොඩ**
සෞඛ්‍ය හා මාර්ග කම්කරුවන් සඳහා සබන් කැට72ක් මිලදී ගැනීමේ බිල්පත - රු. 4320.00

**29.ඒ .ජේ.ජී.සටේෂනර්ස්, ගාල්ල**
ප්‍රධාන කාර්යාලය සඳහා ලිපිද්‍රව්‍ය ලබාගැනීමේ බිල්පත - රු.41530.00

**30. විමාෂා ප්‍රින්ටර්ස්, පිටිගල**
සාහිත්‍ය තරඟාවලියේ සහතිකපත් මුද්‍රණය කිරීමේ බිල්පත - රු. 8400.00

**ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

(ඉ) 2. **ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

I. මිනුවන්විල - ගල්කැටියගොඩ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම - රු. 1,600,000.00

II. ගෝණදෙනිය යහලදූවවත්ත පාර ප්‍රතිසංස්කරණය කිරීම - රු. 610,000.00

III. වෙදගෙදර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම - රු. 609,925.67

**ඉහත සඳහන් මාර්ග සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රීනී චන්දිමා දිල්රුක්ෂි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**පෙර පාසල් ළමුන් සදහා අවශ්‍ය සහතිකපත් මුද්‍රණය සදහා මිල ගණන් කැඳවීම -2019**

| විස්තරය | අතුකෝරල ප්‍රින්ටර්ස්, පිටිගල | කෙත්සිරි කමියුනිකේෂන්, තල්ගස්වල | විමාෂ ප්‍රින්ටර්ස්, පිටිගල |
|---|---|---|---|
| සහතිකපත් මුද්‍රණය සදහා | රු. 28.80 | රු.34.00 | රු. 25.00 |

පෙර පාසල් ළමුන් සදහා අවශ්‍ය සහතිකපත් මුද්‍රණය සදහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල විමාෂ ප්‍රින්ටර්ස්, පිටිගල වෙතින් සහතිකපත් මුද්‍රණය කර ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල විමාෂ ප්‍රින්ටර්ස්,පිටිගල වෙතින් සහතිකපත් මුද්‍රණය කර ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.

**නෙට් වර්ක් ස්විච් එකක් ලබා ගැනීම සදහා මිල ගණන් කැඳවීම -2019**

| විස්තරය | ඊ-බෙස් කම්පියුටර් ටෙක්නොලජී, මාපලගම | රුචිර කම්පියුටර්, නාගොඩ | ප්‍රීවිව් කම්පියුටර් ටෙක්නොලජී, වදුරඹ |
|---|---|---|---|
| නෙට් වර්ක් ස්විච් එකක් | රු. 2600.00<br>02 year Warranty | රු. 2800.00<br>01 year Warranty | රු. 2900.00<br>01 year Warranty |

**නෙට් වර්ක් ස්විච් එකක් ලබා ගැනීම සඳහා** ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ඊ-බෙස් කම්පියුටර් ටෙක්නොලජී, මාපලගම වෙතින් **නෙට් වර්ක් ස්විච් එකක් මිළදී ගැනීමට** ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ඊ-බෙස් කම්පියුටර් ටෙක්නොලජී, මාපලගම වෙතින් **නෙට් වර්ක් ස්විච් එකක් මිළදී** ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.

**ෆැක්ස් යන්ත්‍රයක් සඳහා මිළ ගණන් කැඳවීම - 2019**

| විස්තරය | සෙල් එක්ස් කම්පියුටර්, ගාල්ල | සවුත්නෙට් ටෙක්නොලජී, ගාල්ල | ලොජික් කම්පියුටර්, ගාල්ල |
|---|---|---|---|
| ෆැක්ස් යන්ත්‍රය | රු. 19900.00<br>01 year Warranty | රු. 21965.00<br>01 year Warranty | රු. 23500.00<br>01 year Warranty |

ෆැක්ස් යන්ත්‍රයක් මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල සෙල් එක්ස් කම්පියුටර්, ගාල්ල වෙතින් ෆැක්ස් යන්ත්‍රයක් මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල සෙල් එක්ස් කම්පියුටර්, ගාල්ල වෙතින් ෆැක්ස් යන්ත්‍රයක් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා**

ප්‍රසම්පාදන කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම.

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2019 ඔක්තෝම්බර් මාසයට අදාල මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය සළකා බැලීම සඳහා ඔක්තෝම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2019 ඔක්තෝම්බර් මාසයට අදාල මාසික ඒකාබද්ධ වැය සාරාංශය සළකා බැලීම සඳහා ඔක්තෝම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2019 ඔක්තෝම්බර් මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් සළකා බැලීම සඳහා ඔක්තෝම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ඌ) වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන් සහ ලේකම්තුමිය ප්‍රධාන සභාවේ කාර්ය මණ්ඩලයෙන් අවසරයි. අද දවසේ ඉතාමත් තීරණාත්මක මැතිවරණයකට පෙර තමයි සභාවාරය පැවැත්වෙන්නේ. මම මේ වෙලාවේ ඉතාමත්ම ගෞරවයෙන් සිහිපත් කරන්න ඕන. 2015-01-08 වැනිදායින් පස්සේ මේ රටේ දැවැන්ත පරිවර්තනයකට ලක් වූ සමාජයක් තියෙන්නේ. 2015 ජනවාරි 8 වෙනිදාට ඉස්සරවෙලා මුළුමහත් ශ්‍රී ලංකාවේ තිබුණු විවිධ ගැටලු, බාධා ඉවත් වෙලා, ඉතාමත් සාමකාමී පරිසරයකට යොමු වෙලා ගත කරන කාල වකවානුව තුළ, නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අති විශාල ජනතා බලාපොරොත්තු ඉෂ්ට වෙච්ච කාලවකවානුවක් තමයි මේ පසුවන්නේ. ප්‍රාදේශීය සභාව තුළින් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුලින් අති විශාල සංවර්ධන කටයුතු රාශියක් අප ප්‍රදේශයට සිදුවුණා. ඉන් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට යම් අස්වැසිල්ලක් වුණා. පරණතානායම්ගොඩ කොට්ඨාසයේ කෝටි හතරකට ආසන්න විශාල සංවර්ධන කටයුතු පහුගිය කාලයේ ආරම්භ කළා. තව ඉදිරියට ආරම්භ කරන්නත් තියෙනවා. ජනතාවගේ බලාපොරොත්තු විශාල ප්‍රමාණයක් ඉෂ්ට සිද්ධ කරලා දෙන්න හැකියාව ලැබුණා. විශේෂයෙන්ම අවුරුදු 20,25ක කාලයක් තිස්සේ සමෘද්ධිය නැතුව බලන් හිටපු ජනතාවට, විශේෂයෙන්ම පසුගිය රජයෙන් විවිධ දේශපාලන බලපෑම් මත සමෘද්ධි සහනාධාරය නොලැබුනු ජනතාවගෙන් යම් ප්‍රමාණයකට සමෘද්ධිය ලබා දෙන්න හැකියාව ලැබුණා. ඉල්ලුම් කරපු අයගෙන් 60% කට පමණයි දුන්නෙ. තව 40%ක් දෙන්න නිර්දේශ වෙලා කටයුතු සකස් වෙලා තියෙද්දී, හදිසියේ මැතිවරණය නිසා අපට එම 40% ප්‍රමාණය දෙන්න හැකියාවක් ලැබුණේ නැහැ. ඒ වගේම ප්‍රදේශයේ වැඩිහිටියන් සඳහාලබා දුන් රුපියල් 2000, 1900 ක මුදලක් වැඩිහිටි දීමනාව වශයෙන් පහුගිය රජයෙන් ලබා දුන්නා. අපේ අනාගත ජනාධිපති සජිත් ප්‍රේමදාස මැතිතුමන් විසින් එම දීමනාව රුපියල් 3000.00 දක්වා සංශෝධනය කරලා තියෙනවා. ඒ වගේම ආබාධිත පුද්ගලයන් සඳහා රුපියල් 5000ක දීමනාවක් වත්මන් රජයේ අයවැය මගින් යෝජනා කරලා තියෙනවා. ගැබිනි මාතාවන් සඳහා පෝෂණ මල්ල රුපියල් 20000.00ක දීමනාව ලැබෙනවා. මේ සියලු කටයුතු කිසිම දේශපාලන පක්ෂ බේදයක් නැතුව සියලුදෙනාට ලබාගන්න වරප්‍රසාද, පහසුකම් ලැබුණා. තව බොහෝ කරුණු කියන්න තියෙනවා. වත්මන් රජයේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ හා අපේ ගරු අමාත්‍ය මණ්ඩලයේ දැවැන්ත සැලසුම්සහගත ආර්ථික දැක්ම තුළ සිද්ධ කරන්න ලැබුණු සුළු කොටසක් විතරයි මම කිව්වේ. 2015-01-08 ට කලින් අපේ ප්‍රදේශයේ මාර්ග, ප්‍රධාන මාර්ග තිබුණෙ කොහොමද කියලා දන්නවා. නමුත් අද වන විට එදා හම්බන්තොට තිබුණු කාපට් පාරවල් අද අපේ ප්‍රදේශවලට ලබාගන්න හැකියාව ලැබුණා. මම මේ ගැන සිහිපත් කරන්නේ මොකද, කවුරුත් හිතයි මේවා නිකන් වචනයට සීමා වෙලා කියලා. ගාල්ල - මාපලගම පාර, වඳුරඹ ට වෙනකම් කාපට් කළා. බද්දේගම පාර, ඒ වගේම මාපලගම- ඇල්පිටිය පාර ඒ වගේම අතුරු මංමාවත් වැඩසටහන් යටතේ කුඹුරුහේන මාර්ගය, තල්ගස්වල වතු මාර්ගය, නෑහිනිගල මාර්ගය, වගේ දැවැන්ත කාපට් පාරවල් ඉදිකරලා තියෙනවා. දැවැන්ත වැඩ කොටසක් අපේ ප්‍රදේශයේ සිදු වෙලා තියෙනවා. ඒ වගේම පාසල් පද්ධතිය ගැන සිහිපත් කරන්න ඕන. 2015 ජනවාරි 8 වෙනිදාට කලින් නාගොඩ රාජකීය විද්‍යාලය තිබුණෙ කොහොමද? අද කොහොමද? කියල බලන්න. මාපලගම සිරිසුනන්ද විද්‍යාලය, මාපලගම සිරිසුනන්ද මහා විද්‍යාලය, මාපලගම මධ්‍ය මහා විද්‍යාලය වගේ පාසල් පද්ධති, වගේම නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තට්ටු හතරක ගොඩනැගිල්ලක් හදලා, දැන් වැඩ අවසන් වෙමින් යනවා. ඒ වගේ දැවැන්ත මුදල් කන්දරාවක් යොදවලා අපේ කොට්ඨාශයේ දැවැන්ත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වෙලා තියෙනවා. හැබැයි අද අපේ ප්‍රදේශවල ජනතාවට කෙටි කාලයක් තුළ මෙපමණ වැඩ කොටසක් කළ බව අමතක වෙලා තියනවා. වෙන වෙන දේශපාලන මත දරන අය ඒවා අමතක කරලා නැවත වාරයක් 2015 ජනවාරි 8 වෙනිදාට පෙර තිබුණු අවනීතිය රජ කරන යුගයකට යන්න ජනතාවගේ මනස වෙනස් කරන්න මහන්සි ගන්නවා. මම හිතනවා

කවදාවත් ඒක වෙන්නේ නැහැ. මොකද මේ රට බුදුදහම එක්ක බද්ධ වෙච්ච සංස්කෘතියක් තියෙන ජනතාවක් ජීවත් වෙන රටක්. ජනතාව බුද්ධිමත්. එනිසා ඒ උත්සාහ දරන දේශපාලන කණ්ඩායමට කවදාවත් ඒ දේ කරගන්න බැහැ. අපේ ප්‍රදේශයට, ජනතාවට යහපතක් කලේ කවුද කියලා ජනතාව තේරුම් අරන් ඉන්නේ.

ගරු සභාපතිතුමනි අපේ දිස්ත්‍රික්කයේ නායක, ස්වදේශ හා අභ්‍යන්තර කටයුතු හා පළාත් පාලන ගරු අමාත්‍යතුමන් වන වජිර අබේවර්ධන මැතිතුමන් ප්‍රාදේශීය සභාව යටතේ පාලනය වන මාර්ග සංවර්ධනය කරන්න ලක්ෂ පහ හයක වගේ යෝජනා රාශියක්, කෝටි දෙකකට ආසන්න මුදලක් ප්‍රාදේශීය සභාව හරහා අපේ මන්ත්‍රීවරුන්ට ඉෂ්ට සිද්ධ කරන්න අවස්ථාව ලබල දීල තියෙනවා. දැනට එක කෝටි විසිපන් ලක්ෂයකට ආසන්න ව්‍යාපෘතිවල මුදල් අනුමත කරලා, වැඩ ආරම්භ කරන්න එවලා තියෙනවා. නැවත වාරයක් මේ දෙවැනි යෝජනාවලිය හැටියට, සභාවේ අද සභාපතිතුමන් ඉදිරිපත් කළා. තවත් මාර්ග රාශියකට යෝජනා ඇස්තමේන්තු කරලා එවන්න කියලා කියලා තියෙනවා. ඉතින් මේ වගේ ප්‍රාදේශීය සභාව වෙනත් දේශපාලන කණ්ඩායමක් විසින් මෙහෙයවුවත්, ඒ ගැන තැකීමක් නොකර, අපේ ගරු අමාත්‍යතුමන්, ගරු අග්‍රාමාත්‍යතුමා මේ සියලු ප්‍රාදේශීය සභාවලට ඒ සියලු පහසුකම් ලබා දෙනවා. මොකද අපි කටයුතු කරන්නේ ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් දේශපාලන වාසි තකා නෙවෙයි.

ඒ වගේම නාගොඩ ප්‍රාදේශීය සභාවට අත්‍යවශ්‍යම වෙලා තිබුණු ආදාහනාගාරය ගැන, අපි සතුටින් දන්වන්නෙ. තමුන්නාන්සේලාගේ ඉල්ලීම් වලට අපේ පළාත් පාලන ගරු අමාත්‍යතුමන් වජිර අබේවර්ධන මැතිතුමා, ඒ අවශ්‍ය මුදල ප්‍රතිපූරණය කරලා ලබා දුන්නා. ඒකට අවශ්‍ය ඉඩම අපේ ඉඩම් හා පාර්ලිමේන්තු කටයුතු ගරු අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමා ලබාදී තිබුණා. මම දැක්කා ඉඩම් මැනුම් හැටියට රුපියල් 32000.00ක මුදලක් ඒ වෙනුවෙන් සභාවෙන් ගෙවලා තිබුණා. මම සභාපතිතුමාට කියන්නේ මැතිවරණය පහු වුණත් කමක් නැහැ, ඒ එක්කම මේ ආදාහනාගාරයේ වැඩ පටන් ගන්න. මොකද සභාවට යම් ආදායමක් උපදවාගන්න තියෙන ආදායම් මාර්ගයක්. ඒවගේම ප්‍රදේශයේ ජනතාවගේ දැඩි ඉල්ලීමක් දැන් අපේ රජය යටතේ ඉෂ්ට සිද්ධ වෙලා තියෙනවා. ඉදිරි මැතිවරණය කඩාකප්පල් කරන්න තමුන්නාන්සේලාගේ පැත්තෙන් විශාල කටයුතු ඉෂ්ඨ සිද්ධ කළා. නමුත් ජනතාව අද තේරුම් අරන් තියෙන්නේ ඒව කරන්නේ කවුද? ඒවට නායකත්වය දෙන්නේ කවුද කියලා. ඒ ගැන මම මොකුත් කියන්නේ නැහැ. 17න් පස්සේ ඒවට උත්තර ලැබෙයි. ජනවාරි 08 වැනිදායින් පස්සේ මේ ප්‍රදේශයට මේ වත්මන් රජයෙන් ඉෂ්ඨ සිද්ධ වුණු සංවර්ධන කටයුතුවල බොහොම සුළු අල්පයක් පමණයි මම ප්‍රකාශයට පත් කළේ. වත්මන් රජය නිවැරදි ආර්ථික සැලසුම් එක්ක නිවැරදි දැක්මක් එක්ක ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට සිද්ධ කළා.

ඒ වගේම මේ වෙලාවේ උඩුගම කාර්යාලය ගැන සඳහන් කරනවා නම්, මම පහුගිය දවසක උඩුගම් උපකාර්යාලයට ගියා. ජල නල පද්ධතිය අක්‍රිය වෙලා ගොඩක් කල්. වෙරංග මන්ත්‍රීතුමා මේ කොට්ඨාශය භාර මන්ත්‍රීවරයා හැටියට එතුමා ඒ පිළිබඳව නිතර සොයා බලා තියෙනවා. උප කාර්යාලයේ අලුත් ගොඩනැගිල්ලේ පිටිපස්ස පැත්තට ජලය ලැබෙන්නේ නැහැ. බොහෝ කාලයකට උඩදී මේ සභාවෙන් ඉල්ලීම් කරල තිබුණා. සභාවේ කාර්ය මණ්ඩලයත් මේක නිවැරදි කරලා දෙන්න. මොකද ඒ කොන්ත්‍රාත්කරුවන්ගේ යම් කටයුත්තක් හින්ද තමයි ඒ ජල පද්ධතිය අක්‍රිය වෙලා තියෙන්නේ.

ඒවගේම තල්ගස්වල සති පොල පිළිබඳව කතා කළා. ගරු සභාපතිතුමනි, මම එවෙලෙත් ටෙන්ඩර් මුදල වැඩි කරනවට මම විරුද්ධ වුණේ අපේ ප්‍රදේශයේ තියෙන ප්‍රධාන පොළක් විදියට තල්ගස්වල සති පොල, අතිවිශාල පිරිසක් සෑම බදාදාවකම එනවා. අපිත් පාරිභෝගිකයින් හැටියට සම්බන්ධ වෙනවා. වර්ෂාව දවස්වල පොලේ සෙරෙප්පු දෙකක් දාගෙන තියා නිකන්වත් බඩු ටික ගන්න පොලට යන්න විදිහක් නැහැ. ගරු සභාපතිතුමනි, ඔබතුමාලා මේ පොල වැඩිදියුණු කරන්න

යෝජනා සැලසුම් හැදුවට 2015 ට කලින් ඒව කෙරුනේ නැහැ. ඒ කරපු ඒවයි ප්‍රතිඵල තමයි දැන් තියෙන්නෙ. 2015 ට කලින් සිදු කල  අක්‍රමවත් සංවර්ධනය, නිවැරදි සැලසුම් නොමැතිකම නිසා ඔබත්, අපත් තමුන්නාන්සෙත් අපහසුතාවයන්ට පත්වෙනවා. පොලේ විදුලි පද්ධතියත්, වැසිකිළි කැසිකිළි පද්ධතිය සකස් කරලා දෙන්න. ඒ වගේම පොළ භූමිය ගත්තත් දැඩි ලෙස අපවිත්‍ර වෙලා තියෙන්නෙ. අපි කොච්චර උත්සාහ ගත්තත් අපට අවශ්‍ය අපි බලාපොරොත්තු වෙන විදිහට පහසුකම් ලැබෙන්නේ නැහැ. පොලේ බදු මුදල ඒ ටෙන්ඩර් මුදලට දෙලක්ෂ තිස් පන්දහසක් දෙලක්ෂ තිස් පන්දහසක් එකතු වුණා වගේම අර සියලුදෙනාම මතක් කළා වගේ ඒ මුදල පාරිභෝගිකයන්ගෙන් අරගෙන තමයි සභාවට ගෙවන්න වෙන්නේ. වෙළඳ ද්‍රව්‍යවල මිල වැඩි කරලා තමයි ඒ බදු මුදල ගෙවන්න වෙන්නෙ. ඉදිරි කාලයේදී මම හිතනවා ලබන වසර තුළ අපට මේ පොල අලුත් සැලැස්මක් තුළ විශාල වශයෙන් වෙනස් කරලා, තවත් වැඩි දියුණු කරලා, සකස් කරන්න අපේ රජයෙන් ඒ අවශ්‍ය වටපිටාව අපි දේශපාලන අධිකාරිය දැනුවත් කරලා තියෙනවා. මේ ප්‍රදේශයේ දිවා රාත්‍රී පොළක් හැටියට නිර්මාණය කරන්න 2020 වර්ෂයේ දී අපට ඒ කටයුත්තට අත ගහන්න පුලුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි මේ දිනවල ප්‍රාදේශීය සභාවේ අපේ වීදි ලාම්පු කරන කණ්ඩායම මැතිවරණ කාලයේ අලුතෙන් වීපී ලාම්පු යම් යම් ස්ථානවල සවි කරනවා. හැබැයි මම හිතනවා අලුතෙන් වීපී ලාම්පු හයි කරන එක මැතිවරණ නීතියට පටහැනි දෙයක්. ඊයෙත් තල්ගස්වල වත්තේ මිඩ් එකේ කොටසේ වීපී ලාම්පු තුනක් සවි කරලා තියෙනවා. ඒ ප්‍රදේශයේ යම් යම් පාක්ෂිකයන්ගේ ඉල්ලීම් මත තමයි මේ වීපී ලාම්පු සවිකරලා තියෙන්නෙ. ඒ නිසා මම හිතනවා ජනාධිපතිවරණයක් ප්‍රකාශයට පත් කරලා තියෙද්දී, අන්තිම මොහොතේදී තමන්ගේ පාක්ෂිකයන්ට විවිධ දේශපාලනික වශයෙන් තමන්ගේ දේශපාලන මතයට හරවගන්න වීපී ලාම්පු සවිකරලා, ඒ වගේ සැලසුම් සකස් කරනවා නම් ඒක වැරදියි. ඒ නිසා මේ මැතිවරණ නීතියට පටහැනිව කරන දේවල් වැරදියි. බල්බ් එකක් අළුත්වැඩියා කරාට කමක් නැහැ. අලුතෙන් හයි කරනවා නම් මැතිවරණයට අල්ලස් දෙනවා වගේ වැඩක් කියල මම හිතනවා. මේ කරුණු කෙරෙහි වැඩි අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා

ඒ වගේම මාපලගම මංසන්ධියේ කසල එකතු කරන්න හිටපු වයසක මනුස්සයා දැන් නැහැ. පොඩි ප්‍රශ්නයක් තියෙනවා. මාපලගම වෙළෙඳ ප්‍රජාවගෙ කඩේ ඉදිරිපිට සහ මාර්ගය අතුගාන්න කෙනෙක් නැති නිසා ඒ සඳහා කම්කරුවෙක් යොදවලා, මාපලගම නගරයට ඒ පහසුකම ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම මම නැවතත් කියන්නේ 2015 ජනවාරි අට වැනිදායින් පස්සේ මේ රටේ සිදුවුන දැවැන්ත පරිවර්තනය ගැන සමහර ජනතාව නොදැනුවත්. දැනුවත් වුන යම් පිරිසක් ඉන්නවා. සමහර පිරිස් ඉන්නවා සමාජ කටයුතුවලදී මෙන්න මේ දේ කරලා දුන්නොත්, අපි තමුන්නාන්සේලාත් එක්ක ඉදිරියේදී කටයුතු කරනවා කියලා. නමුත් ඒ ටික කරගත්තට පස්සෙ සමහර අයට අමතක වන දේවලුත් අපි දකිනවා. ඒ කුහක මත දරන පිරිසකුත් ඉන්නවා. ඉතින් පහුගිය කාලේ ඒ සිදුවුන දැවැන්ත වැඩ පිළිවෙලත් සමග අපේ ජනාධිපති අපේක්ෂකතුමන් එක්සත් ජාතික පක්ෂ නියෝජ්‍ය නායක සජිත් ප්‍රේමදාස මැතිතුමන් ඉතාමත්ම ඉහළම සුවිශේෂී ජයග්‍රහණයක් කරා මේ වනවිට ගමන්කරනවා. ජයග්‍රහණය තහවරු වෙන්නේ 16 වෙනිදා පැවැත්වෙන ඡන්දෙදි. එතුමාගේ ජයග්‍රහණය විජයග්‍රහණයක් වේවායි ප්‍රාර්ථනය කරමින්, මම නිහඬ වෙනවා. ඔබ සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ත සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, ඔබතුමාට මම ප්‍රථමයෙන්ම ස්තූති කරන්න ඕන. මොකද ලෝක ළමා දිනය වෙනුවෙන් අපේ මාපලගම ක්‍රීඩාංගනයේ පැවති

උත්සවය සම්බන්ධව. අපේ ප්‍රදේශයේත් පෙරපාසල් දෙකක් සම්බන්ධ වුනා. ඒ සම්බන්ධව ඔබතුමාටත්, සභාවේ සියලුම දෙනාටත් ස්තූතිය පුද කරනවා. ඒවගේම තමයි ගරු සභාපතිතුමනි, මම අර උදේ දුන්න පෙත්සමත් එක්ක 70 කන්ද මාර්ගය සම්බන්ධව පොඩි වචනයක් කතා කරන්න ඕන. මොකද එතන ගෙවල් 80ක් තියෙනවා. ඒ සම්බන්දව කතා කරනවානම්, මම හිතන්නෙ ඒක නීතිමය පැත්තක් තියෙනවා. ඒ වුනත් ඊට ඉස්සෙල්ලත් නඩුව තියෙද්දි ඒ පාර කොන්ක්‍රීට් කළා. මම කියන්නෙ ගරු සභාපතිතුමනි, ඒ මාර්ගයේ ඒ අර පැමිණිලිකරුත් දැන් කියනවා අපි කැමතියි කියලා. එම නිසා ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරලා හැකි ඉක්මනින් එය කිරීමට අවස්ථාව ලබා දෙන්න කියල ඔබතුමාගෙන් ඉල්ලනවා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මම හිතන්නෙ අපි මේ සභාවට එන්නෙ උපතේ සිට මරණය දක්වා කියන කටයුත්තක් සම්බන්ධයෙන්. ඒ කියන්නෙ අපේ යෝජනා සියලුම දේ එක් කරමින්. ඒවගේම තමයි ගරු සභාපතිතුමනි, අපි කමිටුවලට පත් වෙනවා. ඇත්තටම මේ එක කමිටුවක්වත් මෙතෙක් තියලා නැහැ. පරිසර කමිටු, පුස්තකාල කමිටු ඒ මොනවවත් නැහැ. ඒ මොකද කියල මම ඔබතුමාගෙන් අහනවා.

අනිත් එක තමයි ගරු සභාපතිතුමනි, මම හැමදාම ඉදිරිපත් කරන යෝජනාවක් තමයි අබේසුන්දර මහත්මාගේ නිවස අසල තියෙන ජල පද්ධතිය. ඒක ඇත්තටම අපේ ගයාන් මන්ත්‍රීතුමත් දන්නවා. අපි ඒ හරියෙ ඉන්න නිසා මිනිස්සු අපෙන් අහනවා. ගරු සභාපති

තුමනි, අපේ ගයාන් මන්ත්‍රීතුමා ඉන්න නිවස අද්දර. බෝට්ටුවක් හරි දාන්නෙයි කියල කතා කරලා කියනවා. ගරු සභාපතිතුමනි ඇත්තටම ඒකට ක්‍රියාමාර්ගයක් ගන්න. මේ සම්බන්ධව ඉතිං අපටත් ලැජ්ජයි. දැන් අපි හැම තැනදිම ඔය කාරණය නිසා අසරණ වෙනවා. ගරු සභාපතිතුමනි, ඒක නිසා එයට පිළියමක් වශයෙන් කුමක් හෝ කරන්න.

ඊලග එක තමයි කුඹුස්ස පාලම ලග ඇත්තටම අපේ පියල් මන්ත්‍රීතුමාත්, ගයාන් මන්ත්‍රීතුමාත් දන්නවා. එතන ඒ පාලම ගිලා බැහැලා තියෙන්නෙ. දැන් සිරිසුනන්දෙට එතනින් ළමයි 80 ක් විතර එක බස් එකක එනවා. කොයි වෙලාවෙ කොයි මොහොතක අනතුරකට ලක් වේද දන්නෙ නැහැ.මම ගිය සභා වාරෙදිත් ඒ ගැන කිව්වා. RDA එක හරහා හෝ යකඩ තහඩුවක් හරි ගෙන්නලා කුමක් හෝ ක්‍රියාමාර්ගයක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, අර පොළ සම්බන්ධව අපේ වසන්ත මන්ත්‍රීතුමා කිව්ව වගේම ඒකෙ ඇත්තටම පිරිසිදු කිරීම ගොඩක් අඩුවෙන් වෙන්නෙ. අර වැටෙන් එහා පැත්තට අපද්‍රව්‍ය කොටසක් දාලා තමයි අපේ සුද්ධ පවිත්‍රකරන කට්ටිය කුණු ගේන්නෙ. ඇත්තටම ඒ ටික පිරිසිදු කරන්න කියලා මම ඉල්ලා සිටිනව. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි කුඹුරුහේන මාර්ගයේ තල්ගස්වල ඉදල එන තැන කුඹුරුහේන මාර්ගයට හැරෙන ස්ථානයේ බෝඩ් එක ලග ගිලා බැහැලා තියෙනවා. එතන ඒ ඇලේ ගලක් තිබුනා. ඒ ගල ගැලවීම නිසා තමයි මෙහෙම වුනේ. ඒක ගිය සැරෙත් මම කිව්වා. මම හිතන්නෙ තාම ඒ සම්බන්ධව කිසිම නිරීක්ෂණයක් කළාද කියලා අපි දන්නෙ නැහැ. එතන ඇල කපලා තියෙනවා. කවුරු හරි ඊක තමයි ඩෝසරේ දාලා කපලා තියෙන්නෙ. ඒ සම්බන්ධව පොඩ්ඩක් සොයා බලන්න.

ඒවගේම තමයි ගරු සභාපතිතුමනි, මේ වීදී ලාම්පු ඇත්තටම අපි ගමකට වීදී ලාම්පු දාන්න ඕන. එලිය දකින්න ඕන. නමුත් අර වසන්ත මන්ත්‍රීතුමා කිව්වා වගේ මිඩ් එකේ වීදී ලාම්පු දාල තියෙන්නෙ තුනයි. ඒ ලයිට් තුන ඇත්තටම දාල තියෙන්නෙ ඕන තැනකට නෙවෙයි. ඊයෙ ඒ කැබ් එකේ වෙන එක්කෙනෙක් දාගෙන ගිහිල්ලා ඒ ගොල්ලන්ට වුවමනා කියන තැන්වලට තමයි දාල තියෙන්නෙ. වීදී ලාම්පුවල ක්‍රමවේදයක් තියෙනවා. ඒ ක්‍රමවේදයට නෙවෙයි කරල තියෙන්නෙ. ඔබතුමාගෙ අවධානය ඒකටත් යොමු කරන්න කියල මම ඉල්ලා සිටිනවා. ඒකෙ බල්බ් සවි කරපු පුද්ගලයොත්

ගිහිපු පුද්ගලයොත් සියලු දේ මම දන්නවා. එවෙලෙත් මට කතා කරලා කිව්වා. මෙන්න මෙහෙමයි කියලා. මම කිව්වා අපි දැනුවත් නැහැ කියලා. ගරු සභාපතිතුමනි, ඇත්තටම එහෙම කරන්න එපා. ඒ විදිහට යම් ක්‍රමවේදයකට යන්න.

අනිත් එක තමයි ගරු සභාපතිතුමනි, මේ ගවයන් සම්බන්දව. ඇත්තටම කියන්න කණගාටුයි. අපේ කුඹුරුහේන පන්සලේ හාමුදුරුවො චෛත්‍යයේ ලයිට් දාන්න ගිහිපු අවස්ථාවක හාමුදුරුවන්ට ගවයෙක් එලවගෙන ඇවිල්ල ඇනලා. දත් හතරක් කැඩිලා. ඇත්තටම අන්න ඒ නිසා ඔය ප්‍රශ්නය පොලීසියෙ OIC මහත්තයත් එක්කත් කතා කළා. ඒකට මොකක් හෝ පිළියමක් අපි කරගමු. ඊලග ප්‍රශ්නෙ තමයි ගරු සභාපතිතුමනි දැන් අපි හැමදාම කතා කරන මාපලගම පොදු වැසිකිලිය පිළිබඳව ඇත්තටම තාම ඒකට උත්තරයක් නැහැ. මේ ඊයෙ පෙරේදත් උදේ 4.00 ට නුවර පැත්තෙ ඉදල මනුස්සයෙක් ඇවිල්ල ඒ මනුස්සය හැම තැනම හොයනව වැසිකිලියට යන්න. පස්සෙ අර බැංකුවෙ මහත්තයලගෙ ගෙදරට තමයි අපි එක්කගෙන ගියෙ. ඇත්තටම කණගාටුයි.

අනිත් එක තමයි ගරු සභාපතිතුමනි මේ මාධ්‍යවේදීන් එන්නෙ නැත්තෙ මොකද කියන එක ඇත්තටම ප්‍රශ්නයක්. මම එදත් කිව්වා මගේ කෑම වේල හරි අඩු කරලා, එතුමන්ලට කීයක් හරි දීලා, මාධ්‍යවේදීන් ගෙන්වන්න කියලා. මේ මාධ්‍යවේදීන් මෙතන නැත්තෙ මොකද කියලා අපට ඇත්තටම ප්‍රශ්නයක්.

ඊලග එක තමයි ගරු සභාපතිතුමනි, අපේ මේ ජාතික ගැටලුව ගැන දැන් පවතින මේ ක්‍රමවේදයත් එක්ක මම එච්චර කතා කරන්නෙ නැහැ. ගරු සභාපතිතුමනි, ඒ සදහා අපි විද්වතුන්, වෘත්තිකයන්, කලාකරුවන් සියලුම දෙනා එකතු කරගෙන ජාතික බලවේගය හදාගෙන යනවා. මේ මහා සාගරයක් වගේ අපි හිරවෙලා ඉන්නෙ. ඇත්තටම මේ මුහුදක අපි අතරමංවෙලා ඉන්නෙ.ඒ මුහුදෙන් අපි මාර්ගය සොයාගෙන යන්න, ඒකට අපි ලකුණක් යෙදුව මාලිමාව. ඒ මාලිමාවෙන් නියමාකාරයෙන් දිසාව හොයාගෙන. සියලු දෙනත් එක්ක එකතු වෙලා.කොයි දිසාවටද අපි යායුත්තෙ කියන කටයුත්ත කරගෙන යනවා. මමත් වඩු කාර්මික ශිල්පියෙක්. මම දන්නව මාලිමාවෙන් කෙරෙනදේ. සමහරු හිතයි මේ ඔරලොසුව කියලා. ඔරලෝසුව නෙවෙයි මාලිමාව. මාලිමාවෙන් කෙරෙන්නෙ මොකක්ද?දිසාව බලා ගන්න එක.අපි තවම දිසාව දැන ගත්තෙ නැහැ.මේ දිසාව සොයා ගන්න අපි අවුරුදු 71 ක් ඇත්තටම පොර බැදුවා. මේ තට්ටු මාරු දේශපාලනයත් එක්ක නිවැරදි දිසාව සොයා ගන්න බැරි වුනා. ඇත්තටම අපි කාටවත් අපහාස කරන්නෙ නැහැ.අපි රතුපස්වල කතා කියන්නෙ නැහැ. ගරුසභාපතිතුමනි, අපි ඔය සුදු වැන් සංස්කෘතිය ගැන කියන්නෙ නැහැ.මහ බැංකු ගැන කියන්නෙ නැහැ. ගරු සභාපතිතුමනි, ඒවා ගැන දන්නවා. ඇත්තටම සතුටුයි. එම නිසා සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටින්නෙ දැන්වත් මොලේ පාවිච්චි කරල හරි දිසාවට ගමන් කරන්න කියලා. ඒකට අපි හොද අපේක්ෂකයෙක් වශයෙන් දාල තියෙනවා.අපේ පක්ෂෙ අනුර කුමාර දිසානායක මහතා. ඒ නිසා සියලු දෙනාගෙ සහයෝගය ඇතුව ඉදිරියට ගමන ආරම්භ කරමු කියල ඉල්ලමින්, ඔබ සියලු දෙනාට තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. ඇත්තටම දැන් පහුගිය කාලය තුල අපේ සභාපතිතුමාට ආපු චෝදනාව තමයි විදුලිය පිළිබඳව. දැන් වීපී පහන් දානවයි කියල තමයි

මේ දිනවල පොඩි ප්‍රශ්නයක් ඇවිල්ල තියෙන්නෙ. විදුලි ආලෝකයක් ලබාදීම පිළිබඳව අපි කවුරුත් එතනදි විරුද්ධත්වයක් දක්වන්නෙ නැහැ. ආලෝකයක් දෙන්න ඕන තැනට අඳුරක් දෙන එකේ නෙවෙයි මන්ත්‍රීතුමා වැදගත්කම තියෙන්නෙ. ඒ නිසා අපි සතුටු වෙනවා කොහොම හරි කමක් නැහැ. ජනතාවට යම්කිසි දෙයක් ඉෂ්ඨ සිද්ධ වෙනව නම් ප්‍රාදේශීය මට්ටමෙන්, කොට්ඨාස මට්ටමෙන් ඒක තමයි අපි බලාපොරොත්තු වෙන එකමදේ. ඒ නිසා දැන් මේ ඇතිවන කාලය තුලදී ආලෝකය ඉතාමත්ම අවශ්‍යයි. ඒ නිසා අඳුරු අවදිය නැති කරල ආලෝකමත් කාලයක් ඉස්සරහට එන නිසා ආලෝකයෙන් බැබලෙන විදිහේ කටයුත්තක් කිරීම පිළිබඳව අපි ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වෙන්න ඕන. ඇත්තටම මම දන්නව ඔය කියන වතුකරයේ ප්‍රදේශය. මමත් පසු ගිය කාලෙක ඇත්තටම මලගෙදරකට සහභාගි වුනා. ඇත්ත කතන්දරේ කතා කළොත්, ඒ ප්‍රදේශයේ යන්න බැහැ. කටු පොල් වගාවත් එක්ක ලොකු අන්ධකාරයක් තියෙන්නෙ.ඒක නිසා මම නම් කියන්නෙ කාටවුනත් ආලෝකයක් දීපු එක පිළිබඳව අපි කොහෙත්ම විරුද්ධත්වයක් ප්‍රකාශ කරන්නෙ නැහැ.ඒ ගැන අපි සතුටු වෙනව.

ඇත්තටම අපේ රංජිත් ජයවීර මන්ත්‍රීතුමා කතා කළ එක පිළිබඳව අපි ගොඩක් සතුටුවෙනව. එතුමා වර්ෂ ගණන පොඩ්ඩක් එහාට මෙහාට දාල කතා කළා. 1987,88 වර්ෂ ගැන කතා නොකර වෙන දේවල් ගැන කතා කළා. ඒ වර්ෂ දෙක ඔබතුමා මතක් කර ගත්තොත් ඉතා වැදගත් වෙනවයි කියන එක මම කියනවා. මේ දවස්වල මාලිමාව කැරකේවි. 1987,88 මතක් වෙනකොට ගානට කැරකේවි. එතකොට තමයි මන්ත්‍රීතුමා අර කාලය තුල කෙරුනු දේවල් පිළිබඳව ඔබතුමාලට ප්‍රතිචාර ලැබෙන්නෙ. ඒ වගේම ඉතිං මේ ලයිට් දාන එක විදුලි බලය ගැන විතරක් කතා කරනවා. මම සමහරක් තැන්වල සභාපතිතුමනි මේ පාරවල් කොන්ක්‍රීට් කරන ඒව පවා කරගෙන යන්නෙ. එතකොට ඒ පිළිබඳව කවුරුවත් ඒ ගැන කතා කිරීමක් කරන්නෙ නැහැ. ඒත් අපි හදවතින්ම සතුටු වෙනවා. මොකද ගමට, ජනතාවට සේවාවක් කරනවනම් ඒක තමයි වැදගත්. අපි එතන තමයි හිටගන්නෙ.ඒක නිසා අපි ඒ පිළිබඳව කිසිම විරුද්ධත්වයක් නැහැ. හැබැයි මම හදවතින්ම කණගාටු වෙනව විදුලිය දීපු එක පිළිබඳව කරපු චෝදනාව ගැන.ඒක නම් කාට කළා වුනත් ආලෝකයක් ලබා දෙන එක හදවතටත් හොඳ දෙයක්. ඒ නිසා මේ වෙලාවෙ ඒ කරපු කටයුත්ත පිළිබඳව අපි සතුටු වෙනවා. ඉතිං අපි ලබන මාසෙ හමුවෙනකොට බොහොම සුන්දර ලෝකෙක ලස්සන ජීවිතයක් ගත කිරීමේ බලාපොරොත්තු සහගතව අද දවසේ සමුගන්නවා. සියලු දෙනාටම බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ගෙන්, මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. මම එක විනාඩියකට තමයි මේ අවස්ථාවෙ නැගිට්ටෙ. මට හිතෙන්නෙ මේ ප්‍රියන්තා ගුණසේකර මන්ත්‍රීතුමිය කිව්වා අඳුර තියෙන ස්ථානවලට ආලෝකය දෙන්න කියලා. ඒ වගේම තමයි මේ දිනවල ගරු වජිර අබේවර්ධන මැතිතුමා විසින් ඒ යොමු කරපු පාරවල්, ඔබතුමා මේ දිනවල කරන්න එපා කියල නවත්වලද කියල තමයි මට දැනගන්න ඕන. මොකද කොන්ත්‍රාත්කරු කිව්වා කරන්න එපා කියලා කිව්වයි කියලා. ගිවිසුම් ගත කරල තියෙන්නෙ ඒ පිළිබඳ දැනගැනීමට තමයි මම මේ අවස්ථාව අවස්ථාවක් කර ගත්තෙ. ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී චන්දිමා දිල්රුක්ෂි මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. සභාපතිතුමනි මේ දිනවල වීථී පහන් අලුත් වැඩියා කරගෙන යනවා කියලා මේ සියලු දෙනාම මේ අවස්ථාවෙ කතා කළා. මම ගිය මාසෙ 25,26,27,28 දින හතරෙම ඔබතුමාට දුරකතනයෙන් අමතලා මලාමුරේ අජිත් වරාපිටිය මහතාගේ

නිවස ඉදිරිපිට තියෙන වීපී පහන අලුත් වැඩියා කරල දෙන්න කියල ඉල්ලීම් කළා. එතකොට ඔබතුමා කරලා දෙනවා කියලා මට පොරොන්දුත් වුනා. 28 වෙනිද උදේම මලාමුර ප්‍රදේශයේ වීපී පහන් හදන්න ගිහිල්ලත් තිබුණා. ඒ බව දැනගෙන මම දුරකතනෙන් ආයිත් කතා කරලා සභාපතිතුමාට නැවතත් කිව්වා. කෝල් කරල හරි කියන්න කියලා. ඊට පස්සෙ කොහොම හරි එතනට ගිහිල්ලත් තියෙනවා. ගිහිල්ල එතන එක්සත් ජාතික පක්ෂ මැතිවරණ කාර්යාලය තියෙනවා කියල ගිහිපු අය ඔබතුමාට දුරකතනයෙන් කතා කරල කිව්වට පස්සෙ කොහොම හරි ඒක තියෙන නිසා එතනින් ආපහු හැරිල ඇවිල්ල තියෙනවා. එහෙනම් හදන්න එපා කියල කිව්ව කියලා තියෙනවා. ඊට පස්සෙ මම ආපහු ඔබතුමාට කෝල් කරල ඇහුවා මෙන්න මෙහෙම කියල තියෙනව සභාපතිතුමා ඒක හදන්න කියල කියන්න කියල. ඊට පස්සෙ හදන්න භාණ්ඩ නැහැ කියලා තියෙනවා. නමුත් මෙතන මේ ඉදිරි ගෙවීම් වාර්තාවෙ, වීපී පහන් අලුත් වැඩියා කරන්න අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා තිස් පන්දහස් ගණනකුයි නැවත හත් දහසකුයි වැය කරලා තියෙනවා. ඉතිං එතන ඒ අලුත් වැඩියා කරන්න අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගන්නනෙ ඒ වියදම තියෙන්නෙ. අලුත් වැඩියා කරන්න අවශ්‍ය ද්‍රව්‍ය නැහැයි කියලා කියලා තියෙනවා. එතනට ගිහිල්ල මෙහෙම කාර්යාලයක් තියෙවයි කියල ඔබතුමාට කෝල් එකක් දීල එහෙනම් හදන්න එපා කියල ආව කියල තමයි මට ආරංචිය ලැබුනෙ. ඉතිං ඒ වීපී පහන අලුත් වැඩියා කරල දෙන්න කියල මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊට අමතරව සභාපතිතුමා, දැන් ඉතිං සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ ජයග්‍රහනය ඉවසා ගන්න බැරි පිරිසක් මලාමුර ප්රදේශයේ ඉන්නවා. පහුගිය දිනක ගම්පෙරලිය යටතෙ කොළඹ ගෙදර ලඟ ඉදල කුඩමලාන මාර්ගයේ. ලක්ෂ 20 ක ව්‍යාපෘතියක් කළා. ඒකෙ ගම්පෙරලිය නාම පුවරුව කඩල එතන තියෙන ඇලට දාල තිබුනා. ඒ කියන්නෙ තවම මුදල්වත් අරගනිපු නැති ව්‍යාපෘතියක්. ලක්ෂ 20 ක ව්‍යාපෘතියක්. ඉතිං ගයාන් මන්ත්‍රීතුමා නෙවෙයි ඒ දේ කළේ කියලා මම කියනවා. එතුමා නෙවෙයි එතුමගෙ ඉදිරි ගමනටත් අවහිර කරන පොහොට්ටුවෙ පිරිසක් ඉන්නවා.ඒ අය තමයි කරල තියෙන්නෙ. ගයාන් මන්ත්‍රීතුමා, ඔබතුමත් මේ සිදුවීම හෙලා දැක්කා. අර දින පනස් දෙකේ විප්ලවය වෙලාවෙත් නිල සෙවන කාර්යාලයේ ඒ නාම පුවරුවෙත් අගමැතිතුමාගෙත්, වජිර ඇමතිතුමාගෙත් පිංතූර ගහපු ස්ටිකර් එක ගලවල විනාශ කළා. ඒ වගේ පිරිසක් ඉන්නෙ. ඒක නිසා මම ඔබතුමාගෙන් ඉල්ලන්නෙ වීපී පහන ඡන්දෙන් ඉස්සෙල්ලවත් දාල දෙනවද කියලා. හැමෝම කියන්නෙ වීපී පහන් දානව දානව කියල. එහෙමනම් ඔක්කොගෙම නොදා ඉන්න ඕන. මම ඉල්ලපු එක විතරයි දාල නැත්තෙ. එය අලුත්වැඩියා කර දෙන මෙන් ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීවරු සියලු දෙනාගෙන්ම අවසරයි. ප්‍රථමයෙන්ම ගරු සභාපතිතුමාට ස්තූතිය පුද කරන්න ඕන. මගේ කොට්ඨාසෙ පාරවල් ටික ශුද්ධ කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරාම, ඔබතුමා දැනට එක වසමක පාරවල් ටික ශුද්ධ කරලා දුන්නා. මම හිතන්නෙ තව එක දවසක් දෙකක් සුද්ධ කරන්න තියෙනවා. ගෞරවයෙන් ඉල්ලීමක් කරනව ඒකත් කරලා දෙන්න කියලා. ඒ වගේම අපේ වනමල් මන්ත්‍රීතුමාට පුංචි දෙයක් මතක් කරල දෙන්න ඕන. ගරු සභාපතිතුමනි, වනමල් මන්ත්‍රීතුමා කිව්වා. 2015 වෙන් පස්සෙ අපේ මිනිස්සුන්ට හොඳ දෙයක් වුනා,සාධාරණයක් වුනයි කියලා. වනමල් මන්ත්‍රීතුමාට අමතක වෙන්න ඇති. මහින්ද මහත්තය විසින් දරුණු යුද්ධය නිමා කළාට පස්සෙ. 2015 වෙන් පස්සෙ මේ කාලකණ්ණි ආණ්ඩුව නිසා අහිංසක මිනිස්සු 350 ක් 400 ක් විතර එකතැන වලලාන්න සිද්ද වුනා. ඒ වගේම අහිංසක මිනිස්සුන්ගෙ අත පය අහිමි කළා. ගරු සභාපතිතුමනි. ඒව අමතක වුන මේ වනමල් මන්ත්‍රීතුමාලගෙ නායකයන් ඒවට කට ඇරියෙ නැහැ. සජිත් මහත්තයා ජනාධිපති වෙන්න දැඟලුවට මම හිතන්නෙ එවෙලෙ කවුරුවත්ම මේ සිදු වුන අපරාදෙට සම්බන්ධ වුන එකෙක්වත් අත්අඩංගුවට ගන්නවයි කියලා කිව්වෙ නැහැ.. එවෙලෙම අපේ නායක අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා, එවෙලෙ එතනට ගිහිල්ලා ඒ අවස්ථාවට සහභාගි වෙලා, එතුමා කරන්න තියෙන නිවේදන කටයුතු ටික ලබා දුන්නා.

ඒකත් මතක් කරන ගමන්ම අහිංසක වතු කම්කරු මිනිස්සු රුපියල් 1000.00 ඉල්ලල පාරෙ කෑගහන කොට, රුපියල් 50 ක් වැඩිකර ගන්න බැරි මේ ආණ්ඩුව එවෙලෙ නිහඬව හිටියා. එතනදි මහින්ද මහත්තය පාර්ලිමේන්තුවෙ කතා කරලා කිව්වා රුපියල් 1000.00 ක මුදල වැඩි කරනවයි කියලා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙ ප්‍රතිපත්ති ප්‍රකාශයේ රුපියල් 1000.00 දැක්ක විතරයි බය වෙලා. මේ ඔය පුතණ්ඩුවන් කතා කරන්න පටන් ගත්තා 1500 ක් දෙනවයි කියලා. ඒක නිසා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුත් එක්ක අපි දේශපාලනය කතා කරන්න යන්නෙ නැහැ. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ට අපි ගරු කරනවා. නමුත් අපි හිතට එකඟව කතා කරන්න ඕන. මේ මහින්ද මහත්තයගෙත්, ඒ වගේම යහපාලන ආණ්ඩුවෙනුත් මේ රටට වෙච්ච හොඳ කාගෙද කියල සිහිපත් කරන්න ඕන. සංවර්ධන කටයුත්තක් වෙනව නම් අපි ඒකට කවදාවත් අකුල් හෙලන්නෙ නැහැ. ඒක නිසා මම හිතන්නෙ අපි වීජී ලාම්පුවක් දාල දෙන්න කියලා ඉල්ලනකොට එක්සත් ජාතික පක්ෂෙන් විරුද්ධ වෙනවනම් වීජී ලාම්පුවක් දාන එක අසාධාරණයි කියලා. මම හිතන්නෙ ඔබතුමාලා එතන ඒ අහිංසක මිනිස්සුන්ට කරන ලොකු අසාධාරණයක්. ගරු සභාපතිතුමනි, පොහොර සහනාධාරයවත් දී ගන්න බැරි, දින 51 ආණ්ඩුව ආවට පස්සෙ තමයි පොහොර සහනාධාරය රුපියල් එක් දහස් ගාන කළේ.ඒක නිසා මම පොඩි අදහසක් ජයවීර මන්ත්‍රීතුමාට දෙන්නෙ. ඔබතුමා අපේ සහෝදර මන්ත්‍රී කෙනෙක් විදිහට, අපි ඔබ තුමාට ගරු කරනවා. ඔබතුමාගෙ අපේ තියෙන හිතවත් කමත් එක්ක ඔබතුමත් එක්ක කවදාවත් ගැටීමක් ඇතිකර ගන්නෙ නැහැ. ඒක නිසා මම හිතන්නෙ ජනතා විමුක්ති පෙරමුණ, එක්සත් ජාතික පක්ෂයට, යහපාලන ආණ්ඩුවට මුක්කු ගහලා, යහපාලනය හදන්න මහින්ද මහත්තයගෙ පවුල් වාදය අවුස්සලා තනිකර විනාශයට පත් කළේ ඔබතුමාලත් හවුල් වෙලා. ඒක නිසා මේ මැරිච්ච,අත පය අහිමි වෙච්ච, මේ රටේ අද කන්න නැතුව දුක් විදින මිනිස්සුන්ගෙ ඒ වගකීම ඔබතුමාලත් භාර ගන්න ඕන. එක්සත් ජාතික පක්ෂිකයන්ට විතරක් සමෘද්ධි කැල්ල ලබාදීලා, අහිංසක මිනිස්සු අපේ ගම්වලත් ඉන්නවා. ගමට ගිහින් බලන්න තරංග මන්ත්‍රීතුමාලා එහෙම දන්නවා..අපි වැඩකටයුත්තක් කරන කොට යූ.එන්.පී ද,ජ.වි.පෙ ද,ශ්‍රී ලංකා ද කියලා පක්ෂ භේදයක් බලන්නෙ නැහැ. සමෘද්ධි කැල්ල හදන කොට සාධාරණ වෙන්න තිබුනා. මේ ගම්පෙරලිය කියල තනි ගෙදරට කොන්ක්‍රීට් දාපු තැන් තියෙනවා. සංවර්ධන කටයුතු කරනවනම් හොඳයි. ලක්ෂ දෙක තුන බෙදන වැඩපිළිවෙලවල් තියෙනව.ඒ එක්සත් ජාතික පක්ෂයට හොඳට කඩේ ගියානම්, එක්සත් ජතික පාක්ෂයෙ පොලිම් බූත් වාඩි වුනානම්, එතනදී අහිංසක දුප්පත් මනුස්සය දිහා නෙවෙයි බලන්නෙ. එතනදි එක්සත් ජතික පක්ෂයේ ඒ ලක්ෂ දෙක තුන දෙන්නෙ අර ප්‍රබලව එක්සත් ජතික පාක්ෂිකයන්ට වැඩකළ අයට. අපි කියන්නෙ ඒ පක්ෂයෙ අයටත් සලකන්න ඕන.නමුත් අහිංසක දුප්පත් මිනිස්සුන්ට සාධාරණයක් කරනවනම් හොඳයි. නමුත් සහබන්දු මන්ත්‍රීතුමාලා අපි ගරු කරන ජ්‍යෙෂ්ඨමන්ත්‍රීවරු. ඒක නිසා ඔබතුමාලගෙ අවදානය යොමු කරන්න ඕන . ගරු සභාපතිතුමනි මම වැඩි වෙලා ගන්නෙ නැහැ.16 වෙනිදයින් පස්සෙ අපේ නායක මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රධාන අපේ ජනාධිපතිතුමා විදිහට ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ආවට පස්සෙ අපේ නායකයන් එක්ක අපි පක්ෂ බේද නැතුව,ජ.වි.පෙ. ද,යූ.එන්.පී. ද,ශ්‍රී ලංකා ද,පොහොට්ටු කාරයොද කියන දේවල් නැතුව. අපි හොඳ වැඩපිළිවෙලක් කරන බවත් මතක් කරමින්, ස්ථිර වශයෙන්ම 17 වෙනිද එළිවෙන කොට අනිවාර්යයෙන්ම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපති වෙලා ඉවරයි. ඒක නිසා ඔබට හීනයක් විතරයි සජිත් මහත්තයා මේ රටේ විපක්ෂ නායක කමටවත් එන්නෙ නැහැ. විපක්ෂ නායකකමත් අහිමි වෙනවා. විපක්ෂෙ වාඩිවෙන්නෙ අනිවාර්යයෙන්ම රනිල් මහත්තයා. ඒක නිසා ස්ථිර වශයෙන්ම 17 වෙනිද වෙන කොට අපේ රටේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කියන එකත් මතක් කරන ගමන්ම, ඔබතුමාලගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරන්නෙ, සියලු දෙනත් එක්ක,අපි මෙතන ඉන්නෙ සහෝදර ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු ටිකක්. අපි සහයෝගෙන් කටයුතු කරමු. 17 වෙනිද වෙන කොට අපේ ජනාධිපතිවරයෙක් හා අපේ ආණ්ඩුවක් තුලින් ඔය කරපු අසාධාරණ වැඩකටයුතු නිමා කරල හොඳ සංවර්ධන වැඩකොටසක් කරන බවටත් මතක් කරමින්, මම නිහඬ වෙනවා.බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ගයාන් මදූසංක මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි .දේශපාලනය ගැන නම් කතා කරල වැඩක් නැහැ.මම සහ අපේ දිල්රුක්ෂි මන්ත්‍රීතුමිය බොහොම සහෝදරත්වයෙන් ඉන්න මන්ත්‍රීතුමිය. එතුමිය කියපු ඒ නාම පුවරුව ගලවපු එකට මගෙත් බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා. ඒ සිදුවීම වුනු වෙලාවෙ මට යම් දුරකතන ඇමතුමක් ලැබුනා. මම හිතන්නෙ රෑ 12.00 ත් පහුවෙලා. මම එවෙලෙ එතුමියගෙ මහත්තයට කතා කරල විස්තරේ ඇහුවා. මමත් දැඩිලෙස හෙලා දකිනව ඒ කරපු වැඩේ මොකද ඒ කරපු වැඩේට මමත් කැමති නැහැ.අපි බොහොම සහෝදරත්වයෙන් දේශපාලනය කරනවා. ගොඩක් කාලෙක ඉඳන් අබලන් වෙච්ච පාරක් මමත් ඒ පාරෙ නිතර ගමන් කරනවා.මොකද මගේ ලඟම හිතවතෙක්ගෙ ගෙදරට යන්න තියෙන්නෙ ඒ පාරෙන්. ඒ පාර හදපු එක ඇත්තටම හොඳයි. නමුත් ඒ නාම පුවරුව කඩා දාපු එක පහත් වැඩක් කියල මමත් හෙලා දකිනවා.

ඒ වගේම තමයි දැන් වීපී ලාම්පු ගැන කතා කළා.. සභාපතිතුමනි, මමත් කාර්යාලයක් දාලා තියෙනවා. අපේ සභාපතිතුමා ඉඳලත් මම එතනට වීපී ලාම්පුවක් ඉල්ලලා තියෙනවා. නමුත් ඔබතුමාගෙන් තාම ඒක ලැබුනෙ නැහැ. දැන් මෙතුමිය කිව්ව එතන කාර්යාලය ඉස්සරහය කියල. මෙතුමියට විතරක් නෙවෙයි ඒ දේ මටත් වුනා. ඉතිං ඒ ගැන කොහොමද කියන්න මම දන්නෙ නැහැ. ඒක නිසා අපි දන්නව මේකෙ අර්බුද මැද තමයි මේක යන්නෙ. මුදල් නැති ප්‍රශ්න තියෙනවා. පහුගිය කාලෙ කයිඹ පිංකම් නිසා ඒවට මූලිකත්වය දීපු නිසා වෙන්න ඇති අපට ඒව ලැබුනෙ නැත්තෙ.

අනිත් එක තමයි අපේ රංජිත් ජයවීර මන්ත්‍රීතුමා කිව්වා. ජයතිස්ස අබේසුන්දර මහත්තයලගෙ ගේ ඉස්සරහ වතුර වල පිළිබඳව. මට පුලුවන් විදිහට දැන් බෝට්ටු පදින්නෙ නැති තත්වෙට හදල තියෙනවා. දැන් ගොඩක් දුරට වතුර රැඳෙන්නෙ නැහැ. ඒ නිසා ඒ පැයක් ඇතුලත පයින් යන්න පුලුවන් විදිහට දැනට හදල තියෙනව. ඉතිං ඒකට කරන්න පුලුවන් දෙයක් අපි ඉදිරියෙදි කරන්න බලාපොරොත්තු වෙනවා.

ඊලඟට වීපී ලාම්පු සම්බන්ධයෙන්, ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා. කොළඹ කඩේ මංසන්දියෙ තියෙන වීපී ලාම්පුව, මම මේ සභාවෙ ඉන්න තාක්කල් එතනට ලයිට් එක දාන්න එපා. මම පෞද්ගලිකව ඉල්ලන්නෙ. කිසි දෙයක් නෙවෙයි මම දැම්මයි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පොහොට්ටුවෙ ඇයින්ගෙ බල්බ් අපට ඕන නැහැ කියල එතන හිටපු එක්සත් ජාතික පක්ෂෙ කෙනෙක් ඒක ඇදල කැඩුවා. මම ඔබතුමාට කතා කරල කිව්වා. එයාලගෙ රැස්වීමක් තියෙන කොට ඒ වයර් දෙක අමුණ ගෙන ඒකෙන් එලිය බලනවා. ඒක නිසා මම බොහොම ගෞරවයෙන් ඉල්ලනව සභාපතිතුමා ඒ වගේ තුච්ච වැඩ කරන කොට එතනට ලයිට් එකක් දාන්න එපා කියලා. මොකද මගේ ගේ ඉස්සරහටවත් මම දාගත්තෙ නැහැ. ඒ හරියෙත් ඕන තරම් මිනිස්සු ඉල්ලනවා. එහෙම කළේ නැහැ. නමුත් අතන අත්‍යවශ්‍ය තැනක් නිසා තමයි එතනට ඒ බල්බ් එක දැම්මෙ.දැම්මහම අපි දැම්ම නිසා ඒක කඩල දානවනම් ඒ වගේ ඔලුව මන්දං වෙච්ච මිනිස්සු ඉන්න තැනකට බල්බ් එකක් දාල වැඩක් නැහැ. මොකද එහෙම මිනිස්සු ඉන්න තැනකට දාල වැඩක් නැහැ.පොදු ප්‍රශ්යක් කියල ඒ ගොල්ලන්ට ඕන වෙලාවට වයර් දෙක අමුණ ගන්න පුලුවන්. එතකොට ඒක අනිත් මිනිස්සුන්ට ඕන වෙලාවට නැහැ. අපේ පැත්තෙත් වැරදි තියෙන අය ඉන්නවා. සමහර විට සමාජ ගත වුනහම මම මේ කියනදේ වැරදි වෙන්න පුලුවන්. නමුත් සභාපතිතුමනි ඒකට මගේ ගම් ප්‍රදේශයෙන් යම් දෙයක් ආවොත් මම ඒ අයට නම ගම සඳහන් කරල කරපු දේ කියල,මට වෙන කවුරුවත් නෙවෙයි එයාලගෙ ඒ ඉන්න පාක්ෂිකයොම තමයි මට කතා කරල කිව්වේ. මෙන්න මේ කෙනා මේ දේ කරයි කියලා. ඒක නිසා කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ සියලු දෙනාට මම ඇහුවොත් දැනුම් දෙන්නම්.

එලඹෙන 17 හෝ 18 ට නියත වශයෙන්ම ගෝඨාභය රාජපක්ෂ මහතා මේ රටේ ජනාධිපති වෙනවා. කවුරු සිහින මැව්වත්, කවුරු මොනදේ කිව්වත් ඒ දේ සිද්ධ වෙනවා. දැන් මෙතුමන්ල කිව්ව වගේ යෝධ සංවර්ධනයක් කරයි කියනවා. අපි දකින විදිහට නම් යෝධ සංවර්ධනයක් කෙරිල නැහැ. නමුත් යම් සංවර්ධනයක් වෙලා තියෙනවයි කියල මම පිළිගන්නවා. සංවර්ධනයක් කියන්නෙ යටිතල පහසුකම් පැත්තෙන් සංවර්ධනයක් වෙලා තියෙනවා. ආර්ථිකය අතින්නම් නැත්තටම නැති වෙල තියෙනවා.ඒ නිසා අපටත් ඉදිරියෙදි ඊට එහා ගිය වැඩ කොටසක් කරන්න ශක්තිය ධෛර්යය ලැබෙන ජනාධිපති කෙනෙක් ඉදිරියෙදි පත් වෙනවා. ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණට ජය වේවා කියල මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, ඇත්තටම මේ වෙලාවෙ දේශපාලනය ගැන කතා කිරීම නෙවෙයි මෙතන ප්‍රදාන වෙලා තියෙන්නෙ. අපි දේශපාලනය කළත්, මොනව කළත් ලබන මාසෙත් මෙතනදි හමුවෙනවා. ඕකනෙ උත්තරේ. සමහරවිට ඔබතුමාල ජයග්‍රණය කරන්න පුලුවන් .සමහරවිට අපි ජයග්‍රහණය කරන්න පුලුවන්. අපේ පැතුම අපේ ජයග්‍රණය. ඔබතුමාලගෙ පැතුම ඔබතුමාලගෙ ජයග්‍රහණය. ඒ සිතුවිල්ල අසාධාරණ නැහැ. නමුත් බුද්ධ ධර්මය අනුව මම කියනවා. මේ රටේ සාධාරණත්වය ඉෂ්ඨ වෙයි කියලා. ඒක තමයි බුද්ධ ධර්මය අනුව අපි සියලු දෙනා ඉගෙන ගෙන තියෙන්නෙ. ඒක නිසා බය වෙන්න දෙයක් නැහැ. සජිත් මහත්තය 17 වෙනිද දිවුරුම් දෙනවා. ඒක නිසා තමුන්නාන්සෙල මොනව කිව්වත් අපි තරහ නැහැ. ඒකට අපි සතුටු වෙනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ දවස්වල මෙහේ විගණන විමර්ශනයක් කරගෙන යනවද? ඒකට මම ඇතුලත් කරනවා, අද මේ මොහොතෙත් ඒක කෙරෙනවද?එතකොට මේකෙ අපි එදා ආණ්ඩුකාරය ඉදිරියෙ, දැන් මේව අහුවෙන්න ඕන. තමුන්නාන්සෙට නෙවෙයි මේ චෝදනාව එන්නෙ. තව අවුරුදු දෙකකින්,තුනකින් නැත්නම් අවුරුද්දකින් නව සභාපතිවරයෙක් එන්න පුලුවන්. වෙනසක් වෙන්න පුලුවන්. එදා ආණ්ඩුකාරවරය පිළිගත්තා. ඊට පස්සෙ එතන හිටිය ජොෂ්ඨ පළාත් පාලන හා පළාත් සභා ලේකම් වරිය. ඊට පස්සෙ ආණ්ඩුකාර ලේකම් තුමා එතන හිටියා. අපි ප්‍රශ්න කරන කොට ඒ සියලු දෙනාම කිව්ව මේ සභාවට හියුම් පයිප්ප, සමර් හට් ඒ වගේම අනිකුත් දේවල්, ගෙනාවයි කියලා. එහෙම නම් දැනට මෙතන පරීක්ෂණයක් කෙරෙනවා නම් මේව එතනින් නිකුත් කරල තියෙනවා. පැහැදිලිවම මෙහේ පොත් පත්වල තියෙන්න ඕන. ඒ කරුණ මෙහෙන් පැහැදිලිව පෙන්නල දෙන්න. මේවට වුනේ මොකද කියන එක. තව අවුරුදු ගානක් තව ඉස්සරහට මේක ඇදිල ගියොත් මම හිතන්නෙ ඕව නිකන් වලලල දැම්ම වෙනවා.රාජ්‍ය දේපොල,ඉතින් අපි මේක සද්භාවයෙන්වැඩ කළ යුතුයි. ඔබතුමාට ඇඟිල්ල දික් කරනවා නෙවෙයි. ඔබතුමාගෙ කාලෙත් නෙවෙයි.ඒක නිසා අපි නිදහස් විය යුතුයි. මේක කුණු ගොඩ පස්සෙන්ම එනකොට තව කෙනෙක් මේක මෙතනට එන්න පුලුවන්. පරීක්ෂණය නීත්‍යානුකූලව නියමාකාරව කෙරෙනව නම් මේව අපි පෙන්නල දෙන්න ඕන.මේකෙ භාණ්ඩ ගොඩාක් නැතිවෙල තියෙනවා. ඉතින් ඔය මම සාමාන්‍ය සාරාංශයක්,ජෙනි තිබුන.වතුර මෝටර් තිබුන,ඊලගට නොයෙකුත් නොයෙකුත් දේවල් දැන් මට මතකත් නැහැ. මම සටහන් කරගෙන ආවෙත් නැහැ. ඉතිං මේ සියල්ලම සභාව සතු දේපොල තිබුනා. උඩුගම උපකාර්යාලයෙ කොස් ගස්ද,ඇලස්ටෝනියා ගස්ද මේව අස්ථාන ගත වුනා. ඉතින් ඒක නිසා මේව පොත් පත්වල සදහන් වෙලා තියෙන කරුණු නම්,ආණ්ඩකාරවරයෙක් කියන්නෙ ප්‍රදේශයේ ප්‍රධානියා.එතුමා ඒක මෙහේට දුන්නයි කියල පිළිගන්නවා නම්,අමාත්‍යාංශ ලේකම් වරිය ඒක මෙහේට දුන්නයි කියල පිළිගන්නවා නම්,ඒ වගේම කොමසාරිස් වරය හෝ වරිය ඒක මෙහේට දුන්නයි කියල පිළිගන්නවා නම්,අපි පැහැදිලිවම මේවට වුනේ මොකක්ද කියන එක මේ පරීක්ෂණය තුල මම හිතනවා ඊලග සභාව නැත්නම් තව මාස දෙකකින්වත් ඒ පරීක්ෂණයේ ප්‍රතිඵල වෙච්ච දේ මෙහෙමෙයි කියල කියාවි. මම ඒ පිළිබදව මතක් කළේ මේව කල්පැන ගිය දේවල් වුනත් මේව

යටපත් වෙනවා. ඒක තමුන්නාන්සෙට හොදත් නැහැ. අපට හොදත් නැහැ. ඉතිං ඒක නිසා ඒ පිළිබදව මතක් කරනවා.

ඊලගට තමුන්නාන්සෙල දැන් ඔක්කෝම සුදු හුණු ගෑවා. ඒ සුදු හුණු ගෑවත් ඊයෙ දවසෙ මෙතන යම්කිසි සිද්දියක් වෙලා තියෙනවා. මැතිවරණ කොමිශන් එකෙන් මේ සභාවෙන් විමසීමක් කෙරිලා තියෙනවා. නිලධාරි මෙතන ඉන්නවා. නිලධාරින්ටයි විශේෂයෙන් මේ වගකීම එන්නෙ. මම මතක් කරනවා.සභාපතිවරයා යන්න පුලුවන්. අපි මන්ත්‍රීවරු ඊලගට වෙනස් වෙන්න පුලුවන්. නිලධාරීන් හැටියට මේ නිදහස් කිරීමේදි මේ වගකීම තියෙන්න ඕන. ඔබතුමාලගෙ ඒ තිබිච්ච රැස්වීමට අපේ කෘ කැබ් එකෙන් ඔය කූඩාරම් බට ප්‍රවාහනය කරල තියෙනවා. මේකෙ තිබුන යන්ත්‍රෝපකරණ අරගෙන උදේ 6.30 ට එතනට ගිහිල්ල තියෙනවා. උදේ 6.30 වෙන කොට මේකෙ තණකොල කපන මැෂින් අරගෙන, මෙතන සේවකයො තුන් දෙනෙක් එතන සුද්ද කරන්න දාල තියෙනවා. ඊට පස්සෙ මේක පෞද්ගලික පොලක් මේ පොලෙන් මම හිතන්නෙ වර්ෂයකට රුපියල් 500 ක් නැත්නම් 1500 ක් එනවා ඇති. මේක අපි නෙවෙයි පාලනය කරන්නෙ. එදා දවසෙ මේ ස්ථානය සම්පූර්ණයෙන්ම සුද්ද කරලා, අපේ ටිපර් එකෙන් ප්‍රවාහනය කරල තියෙනවා. මැතිවරණ ප්‍රචාරක රැලියක් තියෙන තැනක ඔබතුමාගෙ වගකීම ඊයෙ දවසෙ සිද්ද වෙන්න බැහැ. මමත් එතන හිටියෙ නැහැ. මේ දර්ශන ඔක්කොම වීඩියෝ කරල තියෙනවා. පරීක්ෂණය සමහර විට අනාගතේදි සිද්ද වේවි .නමුත් ඔබතුමා අද නිදහස් වේවි. මම නිලධාරීන්ට කියනවා නිලධාරීන්ට නිදහස් වෙන්න හම්බ වෙන්නෙ නැහැ. 16 වෙනිදයින් පස්සෙ තමුන්නාන්සෙලගෙ බලාපොරොත්තුව ඉෂ්ඨ නොවුනොත්16 වෙනිදයින් පස්සෙ පරීක්ෂණයක් කෙරෙනකොට නිලධාරීන්ටයි මේකෙ වගකියන්න සිද්ද වෙන්නෙ. නිලධාරීන්ගෙ අත්සන තමයි වැදගත් වෙන්නෙ. තමුන්නාන්සෙල අපි නෙවෙයි මේකෙ මේ කෙටි කාලයකට අපි වගකීම භාර අරගෙන තියෙන්නෙ.මම මේ පෙන්වා දුන්නෙ ඒකයි.

ඊලගට ඔබතුමාගෙ කාලෙ තවත් සිද්දියක් වෙල තියෙනව. දිනය 2019.10.20 කොම්පෝස්ට් පොහොර කිලෝ 300 කට ආසන්න ප්‍රමාණයක් අතුරුදහන් වුණ එක ඔබතුමා දන්නවද? සිකුරාදා වැඩට ගිහිල්ලා තියෙනවා. සිකුරාදා කොම්පෝස්ට් පොහොර හදලා, සුදුදා උදේ වැඩට එනකොට කිලෝ 250 ක් 300 ක් අතුරුදහන්. මෙතන කනින් කොනින් ගියා. මම පසුව ඔබතුමාට කියන්නම් කනින් කොනින් ගිය හැටි. මේ මොහොත වෙනකොට TO මහත්තයා, තාක්ෂණ නිලධාරීතුමිය දන්නව ඇති. එතුමාට මේ පනිවිඩය කොහෙන් හරි ලැබිල තියෙනවා. මුරකාරයො දෙන්නෙක් වැඩ කරන තැනක තමයි මේ සිද්දිය වෙලා තියෙන්නෙ. අපි සේවය කරන තැන මේ වගේ අපරාධ මේ ආයතනයේ කෙරෙන්න දෙන්න බැහැ කියන එක TO මහත්තය ප්‍රකාශ කරල තියෙනවා. මම දන්නෙ නැහැ එතනින් එහාට මොනව වුනාද කියන එක. අපි පඩි ගෙවනවා, OT ගෙවනවා, දිවා රාත්‍රී මුර කරුවන්ට ගෙවනවා. මේක තමයි සත්‍ය සිද්ධිය. මේ කතාවෙ තව තියෙනව.මම ඒක මෙතන කියන්න ගියොත් සේවකයන්ටත් ප්‍රශ්නයක් එනවා. ඔය පැත්තෙන්ම තමයි සත්‍යය හෙලිවුනේ. ඒ නිසා ඔබතුමා ඒ අවදානය යොමු කරන්න.අපි දහස් ගණනක් සල්ලි වියදම් කරල OT,බටා ගෙවලා ඒ නිෂ්පාදනය රෑට අතුරුදහන් වෙනවනම් කුමක් කළ යුතුද? කියන එක දැන ගැනීම සදහා තමයි තමුන්නාන්සෙට මේ මතක් කළේ.

ඒ වගේම තව සිද්දියක් තියෙනවා. ඒ සිද්දිය තමුන්නාන්සෙ දන්නවද? කුනු කසල ඉවත් කරන්න මේ වාහනවලට ඩීසල් ගහනකොට, ඉස්සරහ ඩෑස් බෝඩ් එක ගැලෙව්වට පස්සෙ මේකෙ තියෙනවා කිලෝ මීටර් ගාන පෙන්වන වයර් එකක්. සමහර වාහනවල යටින් මේ වයර් එක ගලවන්න පුලුවන්. මම යෝජනා කරනවා. මේ මොහොත වෙන කොට ඔය කුනු අදින වාහනේ මීටරේ වැටෙන්නෙ නැහැ. මීටරේ වැටෙන්නෙ නැහැ කියල මෙහේට පැමිණිලි කරල තියෙනවද? ඒක සාමාන්‍ය දෙයක්. මට දුන්නොත් මට බාස්ල ඕන නැහැ.මම හයි කරල පෙන්නනවා. ඒක නිසා මේක දවසට දුවන කිලෝ මීටර් ගණන දන්නෙ නැහැ. දවසට මෙහෙන් ලියාගෙන යනවා ඩීසල් ගහන්න 65 යි,70 වයි කියලා. එතකොට අපි දුවපු ගාන බැලුවොතින් තල්ගස්වල මේ ටික ඔක්කොම දිව්වත් කිලෝ මීටර්

මම හිතනිනෙ 30 ක් 40 ක් වේවි. එතකොට ඔබතුමා කල්පනා කරන්න. මේ ඩීසල් ලීටර් 65 කොච්චර දුරක් ගෙවල තියද කියන එක. ඊලගට මම මේ සභාවෙ ඇස් දෙකට දැකපු නැති නිසා මම යෝජනා කරන්නෙ නැහැ. මීට පස්සෙ වෙන දේවල් ගැන තමුන්නාන්සෙත් මේව ගැන දැනුමක් තියෙන පුද්ගලයො. මෙතනත් මේ කර්මාන්තයේ නියුතු වාහන තියෙන බහුතරයක් ඉන්නවා. කිලෝ මීටර් මෙච්චරයි කියල අපෙත් වාහනවල ඩ්‍රයිවර්ල මේක ගලවනවා. ගලවල ගියයින් පස්සෙ ඩීසල් ලීටර් 170 ක් පිච්චිලයි මහත්තයො කිච්චහම අපි බලනව මොකද කියලා. බලන කොට මේක පන්නල තියෙන්නෙ පෙන්නන්න බැහැ. එහෙමනම් රාජ්‍ය ආයතනයක් හැටියට පලමුවෙන්ම ඔබතුමා කරන්න ඕන අර තමන්ගෙ T බෙල්ට් එක දාගත්ත වගේම මේව මෙතනින් වවුචරේ ලියල අත්සන් කරල දෙනකොට කොහෙන්ද අද කුනු ගෙනාවෙ, කොච්චර ප්‍රමාණයක් ගෙනාවද? සමාන්‍ය මතයට අපට පුලුවන් උඩුගම නාගොඩ කිලෝ මීටර් ගාන හිතා ගන්න.ඔබතුමා අවදානය යොමු කරන්න 65 හේ 70 වෙ වවුචර් ලියනවා ගහනවද?බොනවද?විකිනෙනවද?කියන එක පිළිබඳව තමුන්නාන්සෙගෙ අවදානය යොමු කරවනවා. අපටත් මේවා පෙන්වා නොදෙන්න තිබුන. කාබාසිනිය වෙල යනකම් බලාගෙන ඉන්න තිබුනා. නමුත් ඒක නෙවෙයි අපේ බලාපොරොත්තුව.මෙතන දවසක් හරි මේ සියලු දෙනාම කීයක හරි දීමනාවක් ගන්නවා.ඒ දීමනාව ගන්න කොට අපේ පව් ගෙවෙන්න ඕන. ඒක නිසා තමින්නාන්සෙලගෙත් ගරු මන්ත්‍රී වරුන්ගෙත් සියලු දෙනාගෙම දේපොල. මේවා නැති වුනොත් අපේ කුනු ටික අරන් යන්නෙ නැහැ. අපේ බල්බ් එක වැටෙන්නෙ නැහැ. මේ සල්ලි ආයතනයෙ නැතෙයි කියනවා.මේව ගසා කෑමක් වෙනවා. ඒක නිසා කාරුණික අවදානය තමුන්නාන්සෙලා, අපි සියලු දෙනාගෙම වගකීමක් තියෙනවා. අන්න ඒක නිසා මේ සියල්ල මතක් කළේ තමුන්නාන්සෙලා, අපේ ඉදිරි ගමන වෙනුවෙන්.

ඒ වගේම අපි සමෘද්ධි සහනාධාරය අපි දුන්නෙ විසි අවුරුද්දක් අපේ මිනිස්සු දුක් විදපු, අපේ මිනිස්සු පෙනිච්ච නැති වෙලාවක සමෘද්ධි කාඩ් තව දෙන්න තියෙනවා. ඒක නිසා අපි කිසි කෙනෙක් දේශපාලන වශයෙන් ඒකට ඇගිලි ගැහුවයි කියන්නෙ නැහැ. විසි අවුරුද්දක් එක්සත් ජතික පාක්ෂිකය සමෘද්ධි නිලධාරියට පෙනුනෙ නැහැ. පැහැදිලිවම මම කියනව දෙපැත්තෙම මේවට ඇගිලි ගහපු කිසි කෙනෙක් නැහැ. විශේෂයෙන්ම සභාපතිවරයා එහෙම නැහැ. මම දන්නවා මොකද දීර්ග කාලයක් ඇසුර සමබන්ධතාවය තියෙන නිසා. ඒ වගේ කුහක දේවල් නොකරන බව.මේ සුදු හුනු ගානවත් නෙවෙයි.

ඊලගට තවත් කණගාටුදායක සිද්ධියක් තියෙනවා. මම හිතුව අපේ ප්‍රියන්තා මන්ත්‍රීතුමිය කතා කරයි කියලා. ඔබතුමියගෙ කොට්ඨාසෙ. අපේ වලකුඹුරෙ කාර්යාලය කඩලදාල තිබුනා. මෙතෙක් අපට ආණ්ඩු බලය රාජ්‍ය බලය තිබුනත් අපි ඒ පාහර තුන්වෙනි පංතියෙ වැඩ කරන්න ගියෙ නැහැ. මම ඔබතුමිය නිදහස් කරල කතා කළේ. තොප්පිය දාගන්නත් එපා. සභාපතිතුමා එතනට ගිහිල්ලත් තියෙනවා. කණගාටුව ප්‍රකාශ කරලත් තියෙනවා. ඉතිං ඒක නිසා අපි මේ දේශපාලනය කළයුත්තෙ, මරණෙට,මගුලට,තොවිලෙට,අඩිතලම්පොලේ,ගෙවදින එකේ, මේ හැම එකේදිම සම්බන්ධ වෙන මිනිස්සුත් එක්ක. මේ මැතිවරණය 16 වෙනිදයින් පස්සෙ ඉවරයි. සජිත් මහත්තය දිනන්න පුලුවන් අපි සජිත් මහත්තය දිනුවයි කියල තමුන්නාන්සෙලාට රිදවනවනම් ඒක නෙවෙයි අපේ දේශපාලනය විය යුත්තෙ. ගෝඨාභය මහත්තය දිනන්න පුලුවන් ඒ දිනුවයි කියලා යූ.එන්.පී.කාරයන්ට රිදවන එක නෙවෙයි දේශපාලනය විය යුත්තෙ. අන්න එදාට අපි මේ සභාවෙ එකට එකතු වෙලා ප්‍රදේශයේ සාමය ආරක්ෂා කරන්න ඕන. අන්න ඒ වගකීම අපි දෙගොල්ලම ගන්න ඕන. එහෙම නැත්නම මේ සභවෙ ඇවිල්ල අපි දිනුවා කියල මෙතන රතිඤ්ඤ පත්තු කරල දාල එහෙම කරන්න පුලුවන්. ඒ දේ නෙවෙයි සිද්ද විය යුත්තෙ. ඒ දේ නතර වෙනවා අපි ප්‍රදේශයේ ප්‍රධාන පුරවැසියා ඇතුලු කණ්ඩායම ආදර්ශමත් විය යුතුයි කියන එක තමයි මම තමුන්නාන්සෙලාට මතක්කරන්නෙ.

මේ මන්ත්‍රීවරු මන්ත්‍රීවරියො දැන් කිච්චා. විශේෂයෙන්ම අපිනම් වීථි ලාම්පු ඉල්ලන්නෙ නැහැ. ඇත්තටම ඔය තියෙන එලියෙන් වැඩ කර ගන්නවා. නමුත් මෙතන ඒ වීථි ලාම්පු කියන එකේ හරිදේ

කියවුනේ නැහැ. බල්බ් එකක් දැම්මට කමක් නැහැ. දේශපාලන කාර්යාලයේ ආරක්‍ෂාව තියෙන්න ඕන. නමුත් අලුතින් සෙට් එකක් හයිකරනවනම්, එතන අල්ලසක් දීමේ ලකුණු දකිනවා. ඊලගට මම තමුන්නාන්සෙට යෝජනා කරනව. පොත් පත් අරගෙන බලන්න පිච්චිච්ච බල්බ් ආපහු සති කීයකින් මෙතනට එනවද? ආපහු අපි මේක අලුත් කරනවද? අපි කොච්චර මේකට වැය කරනවද කියල. බාල බල්බ් එක දැම්මට පස්සෙ සති දෙකකින් පිච්චෙනවා. ඊලග රවුම ගලවගෙන එනවා. සතියක් ඇතුලත ආයෙ රවුමක් යනවා. සේවකයො දෙන්නෙක්, රියදුරෙක්,වාහනයක් වැඩ කරනව.ඊලගට තෙල් යනවා, ටයර්,ඇන්ජින් ගෙවෙනව පඩි දෙනවා, OT දෙනවා. මෙන්න මේ බාල බඩුවෙ හිලක් තියෙන නිසා. අපි T බෙල්ට් එකට කිව්ව වගේ ගාන නෙවෙයි මෙතනට පරීක්‍ෂණය විය යුත්තෙ. හොඳ දෙයක් දැම්මොත් හය මාසයකට සැරයක් ගලවන්න වෙන්නෙ. එතකොට බලන්න අද,අපේ කාලෙත් මේ වගේම තිබුනා. එතකොට මේ කොනේ දාන කොට මේ කොනේ පිච්චිලා. මේක විය යුත්තේ අඩුම ගානෙ මාස තුන හතරක්වත් තියෙන්න ඕන. මේකෙ හිටපු සභාපති වරයෙක් ඉන්නව එතුමත් දන්නවා. ඇති. එතකොට අපට වෙන්නෙ ඒ බල්බ් එකේ පාඩුව විතරක් නෙවෙයි. බල්බ් ආපහු එන්න පුලුවන් ගණන් හදල බලන්න මෙහේ අපි කීයක් වැය කරනවද බල්බ් එකක් හයි කරන්න. අන්න එතනයි අපේ හිඩස තියෙන තැන වහගන්න. මේව අතහැරල දාලා අපට ඕනනම් කතා නොකර ඉන්න තිබුනා.ඒත් මේව දකිනකොට කතා කරන්න හිතෙනවා.

ඒවගේම මම තමුන්නාන්සෙලගෙ කාලය ගන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මේ කියපු කරුණු සියල්ලම සැලකිල්ලට ගෙන හෙට දවසේ නිවැරදි කර ගැනීමට හැකියාව තියෙනවා. සභාපතිවරයා හෝ මන්ත්‍රීවරු පමණක් නොව මේකෙ වගකීම ඇත්තෙ. අදාල නිලධාරීන් සියලු දෙනාම රථවාහන,ගබඩාව,පොත් පත් බලන. මේ සෑම නිලධාරියෙක්ම මේවා හරියට අධීක්‍ෂණය කළොත් නැත්නම් කිලෝමීටර් තුන් හාරසීයක් දැන් මාස ගානක් වෙනවා. සභාපතිතුමා වෙන කිසිම නිලධාරියෙක් මේ දිහා බැලුවෙ නැහැ. නමුත් මේක අපට පාරෙ යන මිනිස්සු කියනව මහත්තයො මෙන්න මෙහෙමයි ටැංකිවල හිලක් තියෙනවද කියලා. ඒක නිසා මේ දේවල් වහගත්තොත් මේ කතා කරන අපටත් බල්බ් එකක් කියල ඉල්ලල දාගන්න පුලුවන්. ඔන්න ඉතිරිය කියල අපට කියන්න පුලුවන්. අපි මේ කතා කරන්නෙ, ඉතුරු කරල දෙන්න. ඒක නිසා මේක පෙන්නල දුන්නෙ මේ හිඩැස් ටික වහගන්න.කොම්පෝස්ට් හැදුවත්, කුනු ඇද්දත්, සේවකයො දාස් ගානක් ගත්තත්, හිඩස වැහුවෙ නැත්නම් අපි යන ගමන අසාර්ථකයි කියන එක මම කියමින් තමුන්නාන්සෙල සියලුදෙනාටම දේශපාලන වශයෙන් අන්තිම පාරටත් පොඩ්ඩක් ඉතිං පනිවිඩයක් දෙන්න ඕන. එයාල හිතාගෙන ඉන්නවා ගෝඨාභය මහත්තය දිනුවයි කියලා. ඒක හොඳයි සතුටුයි. අද මේ මොහොත වෙන කොට පොරොන්දුවක් දීල ඉවරයි. සියලුම පෙරපාසල් එතුමා පවරගෙන ඒ කියන්නෙ රජයට අරගෙන ඒ සම්පූර්ණ කටයුතු කරනවයි කියලා. එතකොට පෞද්ගලිකව ඔය පෙත්සම් අපට එන්නෙ නැහැ. මම කාන්තාවන් ගැන කියන්නෙ නැහැ.නමුත් ඒකෙ මම කියනව අපි සේරම අම්මාවරුන්ගෙන් බිහි වෙච්ච දරුවො. මම කියනව ඒ පිළිබඳව අපට නංගිල,දූවරු,අක්කල ඉන්නවා.මේ සියලු දෙනාට සාමාන්‍ය සිද්දියක් මේක.මේක මහා ලොකුවට දේශපාලන වේදිකාවල කියනවා. මේව නොවෙච්ච අය ඉන්නව වගේ එහෙම නම් නෙලුම් මලෙන් පහල වෙල සුරංගනාවියො ලෝකෙ නැහැයි කියලා කතාවෙ අහල තියෙනවා. නමුත් අද මේ ලෝකෙ පලවෙනි සෞඛ්‍ය ප්‍රශ්නයත් ඕක තමයි.ඔය ආරක්‍ෂාව තමයි ඒක නිසා සමහර රටවල් සජිත් ප්‍රේමදාස මහත්තයට ස්තූති කරල තියෙනවා. දකින්න ඇති තමුන්නාන්සෙල ඒක දන්න රටවල් තියෙනවා. ඒක නිසා අම්මාවරුනේ එහෙම නැත්නම් සහෝදරියනේ මේක කවුරු හරි අපහසුතාවයට පත් කරනවනම් ඒක මුලු කාන්තා පරපුරටම කරන ලොකු අගෞරවයක්. මම හිතනව මේ දේ කිසි කෙනෙක් අපිවත් දැක්කෙ නැහැ.මේ දේ සජිත් මහත්තය හරියට දැක්කා. මේ දේ තමයි කළ යුතුයි කියල ඒ ගැන ස්තුතියි. ඒ විකරක් නෙවෙයි ගරු මන්ත්‍රීවරුනි ගරු සභාපත්තුමනි අද මේ මොහොත වෙනකොට නාගොඩ කුරුපනාවෙත් චෛත්‍යයක් ඉදිවෙමින් තියෙනවා. ඉතිං ඒක නිසා කිසි බයක් සැකක් අපි ගාව නැහැ. තමුන්නාන්සෙල සුදු වැන් කතා කිව්වා. මම ඒව කියන්නෙ නැහැ. ඒව

මෙතනට අවශ්‍ය නැහැ. ඒව අවශ්‍ය වේදිකාවට. ඒව මම වේදිකාවෙදි කතා කරන්නෙ. ඒ නිසා මොනව වුනත් රටේත් ජනතාවගේත් සියලු බෞද්ධයාගේත් යහපත උදෙසා හෙට දවසේ 17 වෙනිදා සජිත් ප්‍රේමදාස මහත්තය මේ රටේ ජනාධිපති වෙලා අපේ සහෝදරත්වයෙන් මේ වැඩකොටස් ඉදිරියට අරගෙන යනවයි කියන එකත්, කිසිම හානියක් සභාවට වෙන්නෙ නැහැයි කියන එකත් අපි බොහොම මනුස්සත්වයෙන් මතක් කරමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමනි, අවසරයි. මම මේ කාර්යාලය පිළිබදව කතා කරන කොට ඇත්තටම ඒ කාර්යාලෙ කඩපු තැනට ගියා. මන්ත්‍රීතුමා ඒකත් වරදි ක්‍රියාවක් හැටියට, මම ඒක ඇත්තටම හෙලා දකිනවා. හැබැයි මෙතනට කාර්යාලය පිළිබද අවශ්‍යතාවයක් නැති නිසා මම කිව්වෙ නැහැ. නමුත් ඊට දවස් දෙකකට උඩදි ඒ කාර්යාලෙ තිබුන සියලුම කොටස් තැනින් තැන ගිහින් තියල තිබුනා.මට ඒක දැක්කම හරි හිනහයි.මම වටපිට බලන කොට මේකෙ කැලි ටික නැහැ.පැය භාගයක් ඇතුලත මගේ කාර්යාලය තිබුනටත් වඩා හොදට මම නැවත වතාවක් නිර්මාණය කළා. ඉතිං අපේ විජේතිලක අයියා එතන හිටියා ඒ අවස්ථාවෙ මම එතුමට කිව්වා අයියෙ ඕක ඔබතුමා තිබුනටත් වඩා හොදට හදන්නෙයි කියලා. ඇත්තටම දේශපාලන ක්‍රමවේදය තුල ඒ පිළිබදව අපි හෙලා දකිනවා.

කාන්තාවන් පිළිබද කතා කරන කොට ඇත්තටම කාන්තාවො පිළිබද වැඩිපුර කතා කරන්නෙ 52% කට වැඩි ප්‍රතිශතයක් කාන්තා ප්‍රතිශතය තියෙනවා. ඒ නිසා සජිත් මහත්තයා වැඩිපුර කතා බහට ලක් කරල තියෙනවා. ඒ පිළිබදව අපි සතුටු වෙනවා. මෙතන වෙලා තියෙන්නෙ කාන්තාවො ගැන කතා කිරීම තුල කතා කිරීම පිළිබද පොඩි ප්‍රශ්නයක් තියෙනවා. එතුමා ඉස්සෙල්ල කිව්ව රට රට ගෙවල්වලට යන කතන්දර, ඊට පස්සෙ අර හඳුනා ගත්තු දෙයක් තමයි දැන් අර එතුමා දෙන්න හැදුවෙ. එතුමා රට ගිහිල්ල හදුනා ගත්තු අඩුපාඩුව තමයි එතුමා දෙන්න ලැහැස්ති වුනේ.ඒ නිසා ඒ ගැන අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි සතුටු වෙනවා රට ගිහින් හරි ඒක හඳුනාගෙන ඒ දේ දෙන එක පිළිබදව. ස්තූතියි.

**ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා**

ගරු සභාපතිතුමනි, උනන්විටියෙ සති පොල ගැන මම යමක් කතා කරන්න කැමතියි. ඒක ඉඩකඩ මදි නිසත්, සති පොලට මාසකෝරාල මෙනවියගේ ලිදෙන් ජලය ගන්න අවසරය දීල තියෙනවා. තවම ඒ ගැන ක්‍රියා කරලා නැති බව මේ සභාවට කණගාටුවෙන් දන්වා සිටිනවා.

ඒ වගේම අපේ ප්‍රදේශයේ ආරලිය මාර්ගය ඉතාම අබලන් වෙලා තියෙනවා. ඒ දෙපස සුද්ද කරල දෙන්න කියලත් මම මේ අවස්ථාවෙ ඉල්ලා සිටිනවා. ලෙහුවල කන්දෙත් ඒ වගේ. ඊරි ඇල පාරත් අපි සුද්ද කළා. ඒ වගේම මේ මාර්ගවල දෙපස කම්කරුවන් යොදවා සුද්ද කරන්න කියල මම යොජනා කරනවා.

අපි හැමෝම කතා කළත්, දේශපාලනය කවුරු දිනුවත්, පැරදුනත් අපට ප්‍රශ්නයක් නැහැ.අපේ රට ගොඩ නැගීමේ විශාල මෙහෙයක් ඉටු කිරීමට තමයි කවුරුත් ඉදිරිපත් වෙලා ඉන්නෙ. අපට ගෝඨාභය මහත්තය දිනුවොත් අපට විශාල වැඩකොටසක් අපේ ගමේ කරන්න පුලුවන් වෙනවා.

ඒ වගේම මේ රජයෙන් කොහොමත් අපේ මංමාවත් ටිකක් පිළිසකර වෙලා තියෙනවා. ඒ ගැන අපේ ගරු මන්ත්‍රීතුමන්ලට බොහොම ස්තූති වන්ත වෙනවා. එතුමන්ල තමයි ඒව කරල දුන්නෙ. නමුත් ඒවට වීථි ලාම්පු දැම්මෙ මම. එම නිසා පාර දිහා බලන්නෙ නැතුව වීථි ලාම්පුවේ එළිය දැකල අපි පස්සෙන් ජනතාව අපිත් එක්ක එනවා කියන එක මේ අවස්ථාවෙදි මම මතක් කරන්න ඕන.

ඒ වගේම වාද විවාද වලින් අපට වැඩක් නැහැ. අපේ ගම හදන්න රට හදන්න අපි දැන් ඉදිරිපත් වෙලා ඉන්නවා. අපේ ගමේ සියලු දෙනාම ගෝඨාභය රාජපක්ෂ මහත්තයා වටේ ගොනු වෙලා තියෙනවා.

ලබන පෝයට මම ආරාධනා කරනවා මේ සියලු දෙනාටම පොහොට්ටුත් අරගෙන අපි යමු පන්සල් කියලා. ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. කියන්න කැමතියි. දෙපැත්තෙම කාර්යාල කඩපු ඒව ගැන දෙපැත්තෙම කට්ටිය කතා කළා. අපි ඒවා හෙලා දැක්කා. කියන්න කැමතියි අපේ විපක්ෂ නායකතුමා ඔබතුමාලගෙ පාක්ෂිකයො පෞද්ගලිකව දේශපාලන පලිගැනීම් ගන්න මේ වෙන කොට වැඩකටයුතු සූදානම් කරල තියෙනවා. ඒ පිළිබඳව අපේ මන්ත්‍රීවරු දන්නවා. නම් ගම් වශයෙන් මෙතන සඳහන් කරන්න මම කැමති නැහැ. නම් ගම් සඳහන් නොකළත් ඒ ඔබතුමාලගෙ පාක්ෂිකයො කියන්න හොඳටම දන්නවා.

එතකොට අපේ වනමල් මන්ත්‍රීතුමා මාර්ග සංවර්ධනය ගැන කතා කළා. කරපු දේවල් තියෙනවා මන්ත්‍රීතුමා. මාපලගම හොරංගල්ල මාර්ගය ලක්ෂ 971 ක් වියදම් කරල හදන්න පටන් ගතිපු මාර්ගය නතර වෙලා දැන් මාස ගානක් වෙනවා. දැන් හදපු තැන්වලට වඩා හදපු නැති තැන්වල ගමන් කිරීමට බැරි තත්වයක් උදා වෙලා තියෙනවා. ඒ පිළිබඳ ඔබතුමා කතා කළේ නැහැ. එතකොට උඩවැලිවිටිය ගම්මැද්දෙගොඩ මාර්ගය තනි බෝක්කුවකින් වතුර බැහැපු එකේ බෝක්කුව අයින් කරලා. ලෙඩෙක් මේ පැත්තට අරගෙන එන්න ඕන උස්ස ගෙන. වාහනයක් යන්න බැරි තත්වෙට පත් කරල වැවක් මැද ජැටියක් ගහනව වගේ තත්වෙකට දැන් පත් කරල තියෙනවා. ඒ පිළිබඳව ඔබතුමාල කතා කළේ නැහැ. හදපු දේවල් ගැන, නාගොඩ රාජකීය ජාතික පාසල ගැන කතා කළා. මහින්දෝදය විද්‍යාගාරය හදල විවෘත්ත කරන්න තිබුන එක ඔබතුමාල රිබන් එක කපල විවෘත්ත කළා. පොඩි වැඩ කොටසක් කරලා තියෙනවා. පොඩි වැඩ කොටසක් කළේ නැහැ කියන්නෙ නැහැ. ඔබතුමාලගෙ මුල් අවදියේ අනුන්ගෙ දරුවන්ට උප්පැන්න දුන්නා වගේ වැඩ කළා. මහින්ද මහත්තයගෙ ආණ්ඩුවෙන් පාස් කරපු සල්ලි වලින් හදපු පාරවල්, ඔබතුමාලා ඒව විවෘත්ත කරගෙන ගියා.

එතකොට ඔබතුමා විදුලිය ගැන කතා කළා. තල්ගස්වල වත්තට, මැතිවරණයක් ගැසට් කරල තියෙන වෙලාවක අලුතින් විදුලිය දීපු එක ඔබතුමා හෙලාදැක්කා. සමෘද්ධි සහනාධාර අයදුම්පත් ගෙයින් ගෙට බෙදාගෙන යන එක ඇයි ඔබතුමාල කතා කරන්නෙ නැත්තෙ. අද වෙනකොට 60% සමෘද්ධිය දීල තියෙනවයි කිව්වා. තව 40% ක් දෙන්න තියෙනවයි කිව්වා. මැතිවරණය ගැසට් කරල තියෙන මේ වෙලාවෙද ඒ 40% දෙන්න මතක් වුනේ. මැතිවරණ කාලෙ දෙන්න බැහැ. ඒ වුනාට දැන් දෙනවා. මැතිවරණ එකට දැනුම් දුන්නම, මැතිවරණ එකෙන් කියන්නෙ, බෙදන වෙලාවෙ අපට අල්ලල දෙන්න කියලා. මෙන්න හංසයා කතිරෙ දාල අයදුම් පත් දැන් ගෙයින් ගෙට බෙදාගෙන යනවා. ඇයි ඔබතුමාල ඒව දකින්නෙ නැත්තෙ.

ඒ වගේම තමයි ඉනෝකා මන්ත්‍රීතුමිය, අර පාලම පිළිබඳව එතන වාහනයක් යන්න බැරි තත්වෙට පත්වෙලා තියෙනවා. ඔබතුමිය ඒකට ක්‍රියා මාර්ගයක් ගන්නව නම් හොඳයි. ඒකෙ වැඩ භාර ගතිපු කෙනාට කියලා එතන මාර්ගයෙ ත්‍රීවිල් එකක්වත් යන්න පුලුවන් තත්වෙට පත්කරල දෙනව නම් හොඳයි. පොඩි බෝක්කුවක් දාන්න ගිහිල්ල දැන් වැවක් මැද දානව වගේ සිද්දියක් එතන වෙලා තියෙන්නෙ. කෙනෙකුට යන්න බැහැ. ත්‍රීවිල් එකක් යන්න පුලුවන් තත්වෙට පත්කරල දෙනව නම් හොඳයි. ලෙඩෙක් අරන් යන්න පුලුවන් තත්වෙකටවත්.

ඒ වගේම තමයි නොවැම්බර් 16 යෙන් පස්සෙ නියත ජනපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවක් සමග එක්වීමේ බලාපොරොත්තුවෙන් නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, අපේ සුභාෂි මන්ත්‍රීතුමිය කියපු එකට පොඩි උත්තරයක් දෙන්න ඕන. මොකද එතුමිය සඳහන් කළා. ගම්මැද්දෙගොඩ හොරංගල්ල මාපලගම මාර්ගයේ වැඩ නතර වෙලයි කියලා. ඇත්තටම තමුන්නාන්සේලා දන්නවා. ඔය මාර්ගයෙ මීට මාස 08 කට වගේ එහා ගිහිල්ල තමයි වැඩ නිම කරන්න තිබුනෙ. නමුත් ඒ කරපු කොන්ත්‍රාත්කරුගේ යම් වැරදි සංවර්ධන න්‍යාය නිසා ඒකෙ යම් තාක්‍ෂණ දෝශයක් නිසා තමයි වැඩ නැවතිල තියෙන්නෙ. හැබැයි ඔබතුමියල සතුටු වෙන්න ඕන. මොකද 2015 වේ ජනවාරි 08 වෙනිදට ඉස්සෙල්ලා තමුන්නාන්සෙල දන්නවා. ගම්මැද්දෙගොඩ අපේ පඤ්ඤාලෝක පණ්ඩිත හාමුදුරුවො කිව්ව වගේ, ඔය පාරෙ ඒ කාලෙ හිටපු දේශපාලඥයින්ට මේ මාර්ගය හදල දෙන්න කියලා කොච්චර ඇවිටිලි කළාද. හැබැයි ඒ කාලෙ කවුරුවත් දැන් ඔය කිඹුල් කඳුළු හෙලන කට්ටිය ඒ ආණ්ඩුවෙ හිටපු නායකයින්ට, කොට්ඨාසෙ ඉදපු ඇමතිවරුන්ට මන්ත්‍රීවරුන්ට චෝදනා කළේ නැහැ. චෝදනා කළත් ඒ වැඩේ කළේ නැහැ. මම හිතන්නෙ මේ වෙලාවෙ කොහොම හරි දැන් වැඩි හරිය මේ කටයුතු සිද්ද කරලා තියෙනවා. ඉදිරි මාස කීපයෙදි ඉතිරි වැඩ කොටසත් අවසන් වේවි.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමනි, ආස හිතෙනව කතා කරන්න. මොකද ඉන්න හිතෙන රටක් නිර්මාණය වෙලා ඉස්සරහට අරන් දෙනවා. මම මන්ත්‍රීවරු කාගෙන්වත් අවසර නොගත්තට සවන් දෙන සියලු දෙනාගෙන් අවසරයි. මීට වසර හතරහමාරකට කලින් මම හොඳ ගොවියෙක් වශයෙන් මගේ ගෙදර කාමර දෙකක වී පුරවල තිබුනා.ඒ වී කාමර දෙක පිරෙව්වෙ මගේ ගම් ප්‍රදේශයේ කුඹුරු අස්වද්දලා. මම මේ නාගොඩ ප්‍රදේශයේ සංවර්ධන කමිටුවෙ, ගොවි කමිටුවෙ සභාපතිවරයා වශයෙන් මේ ප්‍රදේශයේ ඉහල අස්වැන්නක් ලබාදීපු කාල පරාස තිබුනා. ඒ කාල වලදි මම අලුත් සහල් මංගල්ල කරල මේ ගම් ප්‍රදේශයේ සියලු දෙනාට ඒ ගොවි කමට, ගොවි දැතට ශක්තිය දීල වැඩ කටයුතු කරගෙන යද්දි, පහුගිය කාලෙ අපට අවශ්‍ය කරන බෙහෙත් ටික නැති වුනා . ඒ කාල පරාසයේ තිබුනෙ සමහර විට විස බෙහෙත් එකක් වෙන්න පුලුවන්. වස විසෙන් තොර ආහාර නිශ්පාදනය අපෙත් තිබුනා. කාබනික පොහොර වලට යන්න ඕන කමක් අපට තිබුනා. හැබැයි අපි ඒක කරගෙන ආවෙ ක්‍රමාණුකූලව. මේක එක පාරටම පොල්ලෙන් ගහන්න වගේ පොහොර ටික නැති කළා. රසායනික බෙහෙත් වර්ග නැති කළා. කම්කරු ශ්‍රමය අපට අහිමි වේගෙන යන කලෙක කම්කරුවන්ගෙ ශ්‍රමය ලබාගැනීමට අවශ්‍ය කරන මුදල් වැඩිපුර යන කාලෙක, අපි කුඹුරු ගොවිතැන කරගෙන ගියෙ. පුරන් වෙච්ච කුඹුරු වගේම ඒ කුඹුරුවලට අවශ්‍ය කරන ඒ බෙහෙත් ලබාදීලා, ඒ කුඹුරු අපි සක්‍රීය කරගෙන ගියා. ඒ නිසා තමයි මත්තල ගුවන් යානා බස්සන්න හදපු ගුවන් තොටුපොලේ වී ගබඩාවක් කළේ. ඒ තරම් මේ ලංකාව මේ රට සක්‍රිය වෙලා තිබුනා. කුඹුරු ආර්ථිකය ගොඩ නැගිල කිසිම අගහිගයක් තිබුනෙ නැහැ. ගොවි මහත්තුරුන්ගෙ අතේ මිටේ සල්ලි. හැබැයි ඔබතුමන්ලට පිං සිද්ද වෙන්න මට මතකයි. මංගල සමරවීර අමාත්‍යවරයා කියනවා. මේ වගේම කෘෂි කර්මාන්තය කරන තවත් රටවල් තියෙනවා. අපට අවශ්‍ය ආහාර ඒවයින් අපි ගෙනැල්ල දෙන්නම් කිව්වා. ඒක නෙවෙයි අපේ රජය තුල කළේ. අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙ මූලික දැක්ම තිබුනෙ, බැසිල් රාජපක්ෂ මැතිතුමාගෙ ඒ සංවර්ධන සැලැස්ම තිබුනෙ, ආරක්ෂ සැලැස්ම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙ තිබුනෙ. මේ රටට අවශ්‍ය දේ තමයි 2015 වනවිට ඒ සියල්ල විනාශ කරලා කෘෂි කර්මාන්තය නැත්තටම නැති කළා. අද ගම්මිරිස් කිලෝ එක කීයට ගිහිල්ලද කියල ඔබතුමාල දන්නවා. මගේ ගෙදර තියෙනවා ගම්මිරිස් කිලෝ 400 ක් විතර. විකුනන්නෙ නැහැ. මොකද මට කඩපු අත්තම්වලට යන වියදම උපද්ද ගන්නනම් අඩුගානෙ ගම්මිරිස් කිලෝ එක රුපියල් 700 ට වත් දෙන්න ඕන. නැත්නම් මම ඒ කරපු වියදම් වලින් මට ලාභයක් නැහැ. ඒක නිසා මම අද පසුතැවෙනවා. තව මාස දෙකකින් ඒ ගම්මිරිස් ටික විකුණනවයි කියන එක මේ මහා සභාවෙ මම ප්‍රසිද්දියෙ කියනවා. එතකන් මම ගෙදර අටුවේ තැන්පත් කරල තියෙනවා. අද වෙනකොට මම කඩෙන් හාල් කනවා. මම මීට පස්සෙ මගේ දරුවන්ට කඩෙන් හාල් ගෙනැල්ල නේනෙ නැහැ. තව

මාස තුනකට පස්සෙ අපි කුඹුරු අස්වද්දල පොහොර ටික ලබාදීල මේ රටේ අවශ්‍ය කරන ගොවි මහත්තුරුන්ට ඒ කටයුතු සිද්ද කරනවයි කියන එක මේ සභාවෙ ප්‍රසිද්දියෙ මම කියනවා. මොකද අපි ලබන 17 වෙනිදයින් පස්සෙ ප්‍රාදේශීය සභාව අපේ වගේම අපේම රජයක් යටතෙ. අපි මේ සියලු සංවර්ධන කටයුතු කරන්න. මම බලාපොරොත්තු වෙනවා.ඒ පිළබඳත් මම සිහිපත් කරනවා.

ඒ වගේම තේ කර්මාන්තය ගැනත් මට කියන්න පුලුවන් ගොඩක් දේවල්. තවම දලු සල්ලි ටික ගෙවා ගන්න විදිහක් නැහැ. ෆැක්ට්‍රිවලට දෙන්න සල්ලි නැහැ. මොකද සේල් එකට ගිහිපු තේ ටික ඒක විකුනල ඉවර වෙනකම්ම සල්ලි නැහැ. ඒ තරම් අවිස්වාසයක් තියෙන්නෙ. මේ තේ ටික ගිහිල්ල මේ රටට නැවත සල්ලි ඒද කියන එකත් අන් ෂුවර්.මොකද ඒ තත්වෙට පත්වෙල තියෙන්නෙ. මේ රටේ මුදල් ගනුදෙනුව. මම වෙනද 10 වෙනිදා වෙන්න කලියෙන් දළු බිල ගෙවනවා. නමුත් මට අද වෙනකොටත් බිල ගෙවා ගන්න බැරි තත්වෙට පත්වෙල තියෙනවා. මොකද අවශ්‍ය කරන මුදල් මට තාම ෆැක්ටරියෙන් ලැබුනෙ නැහැ. ඉතින් ඒ වගේ තව කතා කරන්න ගියොත් මෙතන ඒ අවුරුදු හතරහමාරෙ වෙච්ච සංවර්ධය කියන්න පුලුවන්.

හැබැයි අපේ ගරු වසන්ත මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. කෝටි හතරකට ආසන්න මුදලක් අපේ පරණතානායම්ගොඩ කොට්ඨාසෙ සංවර්ධනය කරල තියෙනවා කියලා. එහෙම කරලනම් හරි සතුටුයි. හැබැයි මම දකින විදිහට කිසිම දෙයක් එහෙම වෙලා නැහැ. පාරවල් නම් කීපයක් හදල තියෙනවා. හැබැයි ඔබතුමා පොඩ්ඩක් හිතන්න දැන් අර ගෝල්ලගොඩ පාර ගැන කතා කළා වගේ.මේ ගාල්ල මාපලගම පාරත් ඔබතුමාලද හැදුවෙ. හැම තැනම එකපාරට පාරවල් ටික හදල දෙන්න බැහැ. තේරුම් ගතයුතුයි. අපේ මේ කට තිබුන පලියට කැගහල වැඩක් නැහැ. මේ ලංකාවෙ කොච්චර පාරවල් හදන්නද? යුද්ධයත් එක්ක අසීරු වෙච්ච පළාත් සංවර්ධනය කළා. පහුගිය කාලෙ 2005 අපේ අති ගරු ජනාධිපතිතුමා රට භාර ගනිද්දි මහා කුරිරු යුද්ධයක් ඒ යුද්ධය අවසන් කළා. යුද්ධය අවසන් කරලා ඒ ප්‍රදේශ සංවර්ධනය කළා. මොකද නැත්නම් තවත් යුද්ධයක් ඇති වෙනවා. ඒ ප්‍රදේශ සංවර්ධනය කරලා, ඒ මිනිස්සුන්ගෙ යටිතල පහසුකම් සියල්ල සම්පූර්ණ කෙරුවට පස්සෙ තමයි දකුණට සංවර්ධනය ගෙනාවෙ. දකුණට ගෙනාපු සංවර්ධනයත් ඔබතුමන්ල විකුනලා ඉවරයි. මොකද මේ ගිංගඟ යෝජනා ක්‍රමය තුල ලංකාවෙ වතුර ටික විකුණන්න තමයි තිබුනෙ. ලංකාවෙ වතුර කොච්චර නිකන් මුහුදට ගලා බසිනවද? ඒ වතුර ටික විකුණන්න හම්බන්තොට වරාය ඉදි කළේ. නමුත් අද වෙන කොට ඒ වරාය චීනෙට දීල ඉවරයි. ඒක ඔබතුන්ලගෙ රජය විසින් කරපු ලොකුම සංවර්ධනය. මම කින්නෙ ඒකයි. මොකද ඒව තිබුන නම් ඒව නිර්මාණය කරගෙන අපේ ජනාධිපතිතුමාගෙ යම් කිසි සැලැස්මක් ආවා. දීර්ග කාලීනව ඒ සැලැස්ම තුල මේ රට සංවර්ධනය කරන්නෙ කෙසේද කියන එක එතුමාගෙ හිතේ තිබුනෙ. අන්න ඒක තමයි එතුමන්ගෙ සහෝදර ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගෙ දැක්ම තුල අපි ඉදිරියට ඒ කටයුතු කරනවා.

හම්බන්තොට දිස්ත්‍රික්කෙ පාරවල් හැදුවා. ගාලු දිස්ත්‍රික්කෙත් නෙළුවට යන පාර තිබුනෙ නැහැ. අපේ ගල්වානට යන පාර ඔය විදිහට තිබුනෙ නැහැ. ගාල්ල මාපලගම පාර, උඩුගම පාර මේ විදිහට තිබුනෙ නැහැ. ඔබතුමාට දහඅට වංගුවෙ ගියානම් බලා ගන්න තිබුනා. ඒ පාර කොහොමද හදල දුන්නෙ කියලා. ඒව හදාගෙන ආවා. මේ එක පාරට ගෝල්ලගොඩ පාර හදන්න යන්න බැහැ. එක පාරට මේ අර කන්ද උඩට යන්න ගල් කන්ද හදන්න බැහැ. ඒව හදන්න ක්‍රමානුකූලව ප්‍රධාන අවශ්‍යතාවය තුල සංවර්ධනය කරගෙන ඇවිල්ල අවශ්‍ය කරන පාරවල් ටික ටික හදල දෙන්න එතුමගෙ ලොකු දැක්මක් තිබුනා. ඉතිං ඒක නිසා ඒ කටයුතු වලදි ඔබතුමන්ල මේ අර පාර හැදුවයි.මේපාර හැදුවෙ අපි කියල කැකෝ ගහන්න අවශ්‍ය වෙන්නෙ නැහැ.මමත් කියන්නෙ රටක සංවර්ධනය අනිවාර්යයෙන් පවතින රජය විසින් කළ යුතුයි. හැබැයි ඒව කුමානුකූලව කරගෙන කිසිම අඩුපාඩුවක් නැතුව අපේ රජය ඉස්සරහට ආවා. එහෙමනම් ඉදිරියටත් අපි ඒ කටයුතු කරනවයි කියල සිහිපත් කරනවා. ඒවගේ ගොඩක් කතා කරන්න පුලුවන් ඕව ගැන. ඉතිං මම හැමෝටම සිහිපත් කරන්නෙ අපේ මාලිමාවෙ මහත්තයටත් එක්ක. ඔබතුමාල ගැන මට පොඩි අවුලක්

තියෙනවා. ඔබතුමාලට කවුද කිව්වෙ සීනුවෙන් ඡන්දය ඉල්ලන්න එපා කියලා. මට දුක හිතුනෙ මොකද දන්නවද අවුරුදු ගානක් මමත් උදවු කරපු පක්ෂයක් හැටියට අවුරුදු ගානක් අරන් ආපු ඒ ලාංඡනය නැතුව, ඒ ලාංඡනය තමයි මිනිස්සුගෙ ඔලුවෙ තියෙන්නෙ. ඒ ලාංඡනෙන් ඉල්ලන්න බැරි වෙච්ච තව කට්ටිය ඉන්නවා. ඔබතුමාල නම් විද්වත් මණ්ඩලයක්නෙ. දැන් තවත් පක්ෂෙකට තියෙන ප්‍රශ්නය තමයි උඩහ පළාත්වල කට්ටිය විරුද්ධ වුනා ඒ ලාංඡනයෙන් ඉල්ලන්න. හැබැයි මට තියෙන ප්‍රශ්නය ඒක නෙවෙයි. මේ රටේ ප්‍රධාන පක්ෂයක් වෙලා හිටපු පක්ෂකට ඒ ලකුනෙන් ඉල්ලන්න බැරි වුනේ සහරාන්ලගෙ කල්ලියේ ඉල්ලීම. අවුරුදු ගානක් ඒ පක්ෂෙට කඹුරල තාත්තගෙ අම්මගෙ ඉදල ඒකෙ ඉදල තමන්ගෙ පක්ෂෙ ලකුණින් ආවනම් කොච්චර වටිනවද? අපිටනම් වෙලා තියෙන්නෙ අපිට කඩාගෙන යන්න වුනා. අපි ගිහිල්ල පොහොට්ටුව හදා ගත්ත ඒකෙන් තමයි අපි යන්නෙ. එහෙම එන්න බැරිවෙන්න හේතුව තමයි මේ ඇති කර ගත්ත ගිවිසුම. අපි සියලුම දෙනාම 17 වෙනිදයින් පස්සෙ, අපේ රජයක් යාටතේ එළඹෙන සභාවෙදි සියලු දෙනාටම මම දිවා ආහාරය ලබාදෙන බව පැහැදිලිවම කියා සිටිනවා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, මේ  වෙලාවෙ සභාවේ මට පොඩි චෝදනාවක් තියෙනවා.  තේ පැන් සංග්‍රහය වෙලාවෙ මම චෝදනාවකට ලක් වුනා. මේ කෑම ටික ගේන එකත් අපි නතර කරලයි කියලා. කොහොම හරි මේ සම්බන්ධයෙන් ඇත්තටම මම ඒකට කණගාටු වෙනවා. මොකද අපේ මේ සභවෙ වැඩ කරන සේවකයෙක් තමයි අවන්ත, අවන්තයි මමයි තමයි මේ වැඩේ නතර කරලයි කියන්නෙ. චෝදනා කරන්නෙ. ඒ නිසා මේ වෙලාවෙ මම සදහන් කරනවා. අපේ ගරු සභාපතිතුමා ඒ කෑම එතනින් අවශ්‍ය නැති නිසා එතුමා වෙන තැනකින් ඕඩර් කරල තියෙනවා. ඒකට අපට ගැටලුවක් නැහැ. ඒ සම්බන්ධයෙන් අපට අභූත චෝදනා ඉදිරිපත් කරන්න එපා.

ඊලග එක තමයි මේ සභාවේ අපි මන්ත්‍රීවරු ඒවගේම සේවකයො දෙපිරිසක් තමයි මෙකෙ මේ කටයුත්ත කරන්නෙ. අපි  පැහැදිලිව දන්වැලේ පුරුක් වගේ මේ සභාවක් ගෙනයාමෙදි කටයුතු කරනවා. දැන් පැහැදිලි බහුතරයකින් පත්වෙච්ච කණ්ඩායමක් තමයි ප්‍රාදේශීය සභාව පාලනය කරන්නෙ. එහෙම පාලනය කරද්දි මේ සේවකයන් පිළිබදව ඇතැම් අවස්ථාවලදි මම කතා කරන්නෙ, සභාපතිතුමා, ඒවගේ අපි කොයි වෙලාවකවත් කිසිම කෙනෙකුට බලපෑමක් කරල නැහැ. කිසිම කෙනෙක් දේශපාලන කටයුතු සදහා යොදාවා ගන්න උත්සාහ කරලත් නැහැ. ඉතිං එහෙම වකවානුවක් තුලදි මම දකිනවා. මේ සභාවේ ඉන්න ඉස්සෙල්ල අපි කල්පනා කරන්න ඕන. විශේෂයෙන් දේශපාලඥයො මොන ගමන ගියත්, සේවකයො තමන්ගෙ රාජකාරි කරන සියලුම දෙනා එකා වගේ එකතුවෙලා මේ කටයුත්ත කරගෙන යන්න ඕන. ඒ වගේම තමයි ඕනම තැනක පුද්ගලිකව කටයුත්තක් කළත් ස්වාමියට කීකරු වීම, ආයතන ප්‍රධානියට කීකරු වීම, ආයතන ප්‍රධානියගෙ කටයුතුවලට සහය වීම, මම හිතන්නෙ සේවකයින්ගෙ වගකීම සහ යුතුකම. ඉතිං ඒ නිසා මෙහෙම ගියොත් අපට සභාවල් තුල ගමනක් නැහැ. ඒ නිසා මොනව හරි අඩු පාඩු කමක් තියෙනවනම් නියත වශයෙන්ම සභාපතිවරයා සමග සාකච්ඡා කරන්න පුලුවන්කම තියෙනවා. ඊට ඔබ්බෙන් ගිහිල්ල වෙන වෙන ක්‍රමවලින් කටයුතු කිරීම මම නිවැරදි ලෙස දකින්නෙ නැහැ. අපේ මෙතුමා මේ සම්බන්ධයෙන් හොයල බලල කටයුතු කිරීම පිළිබදව අර නොදන්නා දේවල් සම්බන්ධයෙනුත් එතුමට ඇත්තටම මම ස්තූතිවන්ත වෙනවා. නමුත් මම කතා කරන්නෙ මෙතන කවුරු පාලනය කළත්, මේ සේවකයො තමන්ගෙ අනන්‍යතාවය රැක ගන්න ඕන. මේ කණ්ඩායම් ඇවිල්ලා අද අපේ කණ්ඩායම ඇවිල්ල වෙන කණ්ඩායමක් ඒවි. ඒත් රාජ්‍ය නිලධාරි හැටියට ඔවුන් මෙතන සේවය කරන්න ඕන. ඒ නිසා ඔවුන්ට වගකීමක් සහ යුතුකමක් තියෙනව. මේ ස්ථානයේ යම් තියෙන රහස්‍ය භාවය රැකගෙන, ඒවගේම තමන් මෙතන ජීවත්වන ආයතනය. ඒ නිසා මෙකෙ වැඩ

කළොත් තමයි තමන්ට වැටුපක් ලැබෙන්නෙ.ඒ නිසා මේකෙ සියලුම දෙනාගෙ වගකීමක් තමයි තමන් ඒ කටයුතු කරද්දි මොන දේශපාලන මති මතාන්තර දැරුවත්, ඒ කටයුතු කරගෙන යෑම. ඉතිං ඒ නිසා ඒ පිළිබදව මම පළමුවෙන්ම අපේ සියලු දෙනාටම දන්වා සිටිනවා. මොකද අපි දන්නවා සමාජයේ ඕන තැනකදි අපි අසමගි වුනාට පස්සෙ ප්‍රහාරයක් දියත් කරන්න , කඩාකප්පල් කරන්න ලේසියි. ඒ නිසා අපේ සියලුම අපේ කුඩා සේවකයගෙ ඉදලා ඉහල නිලධාරියටත් ඒ වගේම සියලු මන්ත්‍රීවරුන්ටත් එකාවගේ එකතුවෙලා මේක ගොඩ නගන්න එකතු වෙන්න කියන ආරාධනාව මේ වෙලාවෙ කරනවා. ඒ වගේම වැරදි පූර්වාදර්ශයක් තමයි මේ එක එක්කෙනා එක එක විදිහෙ දේවල් ප්‍රකාශ කිරීම මම දකිනවා. ඒ නිසා මේ වෙලාවෙදි කොහොම වුනත් අර මම එකක් සදහන් කරන්නට ඕන. ඇත්තටම අර මේ වෙලාවෙ වීථි ලාම්පු සකස් කිරීම පිළිබදව කතා කළත්, ඊට වැඩිය මැතිවරණය සම්බන්ධයෙන් කඩාකප්පල් වෙන විදිහෙ වැඩ පිළිවෙලවල් ඕන තරම් මේ ආණ්ඩුව විසින් සිදු කරනවා. මොකද අද දිනයෙදිත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාර්ගයක් සදහා ගිවිසුම් අත්සන් කරන්න සූදානම් වුනා. ඒ මිනිස්සුන්ට එන්න කියල පරන දින දාල කටයුතු කරන්න හදලා, පස්සෙ කොහොම හරි මොනයම් හේතුවක් නිසා හෝ ඒක වැලකිල තියෙනවා. ඒ සම්බන්ධයෙන් මම හිතන්නෙ මැතිවරණ කොමිසමට පැමිණිලි කරල තියෙනවා. ඒ අනුව ඒ කටයුතු සිදුවේවි. ඒ නිසා මම පුංචි දෙයක් පිළිබදව සදහන් කළේ.

ඉතිං ඒ නිසා මැතිවරණය පිළිබදව මේ වෙලාවෙ හැමෝම කතා කළා. ඒ වගේම මම අපේ සුභාෂි මන්ත්‍රීතුමියත් සදහන් කළා. විශේෂයෙන්ම මම සදහන් කරනවා. ගම්මැද්දෙගොඩ උඩවැලිවිටිය යා කරන මාර්ගය. මම අවුරුදු 13 ක් තිස්සේ නඩු කියන මාර්ගයේ කෙළවරේ අවසානයේ තමයි මේ පොඩි සාමාන්‍යයෙන් අඩි 08 ක විතර විශ්කම්භයකින් යුතු බෝක්කුවකින් වතුර බැහැපු තැන දැන් මම හිතන්නෙ මේ ගගට දාපු මහ පාලම විතර විශාල කොටසක් කඩල බිදල දාල තියෙනවා. ඒ වගේම තමයි අපි දන්න කියන දෙයක් තමයි පාරක් කඩනව නම්, ඒ පාර සදහා විකල්ප මාර්ගයක් සකස් කිරීම සදහාම විශාල මුදල් ප්‍රමාණයක් ඒ ඇස්තමේන්තුවේ වෙන්කරනවා. අනිවාර්යයෙන්ම ඒක කරනවාමයි. ඒක රජයේ පිළිගත්තු දෙයක්. ඒ නිසා එහෙම දෙයක්වත් මෙතන සිද්ද කරල නැහැ.ගමේ අහිංසක මිනිස්සු පොල් ගස් කපල, කදන් කපලා, අර අතුරු මාර්ගයක් සකස්කරගෙන දැන් ගමන් කිරීමේ කටයුතු සිදු කරනවා. ඒ නිසා අපි රට අල්ලන්න යන්න ඕන නැහැ. මම හිතන්නෙ මේ පාලම විතරක් නෙවෙයි. මම දැක්ක හොරංගල්ලෙ පන්සල ලගත් ඒ වගේම පාරක් කපල තියෙනවා. යටලමත්තෙ සදුන් අපේ හිටපු මන්ත්‍රීතුමාගෙ ගෙදර ආසන්නයේත් ඒ වගේම මහා වලක් කපල දාල තියෙනවා. මේව තමයි රජයක් ඉදන් කරන්නට ඕන. ඒක රජයේ වගකීම ඒ පාලම් බෝක්කු හදන්න දානවනම් ඒ පාලම් බෝක්කු ඒ වගේ කපන්න දැම්මනම් බෝඩ් එක ගැහුවනම් ඒක තමයි යුතුකම. හෙට දවසේ මේ ආණ්ඩුව පාලනය කරන්නෙ අපිද? මිනිස්සු හිතාගෙන ඉන්නෙ අපියි ආණ්ඩුව පාලනය කරන්නෙ කියලා. ඒ වගේම සජිත් ප්‍රේමදාස මැතිතුමා අද නින්දෙන් නැගිටල වගේ අපි මේ ආණ්ඩුව පාලනය කරන විදිහට සියලු දේවල් 17 වෙනිදයින් පස්සෙ කරනවලු. එයා අද නිවාස ඇමතිවරයා හැටියට මේ රජයේ කැබිනට් ඇමතිවරයෙක් හැටියට ඉන්නවා. ඒ නිසා මට හරිම කණගාටුවක් ඇති වෙනවා. අර උඩවැලිවිටියෙ ඒ පාර අපට එගොඩ මෙගොඩ යන්න එන්න විදිහක් නැහැ. ඒ නිසා ඒ පාලම සදහා කටයුත්තක් සිද්ද කළ යුතුමයි. ඒ නිසා අපි ආරාධනා කරනවා.අපි ලබන සතියෙ මොන මැතිවරණෙ තිබුණත්, මොනදේ තිබුණත්, දවැන්ත උද්ගෝෂණයක් කරනවා. මේ වැඩ පිළිවෙල හරහා පාර හරස් කරලා ඔය පාලම් හැම තැනම. ඉතිං ඒ නිසා මේ පාලම් සකස් කිරීමේ වගකීම ඒ වගේම ලක්ෂ ගණන් කෝටි ගණන් දාල බෝඩ් ගහල පටන්ගත්තනම් ඒකෙ වගකීම මේ රජය තුල තියෙනවා. ඒ නිසා අපි සුර පුර ගැන කතා කරල වැඩක් නැහැ.පාරවල් ගැන කතා කරල වැඩක් නැහැ.මේ කරපු වැඩවල අවසානයක් දකින්න ඕන. ඒ නිසා අපි ඒව පිළිබද විශේෂයෙන් මේ වෙලාවෙ සිහිපත් කරනව. ගෝල්ලගොඩ ගම්මැද්දෙගොඩ මාර්ගය වැඩ ඉවර කරන්න ඔහුට මුදල් මදිය කියල ඔහු සියලුම යන්ත්‍රසූත්‍රත් අරගෙන ඒ සියලු දේවල් අරගෙන මේ අද වෙනකොට ඉවත්වෙලා ගිහිල්ල තියෙනවා. ඒ නිසා මම කියන්නෙ ඒව සොයල

බලන්න.ඒව අවසාන කරන්න රජයේ වගකීම ඒවා.ඉතිං මේ රජය කියනවනම් කොන්ත්‍රාත්කරු දූෂිතයි කියලා එහෙනම් ඒ වෙලාවෙ අත්අඩංගුවට ගන්න තිබුනා. අන්න ඒ වගේ මේ රට පාලනය කරන්න කෙනෙක් නැහැ. මේ රටේ ජනාධිපතිවරයෙක් නැහැ. අගමැතිවරයෙක් නැහැ. කැබිනට් එකක් නැහැ. තව 17 වෙනිදට බලය ඉල්ලනවා මොනව කරන්නද. මේ කරපු දේවල් කර ගන්න බැරුව තව බලය ඉල්ලන්නෙ මොකටද ඊලග එක තමයි මතක තියා ගන්න මේ කරපු දේවල් කරන්න ගිහිල්ල තමයි දැන් ඔය එක එක දේවල් කතා කරන්නෙ. ඉතිං ඒ නිසා මම සදහන් කරනව මේ වෙලාවෙදි ඒ මාර්ග සංවර්ධනයන් පිළිබදව ගමේ කෝටි ගණන් ගැන කතා කළා. මම දන්නෙ නැහැ. මගේ කොට්ඨාසයේ දැනට ගල්ලෙනමුල්ල ප්‍රධාන මාර්ගය ඒ වගේම උඩවැලිවිටිය ශ්‍රමදාන මාවත ඒ ආදී වශයෙන් ගත්තහම මුත්තවිල මාර්ගය දැනට ගමන් කිරීමේ දැඩි අපහසු තාවයක් තියෙනවා. ඒ වගේම ඔබතුමාල කොන්ක්‍රීට් කලෙත් ගෙවල් දෙකක් තුනක් යන්න තියෙන පාරවල් තමයි. ඔන්න ඕක තමයි මේ සංවර්ධනය හැටියට මේ දකින්නෙ. ඔය සංවර්ධනය පිළිබදව කතා කළේ.

ඊලගට කෘෂි කර්මාන්තය පිළිබද හැමෝම කතා කළා. ඒ වුනාට මටත් කතා කළ යුතුයි. අවුරුදු හතරහමාරක් තුල මේ රට පාලනය කළ මේ රජය එදා අපි මේ ආණ්ඩුව 2015 වෙදි භාරදෙනකොට වී වලින් ස්වයං පෝෂිත වුනා. වී ටික දාන්න තැනක් නැතුව ගිහින් දැම්මෙ මත්තල ගුවන්තොටුපොලේ. අද ගෙදරක කැද හදාගන්න හාල් සේරුවක් නැති තත්වෙට පත්වෙලා තියෙනවා. පොහොර සහනාධාරය සම්බන්දයෙන් කතා කළේ නැහැ. ඊලගට කෘෂි කර්ම නිලධාරි ආදී හැම නිලධාරිම ඉන්නවා. කාර්යාලයකට ගියාම 50 ක් 60 ක් ඇගේ හැපෙන ගානට. නමුත් ඒ අයට නිසි නායකත්වයක් මේ රජය ලබා දුන්නෙ නැහැ. ඒ නිසා ඒ අය අද නිකන් පඩි අරගෙන ගෙදරට වෙලා ඉන්න තත්වෙට පත්වෙලා තියෙනවා. අපි 2015 න් ඉස්සර වෙලා හැම ගෙදරටම බීජ ලබා දුන්නා. අපි ගෙවත්තක් හැදුවා. ඒ ගෙවත්තෙ එලවළු ටික නිෂ්පාදනය කර ගත්තා. දිවි නැගුම සංවර්ධන වැඩසටහන යටතේ එහෙම කරගත්තා. ඒ සියලු දේවල් අද ඇත්තෙ නැහැ. අද මිනිස්සු ඒ පිළිබදව කණගාටුවට පත්වෙනවා. ඒ නිසා බලන්න අද හාල් කිලෝ එකක් කීයද කියලා. මේව පාලනය කළ යුතුයි ඉතිං ඒ නිසා මම හිතන්නෙ මම මේ උත්තර දෙන්නෙ මේ කියපු දේවල්වලට.

ඊලග එක තමයි සමෘද්ධි සහනාධාරය පිළිබද කතා කළා. සමෘද්ධි සහනාධාරය පිළිබද හොදින්ම දන්නෙ මම. මම සමෘද්ධි සහනාධාරය දුන්නු හැටිත් දන්නවා. සමෘද්ධි සහනාධාර ටික අද දීල තියෙන්නෙ කාටද? අපේ කාලෙ ශ්‍රී ලංකා යූ.එන්.පී. ජවිපෙ කියලා අවංකව අපි බැලුවෙ නැහැ. ඒ වගේම තමයි මේ ගොල්ල අමුතු කතන්දරයක් හදාගත්තා.මේකෙ සුදුසුකම තමයි එක්කො වාහනයක් තියෙන්න ඕන. එක්කො හොද ගෙයක් තියෙන්න ඕන. හොද අදායම් මාර්ගයක් තියෙන්න ඕන. අන්න ඒක තමයි සමෘද්ධිය දීමේ සුදුසුකම බවට පත් වුනේ. ඒ නිසා මතක තියාගන්න අවුරුදු හතරහමාරකින් ගමේ දුප්පත් මිනිහාගෙ සමෘද්ධි සහනාධාරය කපලා පොහොසත් මිනිහට දීල තියෙනවා. සහනාධාරය දීම සම්බන්ධයෙන් ප්‍රතිපලය 17 වෙනිදයින් පස්සෙ කාට කාටත් ලැබෙයි.

වැඩිහිටි දීමනාවක් ගැන කතා කළා. ඕක මහින්ද රාජපක්ෂ මහත්තය තමයි වැඩිහිටි දීමනාව දෙන්න යෝජනා කරලා රපියල් 2000/=ක් දුන්නා. රු.2000.00 න් රපියල් 100.00 ක් ඔය ගොල්ල කපා ගත්තා.

ඒ වගේම රැකියා දස ලක්ෂයක් දෙනවයි කිව්වා. අර ෆොක්ස්වගන් ව්‍යාපෘතියක් ගෙනැල්ල වැඩ පිළිවෙලක් ලැස්ති කරල තියෙනවයි කියල හැම තැනම සදහන් කළා. අද ඒක පුස්සක් වුනා. ඒ වගේම හැම තැනම ෆී වයිෆයි දෙනවයි කිව්වා. ඒවා දීලා ඔක්කොම ඇතිවෙලා තියෙන්නෙ. ඉතිං ඒ නිසා ඔන්න ඔය වගේ බොරු පුහු වැඩ කරලා. අද කතා කරන්න ලැස්ති වෙනවා.

අපි මහින්ද රාජපක්ෂ මහත්තයගෙ ආණ්ඩුව කාලෙ දකුණු කොළඹ වරායෙ නව ජැටියක් ගහල ආසියාවේ තියෙන හොඳම වරායක් බවට  වරාය පත් කළා. ඒ වගේම මත්තල ගුවන් තොටුපොල හැදුවා. ඒ වගේම විකුනගෙන කන්න හරි හම්බන්තොට වරායක් හැදුවා. අපි ක්‍රිකට් ක්‍රීඩාංගනයකුත් හැදුවා එහෙම දේවල් කළා. නමුත් ඔයාලගේ ආණ්ඩුවට එහෙම කිසිම දෙයක් කරගන්න බැරි වුනා. පාරක කොන්ක්‍රීට් කරපු එකක් තමයි ඔයාල මේ විප්ලවයක් හැටියට කතා කරන්නෙ. ඒක නිසා අවුරුදු පහක් තුල මේ රටේ ආර්ථිකමය වශයෙන් බලපාන කිසිම සාධකයකට අත ගහන්න බැරි වුනා. ඒ වගේම ගරු සභාපතිතුමත්, මමත් උතුරු පළාතෙ සංචාරය කළා. ඒ වෙලාව වෙනකොට ඒ ගම්මානවලට දවස් තුනකටම දෙන්නෙ වතුර ලීටර් 20 යි. ඒ මිනිස්සු රෙදි කෑල්ලක් භාජනයට දාල තමයි ඇග පිහදාගන්නෙ. ඇත්ත කතාව ඒක. ඊලගට පාරක යන්න බැහැ. දූවිල්ලෙන් බේරෙන්න බෝක්කුවක් අස්සෙ හරි හැංගෙන්න ඕන. මේ අවුරුදු හතරහමාර තුල ඒ මිනිස්සු කැඩිච්ච කතාවෙන් කිව්වෙ මහින්ද මහත්තයගෙ හොද. මහින්ද මහත්තයා අපට පාර ටික හදල දුන්නා, වතුර ටික දුන්නා. ඒ සියලු දේවල් සදහන් කළා. ඒ නිසා මේ සැරේ දෙමළ ඡන්දවල ප්‍රතිඵලෙත් ලැබෙන කොට කට්ටියට දුවන්න වෙනවයි කියන එකත් මේ වෙලාවෙ සදහන් කරනවා. අපි ඒ නයින් මාර්ගය හැදුවා. ඒ වගේම ඒ පැත්තෙ තියෙන සියලුම මාර්ගයන්, ඇත්ත වශයෙන්ම අර අපේ ගනේවත්ත මන්ත්‍රීතුමා කිව්ව වගේ සියලු පාරවල් සියලු දේවල් අපට එක විදිහට කර ගන්න බැරි වුනා. නමුත් රටේ ආර්ථික වශයෙන් බලපාන සියලු මාර්ග අපේ රජයක් තුල එදා සංවර්ධනය කළා. එදා වැඩබිමක් බවට පත් වෙච්ච රජයක් තමයි අපි මේ මල් වට්ටියක් වගේ තියල භාර දුන්නෙ.

ඊලගට මේක බෞද්ධාගම් රටක් කියල අපේ සහබන්දු ගරු මන්ත්‍රීතුමා සදහන් කළා. එදා මතකයි පාස්කු ප්‍රහාරය 21 වෙනිද දියත් වෙච්ච වෙලාවෙ පන්සලට උපාසක අම්මයි දරුවයි ගියාට පස්සෙ අර මල් ටික, හදුන්කූරු ටික පත්තු කරන්න විදිහක් නැහැ. මොකද ඇතුල්වෙන කොට චෙක් කරලා යවන නිසා මල් ටිකත් පොඩිවෙලා. බංකු ටිකක් දාල වාඩිවෙලා බලාගෙන ඉන්නව.උපාසක අම්ම එළියට එනකම්. මෙන්න බෞද්ධාගම් රටේ හැටි. ඊලගට මෛත්‍රී භාවනාව කරන ගම පොඩි එකාට කියනවා බලහන් පුතේ සහරාන් එනවද කියලා..අන්න එහෙම ප්‍රශ්නයක් බෞද්ධාගම්කාරයන්ට වුනේ. ඇයි ඒ වගේ තත්වයක් උදා වුනේ. මතක තියාගන්න අපි ඕනම ගමක මිනිහෙක් මොනව හරි වරදක් කරල අහුවුනෝතින් ඒ දේ නඩු භාණ්ඩයක් හැටියට උසාවියට ඉදිරිපත් කරල නඩු දානවා. එතකොට බලන්න පහුගිය වකවානුව තුලදි කොච්චර කඩු කිනිසි පිහි එතකොට ඔය බෝම්බ හදන සියලු දේ අහුවුනා. ඒ කිසි දෙයක් උසාවියට ඉදිරිපත් කළාද. ඒ කිසි දෙයක් කළේ නැහැ. ඒ නිසා මේ බෞද්ධාගම් සහ ක්‍රිස්තියානි ආගම් සියලු ආගම්වල අද බිදිල තියෙන්නෙ. මතක තියාගන්න හොද ප්‍රතිඵල ඉදිරියෙදි 17 වෙනිදට ලැබෙයි.

මේ වෙලාවෙදි මම අවසාන වශයෙන් කියන්නෙ. අපි ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණය තිබ්බා. ඒක හරි ඒක වාමාංශික ආසනයක් කියමු. ඒ අපි පිළිගන්නවා. කොට්ඨාස කීයක් තිබුනද? කොට්ඨාස 17 යි.එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට එක කොට්ඨාසයක් දිනන්න බැරි වුනා. කැබිනට් ඇමතිවරු වැහිවැහැලා. ඒ වෙන කොටත් බඩු බෙදලා. කිසිම දෙයක් කරගන්න බැරි වුනා. අපි සදහන් කරන්නෙ ඒ වගේ අපි පළාත් පාලන මැතිවරණය තිබ්බා. පළාත් පාලන මැතිවරණය අපි ඡන්ද ලක්ෂ 50 ක් විතර අරගෙන තනි පක්ෂයක් හැටියට අපි ඒකත් අරගෙන විශේෂයෙන් අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂෙත් අපිත් එක්ක එකතු වෙලා ඒකෙ ලක්ෂ 14 ත් එකතු කරගෙන අපි 65% විතර අතේ තියාගෙන තමයි මේ මැතිවරණයට යන්නෙ. ඉතිං ඒ නිසා අපි පැහැදිලිව කියනවා මේ මැතිවරණය මිනිස්සු මැරිල ඉපදුනේ නැහැ. ටොන් ගණන් හන්දි ගානෙ ඔය අපේක්ෂකවරු කයිය ගැහුවත් බලන්න අපේ අපේක්ෂකය කතා කරන්නෙ අපි ගැන. කොයි වෙලාවකවත් මම නෙවෙයි,අපි ගැන තමයි කතා කරන්නෙ. ඒ වගේම කතා බහේදි වුනත් බලන්න මොකක්ද වෙන්නෙ කියන එක. ඒ වගේම මම අවසාන වශයෙන් සදහන් කරනවා. ඔබ අපි හිතන්නෙ නැති ප්‍රතිඵලයක් මේ මැතිවරණයෙදි සිද්ධ වෙනවා. මතක තියාගන්න ඒ ප්‍රතිඵලය තමයි ඔබ විශ්වාස කරන්නෙ නැති

ප්‍රතිශතයකින් මේ රටේ අපි වැඩි ඡන්ද ලක්ෂ 20 ට වැඩි සංඛ්‍යාවක් අරගෙන ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපති කරනවා. ඒ වගේම මේ වෙලාවෙ අපි තව එකක් සඳහන් කරන්න ඕන. පක්ෂෙ ලකුණවත් නැතුව මේ හෙළුවැල්ලෙන් දුවඇවිදිනවා. දැන් මිනිස්සු ඡන්ද පත්‍රිකාව අරගෙන අලිය කෝ කිංා බලනවා. අලියා නැහැ. ඒක එකක් කොටහක් සීනුව හොයනවා. ඒකත් නැහැ. මතක තියාගන්න මේ රටේ පහල වෙච්ච ශ්‍රේෂ්ඨම කාන්තාව තමයි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය. ඇය මේ රටට විශාල සේවාවක් කළා. රටේ කෘෂි කර්මාන්තය දියුනු කරන්න කටයුතු කළා. නමුත් ජනතා විමුක්ති පෙරමුණ 89 දි එතුමියට බලයට එන්න දුන්නෙ නැහැ. ප්‍රේමදාස මහත්තයයි සිරිමාවෝ මැතිනියයි ඡන්දය ඉල්ලද්දි ජනතා විමුක්ති පෙරමුණ ගිහිල්ල කිව්වා. බෙල්ල කපනවා, කියල.එදා යූ.එන්.පී ආණ්ඩුව තිබුනෙ. යූ.එන්.පී ආණ්ඩුවෙ පොලීසියෙ ආරක්ෂාව රැකවරණය මැද්දෙ යූ.එන්.පී කාරයො ගිහිල්ල ඡන්දෙ දුන්නා. ශ්‍රී ලංකාකාරයොන්ට ඡන්දෙ දෙන්න යන්න බැරිවුනා. උන්ට කාගෙවත් රැකවරණයක් නැහැ. මැර යූ.එන්.පී දේශපානය සහ ජනතා විමුක්ති පෙරමුණේ ඒ ආයුද ගත්තු දේශපානය නිසා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය එදා පරාජය කළා. ඒ පරාජය කිරීමේ අවාසිය අද බලන්න. එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ගෙනාපු කෘෂි කර්ම ප්‍රතිපත්තිය අද වෙන කොට නැති වෙලා තියෙනවා. 77 විවෘත ආර්ථිකය ගෙනැල්ල මේ රට නැත්තටම නැති කළා. ඒකට ජනතා විමුක්ති පෙරමුණත් වග කියන්න ඕන. මතක තියාගන්න ඔය රවුන් ගහගෙන ආවට ඔය ගොල්ල තමයි මේ රට නැති කළේ. හැම අවස්ථාවකදිම. යූ.එන්.පී එකට කඩේ ගිහිල්ල දැන් එනව බොරුවට. එතකොට මතක තියාගන්න මම පැහැදිලිව කියනවා. ජනතා විමුක්ති පෙරමුණ බය නැත්නම් ඇයි ගාන්ටාරෙ සීනුව කෝ මොකද ඒව දාල ආවෙ. මතක තියාගන්න මේ 16 වෙනිදට මිනිස්සු පැහැදිලිව ඔය පක්ෂෙ ලකුණු හංගල එන සියලු දෙනාට බලන්න මැතිවරණ වේදිකාවෙ ආණ්ඩුවෙ ප්‍රභල ඇමතිවරු කොහෙද ඉන්නෙ. හැංගිලා ඉන්නෙ. එක්කෙනෙක්වත් එලියට එන්නෙ නැහැ. සජිත් ප්‍රේමදාස දුව ඇවිදිනවා. මතක තියාගන්න16 වෙනිදට අපි වැඩි ඡන්ද ලක්ෂ 20 න් විතර ජයග්‍රහණය කරනවයි කියන එකත් ප්‍රකාශ කරමින්, ඒ වගේම මේ වෙලාවෙ අපේ සභාවෙ සියලුම දෙනාට ආරාධනා කරනවා. තමන්ගෙ ගෞරවය රැකගෙන සමගියෙන් මේ සභාවෙ වැඩකටයුතු කරන්න. මේකෙ තොරතුරු එලියට ගියෝතින් ඔබටමයි පාඩුව සිද්ද වෙන්නෙ. ඒක නිසා සියලු සේවකයොන්ට ආරාධනා කරනවා. සියලු සේවකයො එකතු වෙලා මේ සභාව ගෙනියන්න සභාපතිවරයත් එක්ක කටයුතු කරන්න කියන ගෞරවණීය ආරාධනය කරමින්, මම නිහඩ වෙනවා. ඔබ සැමට සුබ අනාගතයක්.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, දීර්ග වශයෙන් කතා කරල ඉන්න වෙලාවක දීර්ග වශයෙන් කතා කරන්න අවශ්‍ය වෙන්නෙ නැහැ. ගරු සභාපතිතුමනි 70 කන්ද පාර සම්බන්ධව ඊයෙ ප්‍රශ්නයක් පැන නැගුනා. ගරු සභාපතිතුමා එතනට ගියා. ඒ පාර හදන්න ගරු සභාපතිතුමාටත් අපිටත් ඇත්තටම පුදුම අවශ්‍යතාවයක් තියෙනවා. ඒ කාර්යය කරන්න අපේ සියලුම සහයෝගය දෙනවා. ඒ දෙන ගමන් ඊයෙ එතන පොඩි උද්ගෝෂණයක් සිද්ද වුනා. ඒ පාරෙ හදන්න යන අතරෙ ඒ කන්දෙ ඉන්න ජනතාව එක්කෙනෙකුට වැඩිය මට විරුද්දව ගියෙ නැහැ. යටින් මට ඔක්කොම උදවු කළා. ඒ නිසා ඒ මිනිස්සුන්ගෙ ඒ අවශ්‍යතා ඉෂ්ඨ කර දෙන්න උදවු කරන එක මගේ යුතුකමක්. ඒ නිසා මම ඒ අවස්ථාවට ගියා. ඒ අවස්ථාවෙදි මම දැක්කා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුත් ඇවිල්ල උදවු කරන්න.බොර දියේ මාළු බාන්න ඇවිල්ලා. මේ වෙලාවෙ බොර දියේ මාළු බෑම, මිනිස්සු නොමග යවන මේ වගේ වැඩ තමයි තියෙන්නෙ. නොදන්නා නොතේරුම් කමට කෑ කෝ ගහන මිනිස්සු නොමග යවන්න. එතනදි ලොකු අසාධාරණයක් වුනා. අපේ හිටපු ජයවිරාජ් ගුරුසිංහ මන්ත්‍රීතුමා

එක්ක මම උදේ කතා කළා. මේ පාර හදන්න එතුමගෙ කිසි විරෝධතාවක් නැහැ. එතුමා කිව්ව මේකට සහයෝගය දෙනව කියලා. එතුමා ඕන දේකට ඔට්ටුයි. ඉතිං අන්තිමට එවලෙ යම්කිසි හේතුවක් නිසා එතන වැඩේ නැවතුනාට පස්සෙ එතුමාට තමයි මේකෙ දෝශාරෝපනය ආවෙ. ඒක අපි හෙලා දකිනවා. ඒක යම් දෙතුන් දෙනෙකුගෙ නොමග යැවීමක් නිසා වුන සිද්දියක්. පන්සලේ හාමුදුරුවොත් ඉදිරිපත් වුනා. දැන් හාමුදුරුවො මෙතනටත් ආව.ඒ නිසා ඒ පාරෙ කටයුතු කරන්න අපි සහයෝගය ලබා දෙනවා.

ඒ වගේම අපේ මන්ත්‍රීතුමාල දීර්ග වශයෙන් කතා කළා. ගරු සභාපතිතුමනි ඔබතුමා අපි දන්න කාලෙ ඉදල බොහොම අවංක නිහතමානී සභාපතිවරයෙක්. ඒත් ඔබතුමාගේ කීර්තියට හානි වෙන විදිහට දැන් සමහර දේවල් ඔබතුමා කරපු දේවල් නෙවෙයි. සභාවෙ යම් යම් අකටයුතුකම් ගැන හිටපු සභාපතිතුමා සහබන්දූ මහත්තය කිව්වා. පොහොර කතාවක් කිව්වා. සභාපතිතුමනි, ඒව ගැන ඔබතුමාගෙ අවදානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. එහෙම දේවල් වුනාම අපි කාටත් හොද නැහැ. අපේ ගෞරවයට හානි වෙනවා. ඔබතුමා දැනුවත්ව නම් ඒ කිසි දෙයක් වෙන්නෙ නැහැ. ඒ පිළිබද ඔබතුමාගෙ අවදානය යොමු කරන්න.

ඒ වගේම ඉදිරියෙ පැවැත්වෙන ජනාධිපති වරණය ගැන අපේ හිටපු සභාපතිතුමා කතාව පටන් ගත්තෙ බුදු දහම මතක් කරලා. බුදු දහමට අනුව එතුමාගෙ නායකයා දිනනවයි කිව්වා. බුදු දහමට අනුව එතුමාගෙ නායකය ද අපේ නායකය ද දිනන්නෙ කියල එතුමා හිත යටින් දන්නවා ඇති. මොකද අපේ හාමුදුරු නමක් ආදාහනය කරන්නවත් තමුන්නාන්සෙලගෙ රජය කාලෙ අධිකරණයෙන් අවස්ථාව ලැබුනෙ නැහැ. ඔබතුමාලගෙ නීතිය සාධාරණය,කඩු කිනිසි අහුවුනා නඩු නැහැ. ජාතික ආරක්‍ෂාව ගැන කතා කරන කොට සනීපාරක්‍ෂාව ගැන කතා කරන අපේක්‍ෂකතුමාල තමයි ඉන්නෙ.

ඉතිං ඒව ගැන අපි දීර්ග වශයෙන් කතා කරල තමුන්නාන්සෙලගෙ හිත් පාරවන්න සූදානම් නැහැ. මොකද හෙට අනිද්ද 17 ඔබතුමාලට බොහොම ශෝක ජනක අවස්ථාවක්. ලබන සභාවෙනම් ඔබතුමාලට මෙහෙමවත් මොකුත් කියන්නෙ නැහැ. මොකද හිතේ අමාරුවෙන් ඉන්න ඔබතුමාල අපි එකට එකතුවෙලා කෑම බීම කාල සතුටු වෙලා යමු. අපි කවුරුත් එක්ක හිතාගමු මෙතුමාලගෙ හිත නරක් වෙන්න මොකුත් නොකියන්න. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා, සමන් මන්ත්‍රීතුමා කියන්න ඕන දේවල් කියල තියෙද්දි තවත් දීර්ග වශයෙන් කතා කරලා අපේ කාලය අපතේ යවන්න අවශය නැහැ. මගේ කතාව මෙයින් අවසන් කරනවා. ඔබ සියලු දෙනාටම සුබ සන්ධ්‍යාවක් ප්‍රාර්ථනා කරමින් ගෝඨාභය රාජපක්‍ෂ මැතිතුමා අනිවාර්යයෙන් ජනාධිපති වෙනවා. එතුමාටත් ජය වේවා කියල ප්‍රාර්ථනා කරමින්, මගේ කතාව අවසන් කරනවා.

**ගරු උපසභාපති ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමනි,ගරු මන්ත්‍රීවරුනි,ගොඩක් වෙලා අදහස් ප්‍රකාශ කළා. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා අපේ පාර්ශවය වෙනුවෙන් අදහස් ප්‍රකාශ කිරීම පිළිබදව මම හිතන්නෙ අපි තව දුරටත් කතා කළ යුතු වන්නෙ නැහැ. මම විශේෂයෙන්ම සිහිපත් කරන්න කැමතියි. අපේ කාර්යාල නිලධාරීන්ගෙ හැසිරීම පිළිබදව ඔබතුමා මීට වඩා විධිමත්ව කටයුතු කරන්න. සිකුරාදා කරපු නිශ්පාදනය සදුදා වෙනකොට අතුරුදන් වෙලා තියෙන කොට සදුදා ආපු නිලධාරියා හෝ කම්කරුව ඒක අතුරුදන් වෙලා කියලා ප්‍රකාශ කරන කොට කාර්මික නිලධාරියෙක් ගිහිල්ලා, මහා වංචාවක් වෙලයි කියලා මෙහෙම සංඥා කරන්න එපාය කියලා ප්‍රකාශ කරන කොට, ඔබතුමා මූලාසනයේ නායකයා, සභාවෙ නායකයා වශයෙන් ඔබතුමා නොදැනුවත් වීම පිළිබද මම හිතන්නෙ මේ කාර්යාලයේ කටයුතු කොහොම වෙනවද කියල හිතාගන්න බැහැ.

ඊට පස්සෙ දීර්ඝ වශයෙන් කියනවා මේ වාහන වලින් තෙල් අදිනවයි කියලා. ඉතිං මම දන්නෙ නැහැ මොන ක්‍රමයකට මේක අදිනවද කියලා. මේ කොට්ඨාසෙ තමයි මේව දුවන්නෙ. ජනතාවගෙ අවශ්‍යතාවයට හාහිරව දුවන්න හේතුවක් නැහැ. එහෙම යන්න හේතුවකුත් නැහැ. ඉතිං එහෙම චෝදනාවකුත් තියෙනවා. මේ චෝදනා හදනවද, ඇත්තටම කරන චෝදනාද කියලා ඔබතුමා හොයල බලන්න. ඒ කටයුත්තට සම්බන්ධ වෙච්ච සියලු දෙනා සුලු සේවකයගෙ සිට නිලධාරින් දක්වා කැඳවලා ප්‍රශ්න කරන්න. ප්‍රශ්න කරල කටයුතු කරන්න. ඊළඟ සභාවට උත්තරයක් දෙන්න. මේව මේ සභවල කතා කළ යුතු දේවල් නෙවෙයි. අද ජන මාධ්‍යවේදී මහත්තුරු ආවනම් ප්‍රධාන පුවත් සිරස්තලය හෙට වැටෙන්නෙ නාගොඩ ප්‍රාදේශීය සභාවේ වෙච්ච වංචා ව.මෙතන කෙරෙන සංවර්ධනයක් හෝ වෙනත් වැදගත් කමක් නෙවෙයි. ඒ වංචාව තමයි මුල් පිටුවෙ ලොකු අකුරින් වැටෙන්නෙ. පත්තරවල සීග්‍රයෙන් යනවා. අනිද්දා වෙනකොට ජනතාව අපි 27 දෙනාම පිළිකුල් කරනවා. සභපති මහත්තය මම අජිත් මහත්තය විතරක් නෙවෙයි ලේකම් තුමියගෙ ඉඳන් සියලු දෙනා විවේචනය කරමින් ලොකු අප්‍රසාදයක්,අපට ගමට යන්න බැරි තත්වයකට පත්වෙනවා. මොකටද මේ 27 දෙනෙක් මෙතනට එවලා මේ වගේ දේවල් වෙනවයි කිව්වම. කාලෙකට පස්සෙ ලොකුම චෝදනාවක් එතුමා කළේ. ඒකට ඔබතුමා ලබන සභාවෙ පිළිතුරක් ලබා දෙන්න.

ඊළගට විශේෂයෙන්ම මැතිවරණයක් ආරම්භ කරලා ප්‍රචාරණ කටයුතු අවසාන වෙන්නෙ ලබන 13 වෙනිදා මධ්‍යම රාත්‍රී 12 ට අවසන් වෙන ජනාධිපති වරණය පිළිබඳවත් ඒ අපේක්ෂකයන් පිළිබඳවත් පක්ෂ පිළිබඳවත් කතා කළා . මම මීට මාස දෙක තුනකට කලින් මේ සභාව හමුවෙ තැබුව. මේ මැතිවරණයේ ප්‍රධාන සාධකය වෙන්නෙ මොකක්ද යන්න පිළිබඳව. ප්‍රධාන සාධකය වෙන්නෙ ජාතික ආරක්ෂාව කියන එක.

ඊට පස්සෙ අපේ ගරු මන්ත්‍රීතුමන්ල දීර්ග වශයෙන් සංවර්ධනය පිළිබද කතා කරලා මේ සංවර්ධනයත් සමග විශාල පෙරලියක් සිදු වෙනවයි, ආණ්ඩුවෙන් ඉදිරිපත්වෙන අපේක්ෂකයා ජයග්‍රහනය කරනවයි ඒ මැතිවරණයත් ආණ්ඩුව ජයග්‍රහනය කරනවයි කියල දීර්ග වශයෙන් කතා කළා. මම කියන්න කැමතියි. අපේ විජිත් සභපති මන්ත්‍රීතුමා ඔබතුමා මගේ කතාව අනුමත කරනවද කියලා. මට ආරංචියක් ආවා යටලමත්තෙ පාලමක් දාල අර එහා පාලමේ ගෙවල් දෙකද කොහෙදයි තියෙන්නෙ. ඒ ගෙවල් දෙකේම සාමාජිකයො අපේ රැස්වීම්වලට ආවයි කියලා ආරංචියක් ආවා. ලක්ෂ තුන්සිය ගානක දාල ඒ පාලමෙන් එගොඩවෙන එකම පුද්ගලයත් අපේ රැස්වීම්වලට සම්බන්ධ වෙනවා. අද උඩලමත්තෙ යටලමත්තෙ පාලම දෙකම අතහැරල දාලා. ලක්ෂ 382 ක් වන උඩලමත්තෙ පාලමේ ලක්ෂ 100 ක් මුදල අඩු කරලා, ඒ මනුස්සය අතහැරල දාල ගියා. යටලමත්තෙ පාලමත් අතහැරල දාල ගිහිල්ලා. ඉතිං මහා ලොකු සංවර්ධනයක් ගැන කතා කරනවා. අද මේ කොස් ගහ ගාවින් කුරුපනාවෙ මැලිබන් මාවතට යන පාර විජේපාල මහත්තය පටන් ගත්තෙ. අර බෝක්කුවක් කඩල දාලා දැන් අවුරුදු ගානක් වෙනවා. අර ගෝනදෙණිය කුරුපනාව මාර්ගය අවුරුදු හතරකට පහකට වැඩියි කාපට් කරන්න පටන් අරගෙන. තාමත් කරනවා. ඒ නිසා මේ ඊයෙ පෙරේද ඌරල අර ගහල තියෙන යාඩ් එකත් එක්ක පාරක් යනවයි කියල මහා ලොකුවට පාරම් බෑවා. මහා ලොකුවට කතා කළා. නමුත් මේක මීට වැඩිය පළල් වෙන්නෙ නැහැ. අද වෙනකොට යටලමත්ත හන්දියෙන් අඩි දෙක තුනකට වැඩිය පළල් වෙන්නෙ නැහැ. වදුරඹින් එහාට පළල් වෙන්නෙ. මේ ටික පළල් වෙන්නෙ නැහැ.මේකම තමයි හදන්නෙ කෝටි ගණන් මේ රට ණය වෙලා. ඒ විදේශ රටවලින් එන මුදල්වලට මොකක්ද වෙන්නෙ. අද බලන්න පාරක කීදෙනෙක් වැඩ කරනවද කියලා. මේව මම කියන්නෙ ඇස්තමේන්තුවල ඇති. අද වදුරඹින් පටන් ගත්තම තවලමට වෙනකම් මේ තණ කොල ඇදිල නැහැ.කෙටල ගලවනවා. තණකොල ගලවනවා. කණ්ඩි කපනව. මම හිතන්නෙ ඇස්තමේන්තුවෙ ඇති ඒවත් නඩත්ත කරන්න ඕනෙයි කියලා. මේ රට ශ්‍රී ලංකාව ඔහොම තියෙනවනම් අපිත් කැමතියි. නමුත් ඒ රටේ අවශ්‍යතාවයද කෙරෙන්නෙ කියල ප්‍රශ්නයක් තියෙනවා.

ඒ හින්ද මේ මැතිවරණයෙදි අද මම කියන්න කැමතියි. එක්සත් ජාතික පක්ෂයේ සංධානයේ පෙරමුණේ පක්ෂයට තාම පත්‍රිකාවක් බෙදා ගන්න බැරිවුනා. අද උඩලමත්තෙ කාර්යාලයක් දාගන්න විදිහක් නැහැ. මන්ත්‍රීතුමා ගෙදරක කාර්යාලයක් දැම්මා. බණ්ඩාරනායකපුර ඡන්ද මධ්‍යස්ථානයට කාර්යාලයක් දාන්න තැනක් නැහැ. අන්න යටලමත්ත හන්දියට ගෙනැල්ල මායිමට ගෙනැල්ල අර සුමනසේකර මහත්තයලගෙ ගෙදර ඒකත් දාල තියෙන්නෙ. කාර්යාල දාන්න විදිහක් නැහැ. කැන්වසින් යන්න විදිහක් නැහැ.රැස්වීම් පවත්වන්න විදිහක් නැහැ. පහුගිය දවස්වල කාර්යාලය විවෘත්ත කිරීමට රැස්වීමක් තිව්වා. 60 ක 70 ක් විතර ගමේම එකතු කරලා. අපේ ප්‍රධාන රැස්වීම බෝවිටියමුල්ල හන්දියෙ කීදෙනෙක් හිටියද? ඊට පස්සෙ නාගොඩ රැස්වීමක් තිවුවා. අර වැලිවිටියෙ රැස්වීමක් තිවුවා. හතරවටෙන් ආවද? එම්. එම්. මන්ත්‍රීතුමා රැස්වීමක් තිවුවා විසි ගානක් බුලත් දුන්නා. හතරවටින් ඇවිල්ලද? ඒ නිසා අපි කියනව මේ මැතිවරණය අනිවාර්යයෙන්ම අපි ජයග්‍රහනය කරනවා. ජයග්‍රහනය කරල ජනාධිපතිවරයා අපේ පක්ෂයෙන් පිහිටුවලා මේ රට ගොඩ ගන්න වගකීම අපි භාර ගන්න බව මේ අවස්ථාවෙ ප්‍රකාශ කරමින්, ඒ වාගෙම ඉතිරි දින කීපයත් අපි අවංකවම සතුටු වෙනවා. අපේ පක්ෂෙ අපේ ප්‍රදේශයේ අපේ නායකයො කවදාවත් මැතිවරණයක් ආරම්භ වුනාට පස්සෙ කිසිම ගැටලුවක් නැතුව අපි හැමදාම මැතිවරණය අවසන් කරනවා. මේ දින කිහිපයේදිත් සාමකාමීව මේ මැතිවරණය අපි කරගෙන ගිහිල්ලා අපි සුහදව එක මවකගෙ දරුවන් වගේ මේ සභාවෙ ඉදිරියට කටයුතු කරන්න සුදානම් වෙමු කියල ආරාධනා කරමින්, ඔබ සැමට සුබ සන්ධ්‍යාවක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඩ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීතුමන්ලාගෙන්, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. මම පළමුවෙන්ම අපේ ලේකම්තුමියට නියෝග කරනවා. අදම ඔබතුමිය විපක්ෂ නායක අපේ සහබන්දු මන්ත්‍රීතුමා කියපු කාරණය පිළිබදව සොයා බලන්න කියලා. ඒ පිළිබදව දැඩිව ක්‍රියාත්මක වෙන්න ඕන. කිසිම කෙනෙකුට වැරදි කරන්න දෙන්න බැහැ. නිලධාරියගෙ ඉදල ඒක මට කවුරු හරි හැංගුවනම් එය සම්පූර්ණයෙන්ම වැරදියි. ඒක මම ප්‍රසිද්දියෙ කියනවා.

මේ සභාවෙ හොරකම් වංචා සිදු වෙන්න බැහැ. යම් සුළු සිදුවීම් වුනත් වංචා දූෂණ වෙන්න බැහැ. මාව දැනුවත් කිරීම පිළිබදව පළමුවෙන්ම සහබන්දු ගරු මන්ත්‍රීතුමාට මම ගෞරවණීය ස්තූතිය පුදකරනවා.

පළමුවෙන්ම මම මේ අවස්ථාවෙ ගරු මන්ත්‍රීතුමන්ලගෙ නිශ්ශබ්දතාවය බලාපොරොත්තු වෙනවා. මම මේ වැදගත් කරුණක් කියන්න යන්නෙ. විශේෂයෙන්ම අද උදේ රංජිත් ජයවීර මන්ත්‍රීතුමා 70 කන්ද උද්ගෝෂණය පිළිබදව. කතා කළා. පහුගිය දිනක 70 කන්ද මාර්ගය සංවර්ධනය කරන්නට යන්ත්‍ර සූත්‍ර ගෙනැල්ල කටයුතු කරල තියෙනවා. ඒ පිළිබද අපේ සම්බන්ධතාවයක් නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දන්නෙත් නැහැ කියලයි අපි දැනුවත් වුනේ. මේ පිළිබඳව පසුව සොයා බැලීමේදී තමයි දැනගත්තෙ RDA සම්බන්ධතාවය. රන් මාවත් කියන ව්‍යාපෘතිය යටතේ ලක්ෂ 200 ක ප්‍රතිපාදනයක් ඇවිල්ලා තියෙන්නෙ. අමාත්‍ය වජිර අබේවර්ධන මැතිතුමාගේ ලේකම් මාර්ගයෙන් අපේ සභාවෙනුත් ඔය පාරට ලක්ෂ 74 ක ඇස්තමේන්තු හැදුවා. කොහොම නමුත් රන් මාවත් නැමති යොජනා ක්‍රමය යටතේ තමයි ඒ ලක්ෂ 200 ඇවිල්ලා තියෙන්නෙ. ඒ පිළිබඳව මා දැනුවත් වුනේ අදාළ සම්බන්ධීකරනය කරන ජගත් වීරසිංහ මහත්මයාගෙන්. කොහොම හරි මම RDA එකෙන් ඇහුවම RDA එකෙන් කිව්වෙ සංවර්ධනය කරන විට සභාවට දැනුම් දී අවසර ගැනීමක් කරනවා කියලා. එයට මම එකඟ වුණා. නමුත් මෙම සංවර්ධන කාර්යය පිළිබඳව ඉඩම් හිමියන් දැනුවත් වී නොමැති බැවින් තමයි ඔවුන් විරෝධතාවය ප්‍රකාශ කරලා තියෙන්නෙ. අදාළ ඉඩම, හිටපු සඳුන් ජයවිරාජ් ගුරුසිංහ මන්ත්‍රීතුමාලට සම්බන්ද ඉඩමක්. ඇත්තටම එතුමා තමයි මන්ත්‍රී කාලෙ ඔතන තිබුනෙ අඩි පාරක්. වෙනත් ඉඩමක් උඩින් තිබුන පාර සඳුන් මන්ත්‍රීතුමා තමයි තමන්ගෙ ඉඩමෙන් කොන්ක්‍රීට්

කරලා පාර හදල දීලා තිබුනෙ. ඉඩම් අයිතිකාරයො දැනුවත් නැතුව එකපාරට ඇවිල්ලා මේ කටයුතු කරන කොට ප්‍රශ්න එනවා. ඔවුන් සමඟ කතා බහ කරන්න ඕන. අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කොට මෙම ව්‍යාපෘතිය ආරම්භ කළා නම් මේ උද්ඝෝෂණ කිරීම දක්වා දුර දිග යන්නෙ නැහැ. තාවකාලිකව වැඩ නතර කළාට පස්සෙ මිනිස්සු හිතුවා සදුන් මන්ත්‍රීතුමා විරුද්ධ වුනා කියලා. මේ ආපු සල්ලි ආපහු යනවා කියල මතයක් හැදුනා. ඒ මතයෙ ඉදගෙන මිනිස්සු උද්ගෝෂණය කළා. අපි ගොස් පහදා දුන්නත් මිනිස්සු ඒක පිළිගත්තෙ නැහැ. ජයවීර මන්ත්‍රීතුමනි, ඔබතුමාලා වගේ බොරදියේ මාළු බාගන්න යන්නෙ නැහැ. මෙතුමන්ලා කරන්නෙ ඒක. මේ අවස්ථාවෙ නිකන් මිනිස්සු කුපිත කරලා වැඩක් නැහැ. අපි ඒ පාර හදනවා. මේ 16 වෙනිදා වෙනකම් මොනවත් සංවර්ධනයක් කරන්නත් බැහැ. මම එතනට ගිහිල්ලා බැගෑපත් වුනා. මම මේ ආවෙ දේශපාලනයට නෙවෙයි. මොකද මටත් රිමාන්ඩ් බන්ධනාගාරගත වෙන්න පුලුවන්, මේ අවස්ථාවෙ උද්ඝෝෂණය කරලා, සභය දැක්වුවයි කියලා. ඊට පස්සෙ මේ ඡන්ද දවස්වල උද්ගෝෂණය කරන්න බැහැ. පොලීසිය හරියට ක්‍රියාත්මක වුනානම් අපි සේරම උද්ගෝෂණය කරපු අය රිමාන්ඩ්. පොලීසියත් ඒ වෙලාවෙ සාමකාමීව ක්‍රියාත්මක වුනා. විජිත් සහබන්දු මන්ත්‍රීතුමත් මමත් අපි දෙන්න ගිහිල්ලා පහදල දුන්නා. ඒ වෙලාවෙ අපේ තවත් හිටපු මන්ත්‍රීතුමෙක් ආවා. ඉතිං අපි පහදල දීල බැරිම තැන AGA දැනුවත් කරලා, හාමුදුරුවො එතනට සම්බන්ධ කරලා මම මගේ එදින තිබුණ රැස්වීමකට ගියා. ඊට පස්සෙ අපි මැදිහත් වුනේ නැහැ.මොකද අපට මැදිහත් වෙන්න බැහැ. නමුත් මම දැනගත්තා සියළු දෙනා සුහදව ප්‍රශ්නය බේරුම් කර ගෙන ඇති බව. මම වගකීමෙන් කියනවා ඒ මාර්ගය සංවර්ධනය කරන බව. ඒ මුදල් ආපසු යැවීමක් වෙන එකක් නැහැ. ඒක නිසා එකෙ කිසි ප්‍රශ්නයක් නැහැ. මිනිස්සු කුලප්පු කරලා මිනිස්සුන්ගෙන් අයුතු ප්‍රයෝජන ලබා ගන්න යන්න එපා ඔබතුමාල පහදල දෙන්න මෙන්න මේකයි සිදුවීම කියලා. අපි හාමුදුරුවන්ටත් පහදල දුන්නා. මොකද මෙතන වැරදි වැටහීමකුත් එනවා. අපේ හිටපු මන්ත්‍රී සදුන් මහතා පිළිබදව.

ගරු මන්ත්‍රීතුමාලා, PF 7360 දරණ කැබ් රථයේ T බෙල්ට් එක දැමීම පිළිබදව විවාද වුනා. ඒක මේ සභාවෙ සභා සම්මත වෙලා කරපු කර්තව්‍යයක්. ඒක දැන් කතා කරල තේරුමක් නැහැ.

ඒවගේම පෙරපාසල් පිළිබදව කතා කිරීමේදී, ගරු මන්ත්‍රීවරුනි, මට ගිය අවුරුද්දෙ තමයි මේ අදහස ආවෙ. අපේ නාගොඩ ප්‍රාදේශීය සභාවෙ පෙරපාසල් 15 ළමයින් එකතු කරගෙන, ඒ වගේම බල ප්‍රදේශයේම පෙරපාසල් ළමයි එකතු කරලා මාපලගම පිට්ටනියෙ දරුවන් සතුටු කිරීමට, කානිවල් එකක් විදියට උත්සවයක් කරන්න. නමුත් ඒකෙදි අපේ රංජිත් ජයවීර මන්ත්‍රීතුමත්, අපේ තව මන්ත්‍රීතුමෙක් විරුද්ධ වුනා. ඒ නිසා මම අදහස වෙනස් කොට සභාවෙ මුදල් වියදම් නොකර පරිත්‍යාගශීලින්ගෙන් උදව් ඇතිව, කාටත් සතුටු විය හැකි අන්දමට, එදා මෙදා තුර සභාවෙන් දරුවන් වෙනුවෙන් කල හොදම උත්සවය හැටියට කරන්න මට හැකි වුණා. නමුත් අපට උඩුගම බල ප්‍රදේශයේ පෙරපාසල් ටිකේ ළමයි ටික ගෙන්න ගන්න විතරයි බැරිවුනේ. අර පෞද්ගලික පෙර පාසල්වලින් සම්බන්ද කර ගත්ත ළමයින්ටත් තෑගි බෝග දීලා, කෑමත් දීලා, අපි හැම දේමත් කළා. ඉතිං ඇත්තටම හරි සතුටුයි. හැම ළමයෙක්ම හැම දෙමව්පියෙක්ම බොහොම සතුටෙන් කතා කළා. මේ එක මෑණි කෙනෙක් හැර. නමුත් මේ ප්‍රාදේශීය සභවෙ සභාපති හැටියට පිළිගන්නවා. එතුමිය කියන එකත් ඇත්ත බව. අපි සියළුම ළමයින්ට වග කියන්න ඕන. එහෙම නම් මේ සියලු පෙරපාසල් ප්‍රාදේශීය සභාව සතු වෙන්න ඕන. නමුත් සභාවෙන් වියදම් දරාගන්න බැරි නිසා. අපිට පුලුවන් විදිහට අපේ පෙරපාසල් 15 වේ ළමයින් සම්බන්ධව කටයුතු කරන්න සිදු වුණා. නමුත් සියලු ළමයින්ට එක සේ සලකන්න ඕන වුනත් අපට හැකියාවක් තිබුනෙ නැහැ. ආර්ථික තත්වය අයහපත් නිසා. සහභාගී වු ළමයි මෙන්ම දෙමව්පියන්ද ගොඩක් සතුටු වුනා. මම අපේ සියළුම මන්ත්‍රීතුමන්ලාටත්, මන්ත්‍රීතුමියන්ලාටත් කිව්වෙ මෙදින පැමිණ දරුවන් සමග සතුටුවන්න පමණයි. ඒ අවස්ථාවට සම්බන්ධ වුනු උප සභාපතිතුමා ඇතුලු සියළුම මන්ත්‍රීතුමන්ලට හා මන්ත්‍රීතුමියන්ලට මම ගෞරව කරනවා. ස්තූතිවන්ත වෙනවා. අපි සියළුම දෙනා ඒ අවස්ථාවෙ සතුටට පත් වුණා.

ඒවගේම අයාලේ යන ගවයන් ප්‍රශ්නය සහ පොදු වැසිකිලිය පිලිබද රංජිත් ජයවීර මන්ත්‍රීතුමා කතා කළා. ගවයන් ප්‍රශ්නය ඇත්තටම බොහොම ලොකු ප්‍රශ්නයක් තල්ගස්වල ගවයන් අයිති අය ගෙන්නලා අපි සාකච්ඡාවක් කළා. ඒත් කිසිම ප්‍රතිඵලයක් නැහැ. කුඹුරුහේන පංසලේ හාමුදුරුවො මට දුරකතන ඇමතුමක් දුන්නම මම ගිහිල්ල බැලුවා. හාමුදුරුවන්ට හරකෙක් එලවගෙන එනකොට දුවලා, සිවුර පැටලිලා වැටිලා. හාමුදුරුවන්ට තුවාලවෙලා තිබුනා. හාමුදුරුවොත් කිව්වෙ මේ ප්‍රශ්නෙ පිළිබදව කතා කරමු කියලා. මේකට එකම පිළිතුරක් තියෙනවා. ඒ පිළිතුර අපි බුද්ධාගම්කාරයො හැටියට කරන්න බැහැ. නැත්නම් එක දුරකතන ඇමතුමෙන් පොලීසියත් සම්බන්ධ කරගෙන වැඩේ කරන්න තිබුනා. මෙම අපහසුතාවයට පත්වෙලා ඉන්න කාරණය පිළබඳව යතාකලෙදි මොනව හරි දෙයක් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වගේම තමයි මාපලගම පොදු වැසිකිලිය පිළිබඳව, ඇත්තටම අපිත් හරි කණගාටු වෙනවා. එය ඉදිකිරීමට නොහැකි වීම පිළිබඳව. එක පුද්ගලයෙක් විරුද්ධ වීම නිසා ලක්ෂ 35 වැසිකිලිය ඉදිකිරීම නතර වුණා. ඊට පසුවද, වැසිකිලිය ඉදිකිරීමට මුදලක් වෙන් කලද, ඒ කටයුත්ත සිදු වුනේ නැහැ. ඊට පසු මම මේ පිළිබඳව අදාළ ආයතනයෙන් විමසුවා. එම ආයතනය කිව්වෙ එම ස්ථානය ඉඩ මදි බවයි.

ඊළගට වීථි පහන් දැමීම පිළිබඳව කථා කළා. ඇත්ත කතාව වීථි පහන් අලුත්වැඩියා කරගෙන යනවා. පසුගිය දවස්වල පංසල්වල පැවැත්වෙන කඨින පිංකම් සදහා මම අවශ්‍ය තැන්වලට වීථි පහන් තියෙන ආකාරයට ලබා දුන්නා. ඊලගට තවත් අවශ්‍ය ස්ථානවල ජනතාවගෙ ඉල්ලීම් මත වීථි පහන් සවි කිරීමේ කටයුතු කරගෙන යනවා. විශේෂ හේතුවක් නැහැ. ලයිට් අවශ්‍ය තැන්වලට, ජනතා ඉල්ලීම් මත ඒ කටයුතු වෙනවා. විශේෂයෙන්ම තල්ගස්වල අපේ ප්‍රියන්තා ගුණසේකර මන්ත්‍රීතුමිය කිව්වා වගේ ඒ තල්ගස්වල කොවිලේ පූජකතුමා දවසක් අපි ගියාම කෝවිලට එන පාර කළුවරයි කිව්වා. උත්සව තියෙන නිසා වීථි පහන් සවි කරල දෙන්න කියලා ඉල්ලුවා. ඒ කෝවිල තියෙන පාර ප්‍රධාන පාරක්. මම කිව්වා අලුත් වීථි පහන් කට්ටල ගෙනාවම දාලා දෙන්නම් කියලා. දිල්රුක්ෂි මන්ත්‍රීතුමිය, ඔබතුමියගෙ වැඩේ කරලා දෙන්නම්. ඔබතුමියටත් හැගීමක් ඇති මම මන්ත්‍රීවරියක් වෙලත් මට මේක දාගන්න බැරිවුනා කියලා. යථා කාලෙදි ඔබතුමියට ඒක ඉටු කරලා දෙන්නම්. අපේ ගයාන් මන්ත්‍රීතුමාගෙ කාර්යලය ළගට වීථි පහන් දාලා ඉල්ලුවා. මම ඇත්තටම ඒක කෙරුවෙ නැත්තෙත් කාර්යාලය නිසා. ඒ පාර චෝදනා එනවා. අපේ කාර්යාලය අසලට වීථි පහන් දැම්මා කියලා.

ගරු සහබන්දු මන්ත්‍රීතුමා පොඩ්ඩක් අහන්න. ඊයෙ නාගොඩ හංදියෙ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ග්‍රාමීය රැස්වීම් තිබුණා. පෙරේදා ස්ටේජ් එක ගැහුවා. ස්ටේජ් එක ගහද්දි ඉණිමග ඕන වුණා. ඉණිමග ඕන්නම් ලොරියෙ ගෙනියන්න තිබුනා. බයිසිකලයෙන් ගෙනිච්චෙ. මම කිව්වා ලොරිය ගන්න එපා කියලා. පයිප්ප එතනට ගෙනිච්චෙ නැහැ.ඒ පයිප්ප උඩලමත්ත පංසලෙන් අපේ පෙර පාසල් උත්සවේට ගෙනාවෙ නැවත ගෙනියන්න තමයි ලොරියෙ ගහලා තිබ්බෙ. මම මෙතන වරදක් කළේ නැහැ. නිලධාරීන්ටවත් කාටවත් කිසි ප්‍රශ්යක් නැහැ. ඊලගට උදේ පොලීසියෙන් කොල් එකක් එනවා. සභාවේ කම්කරුවො වැඩ කරනවද උදේ 6.30 ට. මම කිව්වා ඔව් ඒ වෙලාවෙ සභාවෙ කම්කරුවො නෙවෙයි. 8.00 න් පස්සෙ තමයි සභාවෙ කම්කරුවො වෙන්නෙ. මැෂින් එකත් මම අපේ ගෙදරින් ගෙනාවෙ. ඒ වගේම එතන ශුද්ධ කරද්දි පොලට මෙහා පැත්තෙ කුණු ගොඩක් තියෙනව මම දැක්කා. ත්‍රීවිල් රථවල රියදුරු මහත්වරුන් ඇවිල්ල මට කිව්වෙ, සභාපතිතුමා බලන්න මෙතන හැටි කියල. හොඳයි හෙට උදේට මම ඔක සුද්ද කරල දෙන්නම් කියල, ඒ ටිකයි නාගොඩ හංදිය අවට සේරම සුද්ද කරල දුන්න. ඒක සභාපතිගෙ වගකීම. නමුත් ඒ පිළිබඳව මන්ත්‍රීතුමාල වරදවා හිතන්න එපා. නාගොඩ ප්‍රාදේශීය සභාවෙ සභාපති එහෙම වැරදි ක්‍රියා කරන්නෙ නැහැ.

ඒ වගේම අවංකවම වළකුඹුර එක්සත් ජාතික පක්ෂ කාර්යාලයේ බෝඩ් එක ගැලවීම සහ වලකුඹුරෙ කාර්යාලයට හානි කාරීම පිළිබඳව අපි දැඩි අප්‍රසාදය පළ කරනවා. මොකද අපි කිසි කෙනෙක් සම්බන්ද නැහැ. මේ අවස්ථාවාදියො යම් යම් දේවල් කරනවා. නැතුව දේශපාලන

පක්ෂෙකින් කරල නැහැ. මොකද අපේ ප්‍රියන්තා ගුණසේකර මන්ත්‍රීතුමිය කිව්වා වගේ අපේ පොදු ජන පෙරමුණෙ කාර්යාලෙත් එදා කඨින පෙරහැරේ ගියපු මිනිස්සු වගයක් තමයි ආරංචි හැටියට ඒ සිදුවීම කරලා තියෙන්නෙ. එක්සත් ජාතික පක්ෂ කාර්යාලයේ සිදුවීම වෙන ප්‍රශ්නයක් නිසා කියලා තමයි අපට ආරංචි. විශේෂයෙන්ම එළඹෙන ජනාධිපතිවරණය වෙනුවෙන් අපි සැවොම උනන්දුවෙන් තම තමන්ගෙ අපේක්ෂකයා දිනවීමට තමයි උත්සාහ ගන්නෙ. අපි එය සුහදව කරමු. ඉතිං නිතරම අපි බලන්නෙ අපේ අපේක්ෂකයාව ගෝඨාභය රාජපක්ෂ මැතිදුන් දිනවන්න. දැනටමත් ජයග්‍රහනය කර අවසන්. විශේෂයෙන් මතක තියා ගන්න පහුගිය දවස්වල තැපැල් ඡන්දවලින් රාජ්‍ය සේවකයො 78% යි 82% යි අතර ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ට ඡන්දෙ දීල තියෙනවා. ගෝඨාභය රාජපක්ෂ මැතිදුන් 67% ත් 68% ත් අතර තමයි ජයග්‍රහනය කරන්නෙ. ඒක සක් සුදක් සේ පැහැදිලියි. වැඩි ඡන්ද ලක්ෂ 15 ක් 20 ක් අතර ජයග්‍රහණයක් එතුමා ලබනවා. මමත්වයක් නැති අපි ගැන හිතන රට ගැන ආගම ගැන හිතන රටේ ආරක්ෂාව තහවුරු කරන නායකයෙක් පත්කර ගන්නෙ සියළුම දෙනා පෙලගැහිලා ඉන්නෙ. කොහොම නමුත් මතක තියා ගන්න එළඹෙන නොවැම්බර් 16 වෙනිදා ඡන්දයෙන් නියත වශයෙන්ම 17 වෙනිද වෙනකොට ගෝඨාභය රාජපක්ෂ මැතිදුන් මේ රටේ ජනාධිපති වෙනවා. ඒක වලක්වන්න කිසි කෙනෙකුට බැහැ. 17 වෙනිද ඉදල අපි කවුරුත් එකමුතුව වැඩ කරමු. මොකද අපිටත් මේ සභාවෙ වැඩකරන්න ශක්තිය රටට වැඩකරන්න ශක්තිය දෙනවා. මොකද එතුමන්ල මේ පිළිබඳ දැනුවත් වෙලා. ඒ නිසා ආදරණීයව ඔබ සැමගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටින්නෙ අද ඉන්න වගේ මේ වෙනකම් අපි එකතු වෙලා හිටි වගේ මේ 16 වෙනිද වෙනකම් එකතුවෙලා ඉදලා 17 වෙනිද අපේ ජයග්‍රහණයත් සමග ඔබතුමාලගේ පරාජය නෙවෙයි මම කියන්නෙ. ඔබතුමාලටත් ජයග්‍රහණයක් තියෙනවා. ඒක සක් සුදක් සේ පැහැදිලියි. ඔබතුමාල බය වෙන්න එපා රනිල් වික්‍රමසිංහ මහත්තය එළඹෙන 17 වෙනිද විපක්ෂ නායක වෙනවාමයි. අහන්න දෙයක් නැහැ. ඒක ඔබතුමාලගෙ ජයග්‍රහණයක්. ඔබතුමාලගෙ නායකයා රනිල් වික්‍රමසිංහ සජිත් නෙවෙයි. ඒ නිසා අපේ ආදරණීය මන්ත්‍රීතුමන්ලට තුමියන්ලට අපි කියන්නෙ බොහොම සතුටින් ඉදිරි ජනාධිපති වරණයට කටයුතු කරන්න. මට අමතක වුනා විශේෂයෙන්ම ස්තූති වන්ත වෙන්න ඕන ඇල්පිටියෙ ජනතාවට. මොකද ඇල්පිටිය ප්‍රාදේශීය සභාව අති විශිෂ්ඨ අන්දමින් ජයග්‍රහණය කරවීම පිළිබඳව. අර වන්ඩේ මැච් එක දිනල දැන් ජයග්‍රාහීව ටෙස්ට් මැච් එකට යනව වගේ තමයි. එළඹෙන නොවැම්බර් 16 වෙනිදා ටෙස්ට් මැච් එකත් ඉනින්ග්ස් පිටින් අපි දිනනවා. ඒ නිසා අද පැමිණි ගරු උප සභාපතිතුමා සියලුම මන්ත්‍රීතුමන්ලට මන්ත්‍රීතුමියන්ලට ලේකම් තුමිය ඇතුලු සියලු දෙනාට ගෞරවණීය ස්තූතිය පුද කරමින්, විශේෂයෙන් ලේකම්තුමියට,මම නැවත මතක් කරනවා. සහබන්දු මහත්මයා ඒ කියපු කාරණය ගැන වහාම පරීක්ෂණයක් කරල මාව දැනුවත් කරන්න කියල ඉල්ලා සිටිමින්, එහෙමනම් සියලු දෙනාට සුබ අනාගතයක් ! සියලු දෙනාට ජය වේවා!

සභාපති,

නාගොඩ ප්රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:- .............................